# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# ඇගයීම් වාර්තාව

# 33 - ගිණුම්කරණය

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය -2018

## ඇගයීම් වාර්තාව

# 33 - ගිණුම්කරණය

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.**

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

## ගිණුම්කරණය

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2018

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2018 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 218191ක් පාසල් අයදුම්කරුවෝ ද 48920ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ගිණුම්කරණය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ගිණුම්කරණය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2018 විභාගයේ ගිණුම්කරණය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව ආයක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2020 මැයි 28

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ/සංවර්ධන හා ඇගයීම්) |
| **සම්බන්ධීකරණය** | : | පී.ඒ. වෙනුර චන්දික<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ආචාර්ය ඩබ්.වී.ඒ.ඩී. කරුණාරත්න<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගණකාධිකරණ අධ්‍යයන අංශය<br>කැලණිය විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය හරේන්ද්‍ර කාරියවසම්<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගණකාධිකරණ අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>රංගජීව හේරත්<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගණකාධිකරණ අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | චන්ද්‍රානි රූපසිංහ<br>බප/ජය බෝමිරිය මධ්‍ය මහා විද්‍යාලය, කඩුවෙල<br><br>පද්මිණී හේවාගීගන<br>විශාඛා විද්‍යාලය, කොළඹ 05<br><br>ඩී.ඒ.එස්. මානෙල් බමුණුසිංහ<br>රාජසිංහ මධ්‍ය විද්‍යාලය, රුවන්වැල්ල<br><br>කේ.ඒ. කරුණාසිංහ කොඩිතුවක්කු<br>පො/ගිරිතලේගම මහා විද්‍යාලය, ගිරිතලේ<br><br>චන්ද්‍රසීලි මලවආරච්චි<br>මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලය<br>හක්මන |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ.ඒ. ඉරෝෂා බණ්ඩාර<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර 3-II |
| **පිටකවරය සැකසුම** | : | ඒ. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරි |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස


1 විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7


## II කොටස


2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 8
2.1.2. I ප්‍රශ්න පත්‍රයේ 1 සිට 30 තෙක් ප්‍රශ්න 9
2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 17
2.1.4. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.5. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 25
2.1.6. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය ප්‍රතිශත ලෙස 26
2.1.7. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 29

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 31
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, නිරීක්ෂණ, නිගමන හා යෝජනා 32
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 70


## III කොටස


3 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 71
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 72

## I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 ගිණුම්කරණය විෂයයෙහි අභිමතාර්ථ

මෙම විෂය හැදෑරීමෙන් ශිෂ්‍යයා,

- ගිණුම්කරණ සංකල්පීය රාමුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.
- ගිණුම්කරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ලබාගත් මූලික දැනුම භාවිතයට ගනියි.
- ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් විවෘතව ඇති නව්‍යතා අවබෝධ කර ගනියි.
- ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් ලබාගන්නා වූ දැනුම විවිධ වෘත්තීය අවශ්‍යතා සඳහා භාවිතයට ගනියි.
- සමාජ ආර්ථික පරිසරය තුළ ඵලදායි ලෙස කටයුතු කළ හැකි කළමනාකරණ කුසලතා ලබා ගනියි.
- විවිධ ව්‍යාපාර සංවිධානවල ගිණුම් තැබීම පිළිබඳ කුසලතා ලබා ගනියි.
- විෂය ක්ෂේත්‍රය තුළ ගවේෂණය තුළින් ලැබෙන හුරුව අනාගත පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට ආයක කර ගනියි.
- සම්පත් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා වර්ධනය කර ගනියි.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 39673 | 3823 | 43496 |
| දෙමළ | 7028 | 861 | 7889 |
| ඉංග්‍රීසි | 1955 | 908 | 2863 |
| **එකතුව** | **48656** | **5592** | **54248** |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 4833 | 9.93 | 218 | 3.90 | 5051 | 9.31 |
| B | 5070 | 10.42 | 326 | 5.83 | 5396 | 9.95 |
| C | 10063 | 20.68 | 694 | 12.41 | 10757 | 19.83 |
| S | 16721 | 34.37 | 1538 | 27.50 | 18259 | 33.66 |
| F | 11969 | 24.60 | 2816 | 50.33 | 14785 | 27.55 |
| **එකතුව** | **48656** | **100.00** | **5592** | **100.00** | **54248** | **100.00** |

වගුව 2

විභාගයට පෙනී සිටි පාසල් අයදුම්කරුවන්ගෙන් ආසන්න වශයෙන් 75%ක් ගිණුම්කරණය විෂය සමත් වුවද පෞද්ගලික අයදුම්කරුවන්ගෙන් මෙම විෂය සමත්ව ඇත්තේ ආසන්න වශයෙන් 50%ක් බව ඉහත සංඛ්‍යාලේඛන අනුව පැහැදිලි වේ. සමස්ථයක් ලෙස අයදුම්කරුවන්ගෙන් ආසන්න වශයෙන් 73%ක් ගිණුම්කරණ විෂය සමත් වී ඇත.

### 1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 7908 | 1029 | 13.01 | 813 | 10.28 | 1695 | 21.43 | 2771 | 35.04 | 6308 | 79.77 | 1600 | 20.23 |
| 2. ගම්පහ | 4692 | 421 | 8.97 | 414 | 8.82 | 953 | 20.31 | 1653 | 35.23 | 3441 | 73.34 | 1251 | 26.66 |
| 3. කළුතර | 2328 | 285 | 12.24 | 244 | 10.48 | 480 | 20.62 | 769 | 33.03 | 1778 | 76.37 | 550 | 23.63 |
| 4. මහනුවර | 2705 | 204 | 7.54 | 162 | 5.99 | 484 | 17.89 | 1007 | 37.23 | 1857 | 68.65 | 848 | 31.35 |
| 5. මාතලේ | 738 | 43 | 5.83 | 56 | 7.59 | 138 | 18.70 | 252 | 34.15 | 489 | 66.26 | 249 | 33.74 |
| 6. නුවරඑළිය | 956 | 61 | 6.38 | 94 | 9.83 | 211 | 22.07 | 316 | 33.05 | 682 | 71.34 | 274 | 28.66 |
| 7. ගාල්ල | 2029 | 229 | 11.29 | 243 | 11.98 | 366 | 18.04 | 643 | 31.69 | 1481 | 72.99 | 548 | 27.01 |
| 8. මාතර | 1364 | 184 | 13.49 | 175 | 12.83 | 298 | 21.85 | 400 | 29.33 | 1057 | 77.49 | 307 | 22.51 |
| 9. හම්බන්තොට | 755 | 59 | 7.81 | 55 | 7.28 | 139 | 18.41 | 275 | 36.42 | 528 | 69.93 | 227 | 30.07 |
| 10. යාපනය | 931 | 124 | 13.32 | 110 | 11.82 | 219 | 23.52 | 297 | 31.90 | 750 | 80.56 | 181 | 19.44 |
| 11. කිලිනොච්චි | 166 | 16 | 9.64 | 24 | 14.46 | 37 | 22.29 | 55 | 33.13 | 132 | 79.52 | 34 | 20.48 |
| 12. මන්නාරම | 184 | 20 | 10.87 | 21 | 11.41 | 45 | 24.46 | 60 | 32.61 | 146 | 79.35 | 38 | 20.65 |
| 13. වව්නියාව | 293 | 27 | 9.22 | 36 | 12.29 | 65 | 22.18 | 91 | 31.06 | 219 | 74.74 | 74 | 25.26 |
| 14. මුලතිව් | 140 | 8 | 5.71 | 18 | 12.86 | 29 | 20.71 | 49 | 35.00 | 104 | 74.29 | 36 | 25.71 |
| 15. මඩකලපුව | 613 | 79 | 12.89 | 87 | 14.19 | 134 | 21.86 | 189 | 30.83 | 489 | 79.77 | 124 | 20.23 |
| 16. අම්පාර | 749 | 68 | 9.08 | 65 | 8.68 | 139 | 18.56 | 223 | 29.77 | 495 | 66.09 | 254 | 33.91 |
| 17. ත්‍රිකුණාමලය | 482 | 44 | 9.13 | 34 | 7.05 | 83 | 17.22 | 165 | 34.23 | 326 | 67.63 | 156 | 32.37 |
| 18. කුරුණෑගල | 2129 | 237 | 11.13 | 230 | 10.80 | 416 | 19.54 | 753 | 35.37 | 1636 | 76.84 | 493 | 23.16 |
| 19. පුත්තලම | 1181 | 138 | 11.69 | 136 | 11.52 | 256 | 21.68 | 378 | 32.01 | 908 | 76.88 | 273 | 23.12 |
| 20. අනුරාධපුරය | 1133 | 80 | 7.06 | 98 | 8.65 | 201 | 17.74 | 417 | 36.80 | 796 | 70.26 | 337 | 29.74 |
| 21. පොළොන්නරුව | 512 | 37 | 7.23 | 47 | 9.18 | 116 | 22.66 | 166 | 32.42 | 366 | 71.48 | 146 | 28.52 |
| 22. බදුල්ල | 1222 | 65 | 5.32 | 96 | 7.86 | 211 | 17.27 | 454 | 37.15 | 826 | 67.59 | 396 | 32.41 |
| 23. මොනරාගල | 592 | 68 | 11.49 | 54 | 9.12 | 124 | 20.95 | 202 | 34.12 | 448 | 75.68 | 144 | 24.32 |
| 24. රත්නපුරය | 1603 | 211 | 13.16 | 179 | 11.17 | 307 | 19.15 | 513 | 32.00 | 1210 | 75.48 | 393 | 24.52 |
| 25. කෑගල්ල | 1179 | 113 | 9.58 | 96 | 8.14 | 231 | 19.59 | 430 | 36.47 | 870 | 73.79 | 309 | 26.21 |
| **සමස්ත දිවයින** | **36584** | **3850** | **10.52** | **3587** | **9.80** | **7377** | **20.16** | **12528** | **34.24** | **27342** | **74.74** | **9242** | **25.26** |

වගුව 3

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 379 | 0.70 | 54248 | 100.00 |
| 81 - 90 | 2187 | 4.03 | 53869 | 99.30 |
| 71 - 80 | 4511 | 8.32 | 51682 | 95.27 |
| 61 - 70 | 5941 | 10.95 | 47171 | 86.95 |
| 51 - 60 | 7364 | 13.57 | 41230 | 76.00 |
| 41 - 50 | 9054 | 16.69 | 33866 | 62.43 |
| 31 - 40 | 10027 | 18.48 | 24812 | 45.74 |
| 21 - 30 | 8952 | 16.50 | 14785 | 27.25 |
| 11 - 20 | 5162 | 9.52 | 5833 | 10.75 |
| 01 - 10 | 658 | 1.21 | 671 | 1.24 |
| 00 - 00 | 13 | 0.02 | 13 | 0.02 |

වගුව 4

මෙම විෂය සඳහා අපේක්ෂකයින් ලකුණු ලබාගත් ආකාරය පන්ති ප්‍රාන්තර අනුව ඉහත වගුවේ දැක්වේ. ඒ අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 54248 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 10027 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 18.48%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 24812ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 45.74%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 01** (RD/16/05/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

අපේක්ෂකයින් විසින් පළමු ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි ව පිළිතුරු සැපයූ ආකාරය අනුව සකසන ලද පහසුතා දර්ශක ඉහත ප්‍රස්තාරය මගින් පෙන්නුම් කෙරේ.

නිදසුනක් ලෙස : ඉහත ප්‍රස්තාරය අනුව 31 වෙනි ප්‍රශ්නයට ඉහළ පහසුතා දර්ශකයක් පෙන්වයි. අපේක්ෂකයන්ගෙන් 92%ක් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත. එබැවින් මෙම ප්‍රශ්නය අපේක්ෂකයන්ට පහසුතාව වැඩි ප්‍රශ්නයක් වන අතර එහි පහසුතා දර්ශකය 0.92කි. 10 හා 49 වන ප්‍රශ්න සඳහා අපේක්ෂකයන් වැඩි දුෂ්කරතාවක් දක්වන අතර ඒවායේ පහසුතා දර්ශකය 0.9කි.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරය මගින් II පත්‍රයේ එක් එක් ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය පැහැදිලි කෙරේ. ඒ අනුව පෙනී යන්නේ අනිවාර්ය ප්‍රශ්න වන 1 සහ 2 ප්‍රශ්න සඳහා ඉතා සුළු පිරිසක් හැර අනෙකුත් සියලුම අපේක්ෂකයින් පිළිතුරු සපයා ඇති බවයි. සෙසු ප්‍රශ්නවලින් අපේක්ෂකයින් වැඩිම පිරිසක් පිළිතුරු සපයා ඇත්තේ 3 ප්‍රශ්නයට වන අතර එහි ප්‍රතිශතය 93%ක් පමණ වේ. එසේම අපේක්ෂකයින් විසින් අඩුවෙන්ම තෝරා ගනු ලැබ ඇත්තේ 4 ප්‍රශ්නය වන අතර එහි ප්‍රතිශතය 59%කි.

**ප්‍රස්තාරය 02** (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරය මගින් II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය පැහැදිලි කෙරේ. නිදසුනක් ලෙස මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. එම ලකුණුවලින් 76%-100% (ලකුණු 16-20) ප්‍රාන්තරයේ ලකුණු ලබාගත් ප්‍රතිශතය 9%ක් පමණි. නමුත් අපේක්ෂකයින් වැඩිම පිරිස එනම් 35%ක් මෙම ප්‍රශ්නය සඳහා ලබාගෙන ඇත්තේ 0%-25% (ලකුණු 0-5) ප්‍රාන්තරයට අයත් ලකුණු ප්‍රමාණයයි.

**ප්‍රස්තාරය 03** (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 04** (RD/16/04/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 5 (අ) (1) අනු කොටසෙහි පහසුතා දර්ශකය 0.71කි. එනම් එම අනු කොටස සඳහා අපේක්ෂකයන් 71%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එහි පහසුතාව 71%කි. අපේක්ෂකයන් අතුරෙන් අවම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 2 (ආ) (4) අනු කොටස සඳහා ය. එහි පහසුතා දර්ශකය 0.18කි. ඒ අනුව එහි පහසුතාව 18%කි.

# II කොටස

## 2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* කාලය පැය 02 යි.
* බහුවරණ ප්‍රශ්න 30ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කි.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.
* පිළිතුරු පත් ඇගයීමේ දී සෑම ප්‍රශ්නයකට ම ලකුණු 4 බැගින් ලබා දෙනු ඇත. ඒ අනුව මුළු ලකුණු 200 කි.
* අවසාන ලකුණු ගණනය කරන ආකාරය පිළිබඳව 31 පිටුවේ ඇතුළත් වේ.

## 2.1.2 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න

**1.** ආයතනයක් විසින් පිළියෙල කරනු ලබන පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - මෙම ප්‍රකාශන ප්‍රධාන වශයෙන් ආයතනයක අතීත මූල්‍ය තොරතුරු සපයයි.

B - බාහිර පාර්ශ්වයන් ඉල්ලූ විටෙක මෙම ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

C - ගිණුම්කරණ ප්‍රමිත සහ නෛතික අවශ්‍යතාවන්ට අනුකූලව මෙම ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (……)

● **අංක 2, 3 සහ 4 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

නිහාල්ගේ ව්‍යාපාරයෙහි පහත ගනුදෙනු සිදු විය.

* 2018.03.01 - පිරිවැය රු. 150 000 ක් වූ භාණ්ඩ උපසේනගෙන් ණයට මිල දී ගැනීම
* 2018.03.05 - පිරිවැය රු. 30 000 ක් වූ භාණ්ඩ උපසේනට ආපසු යැවීම
* 2018.03.20 - පිරිවැය රු. 100 000 ක් වූ භාණ්ඩ රු. 160 000 කට ණයට විකිණීම
* 2018.03.20 - විකුණුම් කොමිස් රු. 10 000 ක් ගෙවීම
* 2018.04.02 - උපසේනට ගෙවිය යුතු සම්පූර්ණ මුදල පියවීම

**2.** 2018.03.31 දිනට නිහාල්ගේ ව්‍යාපාරයේ ඉහත ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** නිරූපණය කරන ගිණුම්කරණ සමීකරණය වනුයේ:

| | **වත්කම් (රු.)** | = | **වගකීම් (රු.)** | + | **හිමිකම් (රු.)** |
|---|---|---|---|---|---|
| (1) | +50 000 | | – | | +50 000 |
| (2) | +60 000 | | – | | +60 000 |
| (3) | +170 000 | | +120 000 | | +50 000 |
| (4) | +170 000 | | +150 000 | | +20 000 |
| (5) | +180 000 | | +120 000 | | +60 000 |

(……)

**3.** ඉහත ගනුදෙනු නිසා 2018.03.31 දිනට නිහාල්ගේ ව්‍යාපාරයේ ණයහිමි පාලන ගිණුමේ සහ ණයගැති පාලන ගිණුමේ ශේෂවල **වැඩි වීම** වනුයේ:

| | **ණයහිමි පාලන ගිණුම (රු.)** | **ණයගැති පාලන ගිණුම (රු.)** |
|---|---|---|
| (1) | 20 000 | 150 000 |
| (2) | 20 000 | 160 000 |
| (3) | 120 000 | 150 000 |
| (4) | 120 000 | 160 000 |
| (5) | 150 000 | 160 000 |

(……)

**4.** **උපසේන** සමග සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අනුපිළිවෙළට නිහාල්ගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීමට යොදාගනු ලබන මූලික ලියවිලි වනුයේ:

(1) ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය
(2) ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය
(3) ඉන්වොයිසිය, හරපත, ජර්නල් වවුචරය
(4) ඉන්වොයිසිය, බැරපත, ජර්නල් වවුචරය
(5) ඉන්වොයිසිය, ජර්නල් වවුචරය, ගෙවීම් වවුචරය (……)

**5.** පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ පොදු ලෙජරය සම්බන්ධයෙන් **නිවැරදි** වන්නේ ද?

A - ආයතනයක ගනුදෙනු ප්‍රථමයෙන් පොදු ලෙජරයෙහි සටහන් කරනු ලබයි.

B - ආයතනයක් විසින් ද්විත්ව සටහන් ක්‍රමය මත පදනම්ව පවත්වාගෙන යනු ලබන ගිණුම් සමූහය පොදු ලෙජරය වේ.

C - ආයතනයක ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කළ පසුව පොදු ලෙජරයට පිටපත් කරනු ලබයි.

D - ගිණුම් කාලච්ඡේදය අවසානයේදී ආයතනයක පොදු ලෙජරයෙහි සියලු ගිණුම් සඳහා පියවීමේ සටහන් තබනු ලැබේ.

(1) A පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (……)

6. මූල්‍ය වර්ෂයක් තුළදී ව්‍යාපාරයක් විසින් උපයන ලද ලාභය නිරූපණය කරන සමීකරණය වනුයේ:
(1) වසර අග හිමිකම + ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වාදීම – වසර මුල හිමිකම
(2) වසර අග හිමිකම + ගැනිලි – නව ප්‍රාග්ධනය හඳුන්වාදීම – වසර මුල හිමිකම
(3) වසර අග හිමිකම – ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වාදීම – වසර මුල හිමිකම
(4) වසර අග හිමිකම – ගැනිලි – නව ප්‍රාග්ධනය හඳුන්වාදීම – වසර මුල හිමිකම
(5) වසර අග හිමිකම + ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වාදීම + වසර මුල හිමිකම (……)

7. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව ගිණුම්කරණ සංකල්ප භාවිත කිරීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - මූල්‍ය ප්‍රකාශන තුළ හිමිකම වෙනම මූලිකාංගයක් ලෙස හඳුනාගැනීම සිදු කරනුයේ ඒකක සංකල්පයට අනුව ය.

B - මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සහ වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමට පදනම් වන්නේ අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.

C - එක් එක් කාලච්ඡේදයේ ක්ෂය, ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනීම ගැළපුම් සංකල්පයට අනුකූල වේ.

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (……)

8. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මිනුම් කිරීම සඳහා යොදාගත හැක්කේ පහත කුමන මිනුම්කරණ පදනම් ද?

A - ඓතිහාසික පිරිවැය B - සාධාරණ අගය
C - උපලබ්ධි විය හැකි අගය D - වර්තමාන අගය

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (……)

9. LKAS 17 (කල්බදු) ප්‍රමිතයට අනුව කල්බදු, මූල්‍ය සහ මෙහෙයුම් ලෙස වර්ග කිරීම මගින් **වඩාත්ම** ආරක්ෂා වන ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ගති ලක්ෂණය වන්නේ:
(1) සංසන්දනාත්මක බවයි. (2) විශ්වසනීය නියෝජනයයි.
(3) කාලීන බවයි. (4) අවබෝධ කරගත හැකි බවයි.
(5) සත්‍යාපනය කළ හැකි බවයි. (……)

10. පහත දැක්වෙන කුමක්, සුභසාධක සංගමයක් විසින් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සංරචක ලෙස සලකනු ලබන්නේ ද?

A - සමුච්චිත අරමුදල් ගිණුම B - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
C - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය D - සාමාජික මුදල් ගිණුම
E - ආදායම් සහ වියදම් ගිණුම

(1) A හා D පමණි. (2) B හා C පමණි. (3) A, D හා E පමණි.
(4) B, C හා E පමණි. (5) A, B හා E පමණි. (……)

● **අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ආයතනයක පොදු ලෙජරයෙහි 2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 500 000 ක් විය. කෙසේ වුව ද මෙම ශේෂය එදිනට ණයගැති ලෙජරයෙන් උපුටාගත් ශේෂවල එකතුවට සමාන නොවී ය. පසුව කරන ලද විමර්ශනයේදී පහත දෑ හෙළිදරව් විය.

(i) 2018 මාර්තු මාසය තුළදී ණයගැතියන්ගෙන් ලද රු. 180 000 ක චෙක්පත් මුදල් ලැබීම් ජර්නලයේ සහ ණයගැති ලෙජරයෙහි අදාළ ගිණුම්වල පමණක් සටහන් කර තිබුණි. කෙසේ වුව ද මෙය පොදු ලෙජරයට පිටපත් කර නොමැත.

(ii) රු. 520 000 ක ණයට විකුණුම්, විකුණුම් ජර්නලයේ සටහන් කර තිබුණේ රු. 250 000 ක් ලෙස ය. කෙසේ වුව ද මෙය ණයගැති ලෙජරයෙහි නිවැරදිව සටහන් කර තිබුණි.

(iii) රු. 50 000 ක කපා හළ බොල්ණය පොදු ලෙජරයෙහි නිවැරදිව සටහන් කර තිබුණි. කෙසේ වුව ද මෙය ණයගැති ලෙජරයෙහි අදාළ ණයගැති ගිණුමේ සටහන් කර නොතිබුණි.

(iv) ණයගැති ලෙජරයෙන් ශේෂ උපුටා ගැනීමේදී රු. 80 000 ක ශේෂයක් මගහැරී තිබුණි.

**11.** ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති ලෙජරයෙන් උපුටා ගන්නා ලද ණයගැති ලෙජර ශේෂවල එකතුව වන්නේ:

(1) රු. 440 000 (2) රු. 470 000 (3) රු. 560 000
(4) රු. 590 000 (5) රු. 620 000 (……)

**12.** 2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ නිවැරදි ශේෂය වන්නේ:

(1) රු. 440 000 (2) රු. 470 000 (3) රු. 560 000
(4) රු. 590 000 (5) රු. 620 000 (……)

**13.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනයෙහි පහත තොරතුරු වාර්තා කර තිබුණි.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| විකුණුම් | 2 000 |
| ඉපැයූ පොලිය | 250 |
| මෝටර් රථ විකිණීමේ ලාභය | 150 |
| පොලී වියදම් | 300 |
| මෙහෙයුම් වියදම් | 500 |
| විකුණුම් පිරිවැය | 1 200 |
| ගැනිලි-භාණ්ඩ | 200 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරය විසින් හඳුනාගත යුතු මුළු ආදායම සහ මුළු වියදම වනුයේ:

| | **මුළු ආදායම (රු.'000)** | **මුළු වියදම (රු.'000)** |
|---|---|---|
| (1) | 1 200 | 800 |
| (2) | 1 200 | 1 000 |
| (3) | 2 250 | 2 000 |
| (4) | 2 400 | 2 000 |
| (5) | 2 400 | 2 200 |

(……)

- **අංක 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු නලින්ද සහ ශාන්ත හවුල් ව්‍යාපාරය හා බැඳේ.

| **2017.03.31 දිනට ශේෂ** | **නලින්ද (රු.'000)** | **ශාන්ත (රු.'000)** |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 800 | 500 |
| ජංගම ගිණුම් | 200 | 100 |

2017.04.01 දින නලින්ද රු. 200 000 ක් අතිරේක ප්‍රාග්ධනය ලෙස ද ශාන්ත රු. 500 000 ක් ණයක් ලෙස ද මුදලින් හවුල් ව්‍යාපාරයට ලබා දෙන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂික පොලී අනුපාතය 5% ක් වන අතර එය ශාන්තගේ ජංගම ගිණුමට බැර කරනු ලබයි.

නලින්ද සහ ශාන්ත අතර ලාභ සහ අලාභ පිළිවෙළින් 3:2 අනුපාතයට බෙදා ගනු ලබන අතර ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල අවසාන ශේෂය මත 10% ක වාර්ෂික පොලී අනුපාතයකට හිමිකම් ලබයි.

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. 500 000 කි. වර්ෂය තුළදී නලින්ද සහ ශාන්ත පිළිවෙළින් රු. 100 000 ක සහ රු. 50 000 ක මුදල්, හවුල් ව්‍යාපාරයෙන් ගැනිලි ලෙස ලබා ගන්නා ලදී. මේ හැර වෙනත් කිසිදු මුදලක් හවුල්කරුවන් විසින් ලබාගෙන නොමැත.

**14.** 2018.03.31 දිනට මෙම හවුල් ව්‍යාපාරයේ හිමිකම:

(1) රු. 1 350 000 (2) රු. 1 500 000 (3) රු. 1 650 000
(4) රු. 2 175 000 (5) රු. 2 300 000 (……)

**15.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී හවුල්කරුවන් සමග සිදු වූ ගනුදෙනු තුළින් ලද ශුද්ධ මුදල සහ 2018.03.31 දිනට ශාන්තගේ ජංගම ගිණුමේ ශේෂය:

| | **ලද ශුද්ධ මුදල (රු.)** | **ශාන්තගේ ජංගම ගිණුමේ ශේෂය (රු.)** |
|---|---|---|
| (1) | 50 000 | 265 000 |
| (2) | 50 000 | 410 000 |
| (3) | 550 000 | 265 000 |
| (4) | 550 000 | 315 000 |
| (5) | 550 000 | 410 000 |

(……)

**16.** එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ සමාගමක් මිල දී ගත් යන්ත්‍රයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| දිනය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|
| 2017.04.01 | යන්ත්‍රය ආනයනය කිරීම (15% ක VAT සහිතව) | 575 000 |
| 2017.04.15 | සමාගම වෙත යන්ත්‍රය ප්‍රවාහනය කිරීම | 40 000 |
| 2017.04.30 | වැඩබිම සකස් කිරීම සහ යන්ත්‍රය සවි කිරීම | 60 000 |
| 2017.05.15 | මූලික පරීක්ෂණ ධාවනය සිදු කිරීම සහ එමගින් යන්ත්‍රය හොඳින් ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීම | 80 000 |
| 2017.05.15 | මූලික පරීක්ෂණ ධාවනයේදී නිපදවූ අයිතම විකිණීමෙන් මුදල් ලැබීම | 30 000 |
| 2017.06.30 | විවෘත කිරීමේ උත්සවය පැවැත්වීම | 20 000 |

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනා ගැනීමේදී මෙම යන්ත්‍රයෙහි පිරිවැය සහ යන්ත්‍ර ක්ෂය කිරීම ආරම්භ කරන දිනය වන්නේ:

| | පිරිවැය (රු.) | දිනය |
|---|---|---|
| (1) | 540 000 | 2017.04.15 |
| (2) | 650 000 | 2017.05.15 |
| (3) | 650 000 | 2017.06.30 |
| (4) | 725 000 | 2017.06.30 |
| (5) | 755 000 | 2017.05.15 |

(……)

**17.** සීමිත ගමගේ පොදු සමාගම 2017.04.01 දින මූල්‍ය කල්බද්දක් මත මෝටර් රථයක් මිල දී ගන්නා ලදී. මෙදිනට මෝටර් රථයේ සාධාරණ අගය රු. 5 400 000 ක් වූ අතර එදිනම රු. 1 400 000 ක මූලික ගෙවීමක් සිදු කරන ලදී. වසර 4 ක කල්බදු කාල සීමාව තුළදී රු. 1 262 000 ක කල්බදු වාරිකයක් සෑම වසරකම මාර්තු 31 දින ගෙවිය යුතු ය. පළමු වාරිකය 2018.03.31 දින ගෙවන ලදී. කල්බද්ද සඳහා ගම්‍ය පොලී අනුපාතය වාර්ෂිකව 10% කි.

LKAS 17 (කල්බදු) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් සහ ජංගම නොවන වගකීම් ලෙස දක්වනු ලබන කල්බදු වගකීම් වන්නේ:

| | ජංගම වගකීම් (රු.) | ජංගම නොවන වගකීම් (රු.) |
|---|---|---|
| (1) | 862 000 | 2 189 800 |
| (2) | 862 000 | 3 138 000 |
| (3) | 948 200 | 2 189 800 |
| (4) | 948 200 | 3 138 000 |
| (5) | 1 262 000 | 1 876 000 |

(……)

- **අංක 18 සහ 19 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු සීමිත අජිත් පොදු සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---|
| පිරිවැටුම | 800 000 |
| විකුණුම් පිරිවැය | 300 000 |
| පරිපාලන හා බෙදාහැරීමේ වියදම් | 80 000 |
| ප්‍රත්‍යාගණනය මත අතිරික්තය/(හිඟය): | |
| ඉඩම් | 60 000 |
| යන්ත්‍ර | 100 000 |
| කාර්යාල උපකරණ | (75 000) |

සියලු ම දේපළ, පිරියත සහ උපකරණ 2018.03.31 දින ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉඩම් ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය කළ අතර යන්ත්‍ර සහ කාර්යාල උපකරණ දෙවන වතාවට ප්‍රත්‍යාගණනය කරන ලදී. යන්ත්‍ර සහ කාර්යාල උපකරණ 2016.03.31 දින ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය කිරීමෙන් පිළිවෙළින් රු. 30 000 ක හිඟයක් සහ රු. 40 000 ක අතිරික්තයක් ඇති විය. සමාගමේ සියලුම වත්කම්, හිමිකම මගින් මූල්‍යනය කර ඇති අතර සමාගම ආදායම් බදු සඳහා යටත් නොවේ.

**18.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ මුළු ආදායම සහ මුළු විස්තීරණ ආදායම:

| | **මුළු ආදායම (රු.)** | **මුළු විස්තීරණ ආදායම (රු.)** |
|---|---|---|
| (1) | 900 000 | 160 000 |
| (2) | 930 000 | 505 000 |
| (3) | 960 000 | 505 000 |
| (4) | 960 000 | 580 000 |
| (5) | 1 000 000 | 160 000 |

(……)

**19.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම:

| | **ලාභය (රු.)** | **වෙනත් විස්තීරණ ආදායම (රු.)** |
|---|---|---|
| (1) | 345 000 | 90 000 |
| (2) | 345 000 | 130 000 |
| (3) | 385 000 | 160 000 |
| (4) | 415 000 | 90 000 |
| (5) | 415 000 | 130 000 |

(……)

**20.** සීමිත සාරංග පොදු සමාගම ඇඟළුම් අලෙවි කිරීමේ නිරත වේ. මෙම සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සාරාංශගත මුදල් ගිණුම පහත දැක්වේ.

**මුදල් ගිණුම (රු.)**

| | | | |
|---|---|---|---|
| ශේෂය - 2017.04.01 | 70 000 | ණයහිමි පාලන | 720 000 |
| විකුණුම් | 850 000 | ගෙවිය යුතු කුලී වියදම් | 40 000 |
| ණයගැති පාලන | 550 000 | බෙදාහැරීමේ වියදම් | 180 000 |
| ලාභාංශ ආදායම් | 10 000 | පරිපාලන වියදම් | 270 000 |
| බැංකු ණය | 500 000 | මෝටර් රථයක් මිලට ගැනුම් | 560 000 |
| | | ආදායම් බදු | 125 000 |
| | | ශේෂය-2018.03.31 | 85 000 |
| | **1 980 000** | | **1 980 000** |

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය:

(1) රු. 65 000 (2) රු. 75 000 (3) රු. 85 000
(4) රු. 115 000 (5) රු. 190 000 (……)

**21.** 2017.03.31 දිනට සීමිත නිමාලි පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් පහත ශේෂ උපුටා ගන්නා ලදී.

| **විස්තරය** | **රු.** |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - එකක් රු. 10 බැගින් නිකුත් කළ සාමාන්‍ය කොටස් 80 000 | 800 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 300 000 |
| රඳවාගත් ඉපැයුම් | 450 000 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සමාගම විසින් කරන ලද කොටස් නිකුතුවල තොරතුරු පහත පරිදි වේ.

| **දිනය** | **විස්තරය** |
|---|---|
| 2017.05.01 | කොටසක් රු. 15 බැගින් කොටස් 20 000 ක ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් කරන ලදී. කොටස් 25 000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. කොටස් සමානුපාතිකව විභජනය කරන ලදී. |
| 2018.01.01 | 2017.04.01 දිනට පැවති සෑම කොටස් හතරකටම එක බැගින් කොටසක් රු. 20 බැගින් නිකුත් කරමින් රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 600 000 ක් විය.

2018.03.31 දිනට මෙම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය-සාමාන්‍ය කොටස් සහ හිමිකම:

| | **ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් (රු.)** | **හිමිකම (රු.)** |
|---|---|---|
| (1) | 1 100 000 | 1 850 000 |
| (2) | 1 100 000 | 2 525 000 |
| (3) | 1 500 000 | 2 450 000 |
| (4) | 1 500 000 | 2 850 000 |
| (5) | 1 600 000 | 2 925 000 |

(……)

**22.** සීමිත අන්ජුල පොදු සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂවරුන් විසින් 2018.05.15 දින අනුමත කළ අතර සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2018.05.30 දින පවත්වන ලදී. 2018.03.31 දිනට පසුව පහත සිදුවීම් සමාගමේ සිදු විය.

A - පිරිවැය රු. 1 000 000 ක් වූ ගොඩනැගිල්ලක් 2018.04.10 දින ඇති වූ ගින්නකින් විනාශ විය.

B - රු. 500 000 ක් ගෙවිය යුතුව තිබූ ණයගැතියකු 2018.05.05 දින බුන්වත් වූ බව ප්‍රකාශ කරන ලදී. 2018.04.05 දින සිදු කරන ලද භාණ්ඩ විකිණීමක් නිසා මෙම ණයගැති ශේෂය ඇති විය.

C - 2018.03.31 දින ආනයනය කරන ලද මෝටර් රථ සඳහා ගෙවිය යුතු රු. 400 000 ක බදු ඇස්තමේන්තුව ශ්‍රී ලංකා රේගුව විසින් 2018.05.10 දින සමාගමට දැනුම් දෙන ලදී.

LKAS 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත කුමන සිදුවීම/සිදුවීම් ගළපන සිද්ධීන් ලෙස සලකනු ලබයි ද?

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) B හා C පමණි. (……)

**23.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සමන් පොදු සමාගමට පහත තොරතුරු අදාළ වේ.

| | **රු.' 000** |
|---|---|
| විකුණුම් (සියලු විකුණුම් ණය පදනම මත වේ.) | 2 400 |
| දළ ලාභය | 1 400 |
| සාමාන්‍ය තොගය | 200 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය එකතු කිරීමේ කාලය දින 45 කි. වසරකට දින 360 ක් බව උපකල්පනය කරන්න.

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ තොග රැඳවුම් කාලය සහ සාමාන්‍ය ණයගැතියෝ:

| | **තොග රැඳවුම් කාලය (දින)** | **සාමාන්‍ය ණයගැතියෝ (රු.)** |
|---|---|---|
| (1) | 30 | 53 333 |
| (2) | 30 | 125 000 |
| (3) | 30 | 300 000 |
| (4) | 72 | 53 333 |
| (5) | 72 | 300 000 |

(……)

**24.** සමාගමක ගිණුම්කරණ අනුපාත සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය **අසත්‍ය** වේ ද?
(පහත එක් එක් අවස්ථාවට බලපාන අනෙකුත් සාධක ස්ථාවරව පවතී යයි උපකල්පනය කරන්න.)

(1) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු අනුපාතය වැඩි වීමක් පොලී ආවරණ අනුපාතයට බලපෑමක් ඇති නොකෙරේ.
(2) පසුගිය වසරට සාපේක්ෂව ණයගැති පිරිවැටුම් අනුපාතය වැඩි වීමක් මගින් ප්‍රවර්තන වර්ෂය තුළදී ළිහිල් ණය එකතු කිරීමේ උපක්‍රමයක් අනුගමනය කළ බව පෙන්නුම් කෙරේ.
(3) පසුගිය වසරට සාපේක්ෂව තොග රැඳවුම් කාලයේ වැඩි වීමක් මගින් ප්‍රවර්තන වර්ෂය තුළදී ළිහිල් තොග කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව පෙන්නුම් කෙරේ.
(4) පසුගිය වසරට සාපේක්ෂව මුදල් හා මුදල් සමාන දෑවල වැඩි වීමක් මගින් ප්‍රවර්තන වර්ෂයේ ද්‍රවශීලතා අනුපාතවල වැඩි වීමක් පෙන්නුම් කෙරේ.
(5) පසුගිය වසරට සාපේක්ෂව අවසාන තොගයේ වැඩි වීමක් මගින් ප්‍රවර්තන වර්ෂයේ ක්ෂණික වත්කම් අනුපාතයට බලපෑමක් ඇති නොකෙරේ. (……)

**25.** කළමනාකරණ ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - එය කළමනාකරණයේ අභිමතය පරිදි සිදු කරනු ලබයි.
B - එය සියළු ඇල්මැති පාර්ශ්වයන්ගේ අවශ්‍යතා ගැන අවධානය යොමු කරයි.
C - එය අනාගත කටයුතු සැලසුම් කිරීමට භාවිත කරනු ලබයි.
D - එය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත පිහිටා තොරතුරු සපයනු ලබයි.

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (……)

**26.** සමාගමක් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා සුවිශේෂී අමුද්‍රව්‍යයක් භාවිත කරයි.
එහි යළි ඇණවුම් ප්‍රමාණය ඒකක 8 000 ක් වේ. අමුද්‍රව්‍ය භාවිතය සහ පොරොත්තු කාලය පහත පරිදි වේ.

| | **උපරිම** | **අවම** |
|---|---|---|
| දිනක භාවිතය (ඒකක) | 200 | 100 |
| පොරොත්තු කාලය (සති) | 05 | 03 |

සමාගම සතියේ දින හතම වැඩ කරනු ලබයි. මෙම සමාගම විසින් පවත්වා ගනු ලබන අවම සහ උපරිම තොග මට්ටම් වනුයේ:

| | **අවම තොග මට්ටම (ඒකක)** | **උපරිම තොග මට්ටම (ඒකක)** |
|---|---|---|
| (1) | 2 800 | 10 800 |
| (2) | 2 800 | 12 900 |
| (3) | 3 800 | 12 900 |
| (4) | 6 000 | 10 800 |
| (5) | 6 000 | 12 900 |

(……)

**27.** නිෂ්පාදන සමාගමක නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. මෙම දෙපාර්තමේන්තුවලට අදාළ අයවැයගත සහ සත්‍ය තොරතුරු පහත පරිදි වේ.

| | **නිෂ්පාදන දෙපාර්තමේන්තු** | | **සේවා දෙපාර්තමේන්තුව** |
|---|---|---|---|
| | **යන්ත්‍ර** | **එකලස්** | **ගබඩාව** |
| අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (රු.) | 420 000 | 320 000 | 180 000 |
| අයවැයගත සෘජු අමුද්‍රව්‍ය පිරිවැය (රු.) | 500 000 | 400 000 | – |
| අයවැයගත යන්ත්‍ර පැය | 52 000 | 2 000 | – |
| අයවැයගත ශ්‍රම පැය | 10 000 | 20 000 | – |
| සත්‍ය යන්ත්‍ර පැය | 50 000 | 1 000 | – |
| සත්‍ය ශ්‍රම පැය | 13 000 | 16 000 | – |

සෘජු අමුද්‍රව්‍ය පිරිවැය මත සේවා දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර නැවත විභජනය කරනු ලැබේ.
යන්ත්‍ර දෙපාර්තමේන්තුවට සහ එකලස් දෙපාර්තමේන්තුවට වඩාත්ම උචිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත:

| | **යන්ත්‍ර දෙපාර්තමේන්තුව** | **එකලස් දෙපාර්තමේන්තුව** |
|---|---|---|
| (1) | යන්ත්‍ර පැයකට රු. 10 | ශ්‍රම පැයකට රු. 20 |
| (2) | යන්ත්‍ර පැයකට රු. 10 | යන්ත්‍ර පැයකට රු. 200 |
| (3) | යන්ත්‍ර පැයකට රු. 10 | ශ්‍රම පැයකට රු. 25 |
| (4) | ශ්‍රම පැයකට රු. 40 | ශ්‍රම පැයකට රු. 25 |
| (5) | ශ්‍රම පැයකට රු. 52 | යන්ත්‍ර පැයකට රු. 200 |

(……)

● **අංක 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් තනි භාණ්ඩයක් නිපදවනු ලබන අතර ඒකකයක් රු. 50 කට විකුණනු ලබයි. පහත තොරතුරු ක්‍රියාකාරී මට්ටම් දෙකකට අදාළ වේ.

| **නිෂ්පාදිත ඒකක ගණන** | **ඒකකයක පිරිවැය (රු.)** |
|---|---|
| 2 000 | 50 |
| 3 000 | 40 |

**28.** මුළු ස්ථාවර පිරිවැය සහ ඒකක විචල්‍ය පිරිවැය පිළිවෙළින්:
(1) රු. 20 000 සහ රු. 10
(2) රු. 20 000 සහ රු. 20
(3) රු. 40 000 සහ රු. 30
(4) රු. 60 000 සහ රු. 10
(5) රු. 60 000 සහ රු. 20
(……)

**29.** සමච්ඡේදන ලක්ෂ්‍ය (ඒකකවලින්) සහ දායක විකුණුම් අනුපාතය පිළිවෙළින්:
(1) 500 සහ 0.4
(2) 667 සහ 0.4
(3) 1 000 සහ 0.8
(4) 1 500 සහ 0.6
(5) 2 000 සහ 0.6
(……)

**30.** ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති ඇගයීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?
A - පිළිගෙවුම් කාල ක්‍රමය, මුදලේ කාලීන වටිනාකම සැලකිල්ලට නොගනී.
B - ශුද්ධ වර්තමාන වටිනාකම් ක්‍රමය, මුළු ව්‍යාපෘති කාලය පුරා ලද මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගනී.
C - ගිණුම්කරණ ඉපැයුම් අනුපාතය මුළු ව්‍යාපෘති කාලය සඳහා ආදායම් සහ වියදම් සැලකිල්ලට ගනී.
(1) A පමණි.
(2) B පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C යන සියල්ලම.
(……)

ලකුණු ……… × ……… = …………

2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 01 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 3 | 16. | 2 |
| 02. | 3 | 17. | 3 |
| 03. | 4 | 18. | 3 |
| 04. | 2 | 19. | 4 |
| 05. | 2 | 20. | 1 |
| 06. | 2 | 21. | 3 |
| 07. | 5 | 22. | 3 |
| 08. | 5 | 23. | 5 |
| 09. | 2 | 24. | 3 |
| 10. | 4 | 25. | 2 |
| 11. | 3 | 26. | 2 |
| 12. | 4 | 27. | 1 |
| 13. | 4 | 28. | 5 |
| 14. | 4 | 29. | 5 |
| 15. | 3 | 30. | 5 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **04** බැගින් මුළු ලකුණු **120**කි.

## 2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

**31.** පහත දී ඇති එක් එක් තොරතුරු කෙරෙහි **වඩාත්ම** උනන්දුවක් දක්වන්නේ ව්‍යාපාරයක පහත සඳහන් කුමන ඇල්මැති පාර්ශ්වය ද?

(1) රජය (2) ආයෝජකයන් (3) ණය සැපයුම්කරුවන් (4) කළමනාකරුවන්

| **තොරතුරු** | **ඇල්මැති පාර්ශ්වය (අංකය දක්වන්න)** |
|---|---|
| A - දිගුකාලීන බැඳීම් පියවීමට ආයතනය සතු හැකියාව | :...................... |
| B - ආයෝජිත ප්‍රාග්ධනයට සාපේක්ෂව ආයතනයේ ලාභදායීත්වය | :...................... |
| C - ආයතනයක් නිපදවනු ලබන භාණ්ඩවල පිරිවැය | :...................... |
| D - ආයතනය ගෙවනු ලබන බදු ප්‍රමාණය | :...................... |

පිළිතුර

31. A - 3 (01)
B - 2 (01)
C - 4 (01)
D - 1 (01)

- **අංක 32, 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2018 මාර්තු මාසයේදී සීමිත ගැමුණු පොදු සමාගමේ පහත ගනුදෙනු සිදු විය. මෙම සමාගමේ ගිණුම් වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ.

(1) සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් රු. 500 000 ක මුදල් ලැබුණි.
(2) රු. 1 000 000 ක භාණ්ඩ ණයට මිල දී ගැනීම.
(3) ඉඩම ප්‍රථමවතාවට ප්‍රත්‍යාගණනය කරන ලද අතර එමගින් රු. 300 000 ක ඌනතාවක් ඇති විය.
(4) රු. 60 000 ක ප්‍රචාරණ වියදම් දරන ලද අතර එය 2018 මැයි මාසයේදී ගෙවිය යුතු ය.

**32.** පහත කුමන ප්‍රකාශය මගින් ඉහත එක් එක් ගනුදෙනුවේ බලපෑම දක්වනු ලබයි ද?

| **බලපෑම** | **ගනුදෙනුව (අංකය දක්වන්න)** |
|---|---|
| A - වත්කම් අඩු වීම සහ හිමිකම අඩු වීම | :............................ |
| B - වගකීම් වැඩි වීම සහ හිමිකම අඩු වීම | :............................ |
| C - වත්කම් වැඩි වීම සහ හිමිකම වැඩි වීම | :............................ |
| D - වත්කම් වැඩි වීම සහ වගකීම් වැඩි වීම | :............................ |

පිළිතුර

32. A - 3 (01)
B - 4 (01)
C - 1 (01)
D - 2 (01)

**33.** ඉහත එක් එක් ගනුදෙනුව වාර්තා කරනු ලබන මූලික සටහන් පොත සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **මූලික සටහන් පොත** |
|---|---|
| (1) | ...................................................... |
| (2) | ...................................................... |
| (3) | ...................................................... |
| (4) | ...................................................... |

පිළිතුර

| 33. | ගනුදෙනුව | මූලික සටහන් පොත | |
|---|---|---|---|
| | 1 | මුදල් ලැබීම් ජර්නලය | (01) |
| | 2 | ගැනුම් ජර්නලය | (01) |
| | 3 | පොදු ජර්නලය | (01) |
| | 4 | පොදු ජර්නලය | (01) |

**34.** ඉහත ගනුදෙනු පොදු ලෙජරයේ වාර්තා කරනුයේ කුමන ගිණුම් වර්ගයක් යටතේ ද යන්න '√' ලකුණක් යොදමින් දක්වන්න.

| ගනුදෙනුව | ගිණුම් වර්ගය | | | | |
|---|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | හිමිකම් | ආදායම් | වියදම් |
| (1) | ............ | ............ | ............ | ............ | ............ |
| (2) | ............ | ............ | ............ | ............ | ............ |
| (3) | ............ | ............ | ............ | ............ | ............ |
| (4) | ............ | ............ | ............ | ............ | ............ |

පිළිතුර

34. **ගනුදෙනුව** **ගිණුම් වර්ගය**

| | වත්කම් | වගකීම් | හිමිකම් | ආදායම් | වියදම් | |
|---|---|---|---|---|---|---|
| (1) | √ | ..... | √ | ..... | ..... | (01) |
| (2) | ..... | √ | ..... | ..... | √ | (01) |
| (3) | √ | ..... | ..... | ..... | √ | (01) |
| (4) | ..... | √ | ..... | ..... | √ | (01) |

● **අංක 35 සහ 36 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු සීමිත අමල් පොදු සමාගමේ 2017.04.01 දිනට අදාළ වේ.

| | **රු.'000** |
|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 900 |
| අඩමාණ ණය සඳහා ඉඩ හැරීම | 90 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ පහත ගනුදෙනු සිදු කරන ලදී.

| | **රු.'000** |
|---|---|
| ණයට විකුණුම් | 3 600 |
| ආපසු එවුම් | 400 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා මුදල් ලැබීම | 2 800 |
| කපාහරින ලද බොල් ණය | 200 |

ව්‍යාපාරය විසින් වසර අවසාන වෙළෙඳ ලැබිය යුතු දෑ මත 10% ක අඩමාණ ණය සඳහා ඉඩ හැරීමක් සිදු කරනු ලබයි.

**35.** 2018.03.31 දිනට පහත දෑ:

(අ) වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය (රු.'000) .....................

(ආ) වාර්තා කරන ලද වෙළෙඳ ලැබිය යුතු දෑවල ධාරණ වටිනාකම (රු.'000) .....................

පිළිතුර

35. (අ) රු.1100 000 (02)

(ආ) රු. 990 000 (02)

**36.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බොල් ණය සහ අඩමාණ ණය වාර්තා කිරීමට අදාළ ජර්නල් සටහන්:

| විස්තරය | හර (රු.' 000) | බැර (රු.' 000) |
|---|---|---|
| (අ) ............................................. | ..................... | |
| ............................................. | | ..................... |
| (බොල් ණය වාර්තා කිරීම) | | |
| (ආ) ............................................. | ..................... | |
| ............................................. | | ..................... |
| (අඩමාණ ණය වාර්තා කිරීම) | | |

පිළිතුර

| | | | | |
|---|---|---|---|---|
| 36. | (අ) | බොල්ණය ගිණුම | 200 | |
| | | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | | 200 |
| | (ආ) | අඩමාණ ණය/ ලාභාලාභ ගිණුම | 20 | |
| | | අඩමාණ ණය සඳහා ඉඩ හැරීම / අඩමාණ ණය වෙන් කිරීම් | | 20 |

**37.** ඉසුරුගේ ආහාර සැපයීමේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදු විය.

- ⁕ 2018.01.15 - ආහාර සැපයීමට ඇණවුමක් භාරගත් අතර රු. 100 000 ක මුදල් අත්තිකාරමක් ලැබුණි.
- ⁕ 2018.01.28 - ඉහත ඇණවුම සඳහා ආහාර සැපයූ අතර රු. 200 000 ක මුදල් ලැබුණි.
- ⁕ 2018.02.05 - මෙම ඇණවුම සඳහා ඉතිරි මුදල් රු. 50 000 ක් ලැබුණි.

ඉහත ඇණවුමේ ආදායම හඳුනා ගැනීමට අදාළව:

(අ) ආදායම හඳුනා ගන්නා දිනය :..................................

(ආ) මෙදිනට හඳුනා ගත යුතු ආදායම : රු. ..............................

(ඉ) වඩාත්ම උචිත ගිණුම්කරණ සංකල්පය :..................................

පිළිතුර

37. (අ) 2018.01.28 (1)

(ආ) රු. 350 000 (2)

(ඉ) ආදායම් හඳුනා ගැනීමේ සංකල්පය/ උපලබ්ධි සංකල්පය (01)

**38.** සීමිත පොදු සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත සඳහන් අයිතම ගැළපීමෙන් එහි ලාභය **වැඩිවේ ද (I), අඩුවේ ද (D)** හෝ **වෙනස් නොවේ ද (NC)** යන්න දක්වන්න. (මෙම අයිතම මෙතෙක් පොත්වල ගැළපුම් කර නොමැත.)

| | ලාභයට වන බලපෑම (I, D හෝ NC ලෙස දක්වන්න.) |
|---|---|
| A - උපචිත විදුලිය | :.................................. |
| B - ලැබිය යුතු පොලී ආදායම | :.................................. |
| C - ණයහිමියන්ගෙන් ලද වට්ටම් | :.................................. |
| D - ඉඩමක් ප්‍රථමවරට ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය | :.................................. |

පිළිතුර

38. A - D (01)

B - I (01)

C - I (01)

D - NC (01)

**39.** රන්තරු ක්‍රීඩා සමාජයෙහි සාමාජිකයින් ගණන 100 කි. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 2 400 කි. පහත තොරතුරු දී ඇත.

| විස්තරය | 2018.03.31 දිනට (රු.) | 2017.03.31 දිනට (රු.) |
|---|---|---|
| කලින් ලද සාමාජික මුදල් | 24 000 | 12 000 |
| හිඟ සාමාජික මුදල් | 36 000 | 48 000 |

මෙම ක්‍රීඩා සමාජයේ පහත ඇ දක්වන්න:

(අ) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම රු. ....................

(ආ) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ලද මුළු සාමාජික මුදල රු. ....................

පිළිතුර

39. (අ) රු. 240 000 (02)
(ආ) රු. 264 000 (02)

**40.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුර සහ බිමල් හවුල් ව්‍යාපාරයේ ලාභ සහ අලාභ විසර්ජන ගිණුමෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු. | රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය මත පොලිය 5%: | | |
| අනුර | 5 000 | |
| බිමල් | 20 000 | 25 000 |
| ලාභ කොටස්: | | |
| අනුර | 20 000 | |
| බිමල් | 10 000 | 30 000 |

මෙම ගිණුම ආධුනික ගිණුම් ලිපිකරුවකු විසින් පිළියෙල කර ඇති අතර එහිදී හවුල් ව්‍යාපාර ගිවිසුම සැලකිල්ලට ගෙන නොමැත. කෙසේ වුව ද මෙම වටිනාකම් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වලට පිටපත් කර ඇත.

හවුල් ව්‍යාපාර ගිවිසුම අනුව අනුර සහ බිමල් අතර ලාභ සහ අලාභ පිළිවෙළින් 3:2 අනුපාතයට බෙදාගත යුතු වේ. ගිවිසුමෙහි ප්‍රාග්ධනය මත පොලී සම්බන්ධයෙන් කිසිදු වගන්තියක් නොමැත.

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ශේෂ නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන ලියා දක්වන්න.

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ............................................ | ............... | |
| ............................................ | | ............... |

පිළිතුර

40. ජංගම ගිණුම - බිමල් හර රු.8000 (04)
ජංගම ගිණුම - අනුර බැර රු.8000

**41.** ශාන්ත සහ යසිත් ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. ඔවුන් පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනු ලැබේ. 2017.04.01 දින දයාන් හවුල්කරුවෙකු ලෙස බඳවා ගත් අතර එදිනට ශාන්තගේ සහ යසිත්ගේ ප්‍රාග්ධන ශේෂ පිළිවෙළින් රු. 1 000 000 ක් සහ රු. 750 000 ක් විය. ශාන්ත, යසිත් සහ දයාන් අතර නව ලාභාලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙළින් 2:2:1ක් විය. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 3 000 000 ක් ලෙසට ඇස්තමේන්තු කරන ලදී. තව ද කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීමටත් එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීමටත් තීරණය කරන ලදී.

කීර්තිනාමය ගැළපූ පසු ශාන්තගේ සහ යසිත්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ දක්වන්න.

(අ) ශාන්ත රු. .................................... (ආ) යසිත් රු. ....................................

පිළිතුර

41. (අ) - රු. 1600 000 (02) (ආ) රු. 750 000 (02)

**42.** පහත සඳහන් ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **T/F** |
|---|---|
| A - කාලය සහ වටිනාකම අවිනිශ්චිත වූ 'විය හැකි බැඳීම්' ප්‍රතිපාදන වේ. | :……………… |
| B - අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල හෙළිදරව් කරනු ලැබේ. | :……………… |
| C - පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට වසර අවසාන තොගය ආගණනය කරයි. | :……………… |
| D - ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සඳහා අතීතයට බලපාන පරිදි ගිණුම් තබනු ලැබේ. | :……………… |

පිළිතුර

42. A - F (01)
B - T (01)
C - T (01)
D - F (01)

**43.** LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව පහත අයිතම මූල්‍ය ප්‍රකාශනවල කුමන සංරචකයේ ඉදිරිපත් කරන්නේ ද යන්න සඳහන් කරන්න.

| **අයිතමය** | **මූල්‍ය ප්‍රකාශන සංරචකය** |
|---|---|
| A - විකුණුම් පිරිවැය | ………………………………………… |
| B - රඳවාගත් ඉපැයුම් | ………………………………………… |
| C - ගෙවූ ආදායම් බදු | ………………………………………… |
| D - වෙළෙඳ ගෙවිය යුතු දෑ | ………………………………………… |

පිළිතුර

43. A - ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය (01)
B - හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය/ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (01)
C - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (01)
D - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (01)

**44.** LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතය අනුව ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ගලායාම් ලෙස සටහන් කරන අයිතම **දෙක** බැගින් සඳහන් කරන්න.

| **වර්ගීකරණය** | **අයිතමය** |
|---|---|
| (අ) ආයෝජන ක්‍රියාකාරකම් | 1. ………………………………………… |
| | 2. ………………………………………… |
| (ආ) මූල්‍ය ක්‍රියාකාරකම් | 1. ………………………………………… |
| | 2. ………………………………………… |

පිළිතුර

44. (අ)
1. දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම
2. කොටස් / ණයකර මිලට ගැනීම
3. ආයෝජනවල යෙදවීම / ස්ථාවර තැන්පතුවල යෙදවීම

} (02) ඕනෑම අයිතම 2 කට

(ආ)
1. ණයකර නිදහස් කිරීම
2. ගෙවූ අතුරු ලාභාංශ
3. පොලී ගෙවීම්
4. කල්බදු වාරික/ බැංකු ණය වාරික ගෙවීම

} (02) ඕනෑම අයිතම 2 කට

**45.** සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක තොග පිරිවැටුම් අනුපාතය සහ ජංගම අනුපාතය පිළිවෙළින් වාර 10 ක් සහ 2:1 ක් විය. නමුත් පහත ගනුදෙනු පොත්වලින් අත්හැරී ඇති බව පසුව දැන ගන්නා ලදී.

මෙම ගනුදෙනු සැලකිල්ලට ගත් විට තොග පිරිවැටුම් සහ ජංගම අනුපාත **වැඩිවේ ද (I)**, **අඩුවේ ද (D)** හෝ **වෙනස් නොවේ ද (NC)** යන්න සඳහන් කරන්න.

| ගනුදෙනුව | තොග පිරිවැටුම් අනුපාතය (I/D/NC) | ජංගම අනුපාතය (I/D/NC) |
|---|---|---|
| (අ) පිරිවැය රු. 500 000 ක් වූ භාණ්ඩ රු. 800 000 කට ණයට විකිණීම | ................ | ................... |
| (ආ) පිරිවැය රු. 250 000 ක් වූ භාණ්ඩ ණයට මිල දී ගැනීම | ................ | ................... |

පිළිතුර

45.

| | තොග පිරිවැටුම් අනුපාතය | ජංගම අනුපාතය |
|---|---|---|
| (අ) | I (01) | I (01) |
| (ආ) | D (01) | D (01) |

**46.** පහත සඳහන් තොරතුරු සීමිත ආනන්ද පොදු සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| දළ ලාභය | 4 800 |
| විකුණුම් පිරිවැය | 7 200 |
| වෙනත් ආදායම් | 1 500 |
| මෙහෙයුම් සහ මූල්‍ය වියදම් | 4 500 |
| වෙනත් විස්තීරණ ආදායම් | 1 500 |

සමාගමේ ආදායම් බදු අනුපාතය බදු පෙර ලාභයෙන් 20% ක් වේ.

මෙම සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත දක්වන්න.

(අ) දළ ලාභ අනුපාතය (%) :......................

(ආ) ශුද්ධ ලාභ අනුපාතය (%) :......................

පිළිතුර

46. (අ) 40 % (02)

(ආ) 12 % (02)

**47.** සමාගමක් සෙල්ලම් බඩු වර්ගයක් නිපදවීමට සැලසුම් කරයි. දී ඇති කාලච්ඡේදයක් සඳහා මෙම නිෂ්පාදිතයට අදාළ අයවැය තොරතුරු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ඒකකයක සෘජු ද්‍රව්‍ය පිරිවැය | | රු. 2 300 |
| ඒකකයක සෘජු ශ්‍රම පිරිවැය | | රු. 1 000 |
| ඒකකයක මුළු සෘජු පිරිවැය | | රු. 3 300 |
| සෘජු ශ්‍රම රේටය | පැයකට | රු. 200 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය | සෘජු ශ්‍රම පැයකට | රු. 300 |
| නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | මුළු පිරිවැයෙන් | 20% |

පහත ඇ දක්වන්න:

(අ) ඒකකයක අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. :.........................

(ආ) ඒකකයක අයවැයගත නිෂ්පාදන පිරිවැය රු. :.........................

(ඇ) ඒකකයක අයවැයගත මුළු පොදුකාර්ය පිරිවැය රු. :.........................

පිළිතුර

47. (අ) රු. 1 500 (01)
(ආ) රු. 4 800 (02)
(ඉ) රු. 2 700 (01)

**48.** සමාගමක් 'බීටා' නම් වූ තනි භාණ්ඩයක් නිපදවනු ලබයි. පහත තොරතුරු එහි නිෂ්පාදනය සඳහා භාවිත කරන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍යයෙහි වාර්ෂික පරිභෝජනය | ඒකක | 10 000 |
| ඇණවුම් පිරිවැය | ඇණවුමකට රු. | 400 |
| රඳවා ගැනීමේ පිරිවැය | ඒකකයකට රු. | 200 |

පහත ඇ දක්වන්න:

(අ) මෙම අමුද්‍රව්‍යයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ....................................

(ආ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය මත පදනම්ව වසරකට කළ යුතු ඇණවුම් සංඛ්‍යාව ........................

පිළිතුර

48. (අ) ඒකක 200 (02)
(ආ) වාර 50 (02)

**49.** සමාගමක් විසින් තනි භාණ්ඩයක් නිපදවනු ලබන අතර එම ඒකකයක් රු. 60 කට විකුණනු ලබයි. සමාගම ඒකක 16 000 ක් විකුණන්නේ නම් ඒකකයක අලාභය රු. 10 ක් වන අතර ඒකක 40 000 ක් විකුණන්නේ නම් ඒකකයක ලාභය රු. 8 කි.

පහත ඇ දක්වන්න:

(අ) මුළු ස්ථාවර පිරිවැය රු. :..........................

(ආ) ඒකක දායකය රු. :..........................

(ඉ) සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකක :..........................

පිළිතුර

49. (අ) රු. 480 000 (02)
(ආ) රු. 20 (01)
(ඉ) ඒකක 24 000 (01)

**50.** සේවක කාර්යසාධනය දියුණු කිරීම සඳහා සමාගමක් එහි කර්මාන්තශාලාව වායුසමීකරණය කිරීමට තීරණය කරන ලදී. වායුසමීකරණයේ පිරිවැය රු. 1 500 000 ක් වේ. එහි ඵලදායී ජීව කාලය වසර 5 ක් වන අතර සුන්බුන් අගයක් නොමැත. සේවක කාර්යසාධනය වැඩි වීම නිසා වාර්ෂික ආදායම රු. 600 000 කින් වැඩි වේ යැයි ඇස්තමේන්තු කර ඇත. තව ද වායුසමීකරණය සඳහා රු. 240 000 ක අතිරේක නඩත්තු වියදමක් වාර්ෂිකව දැරීමට සිදු වේ. සමාගම එහි දේපළ, පිරියත සහ උපකරණ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

මෙම යෝජිත ව්‍යාපෘතියට අදාළව පහත ඇ දක්වන්න.

(අ) පළමු වර්ෂයේ ඇස්තමේන්තුගත ශුද්ධ මුදල් ප්‍රවාහය රු. :..........................

(ආ) අපේක්ෂිත වාර්ෂික ශුද්ධ ලාභය රු. :..........................

පිළිතුර

50. (අ) රු. 360 000 (02)
(ආ) රු. 60 000 (02)

### 2.1.5 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනාඃ

I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ




ඉහත ප්‍රස්තාරය අනුව ප්‍රශ්න අංක 31 සහ 32 සඳහා පිළිවෙළින් අපේක්ෂකයින්ගෙන් 92%ක් සහ 90%ක් ම නිවැරදි පිළිතුර සැපයීමට සමත්ව තිබීම විශේෂත්වයකි. මෙම ප්‍රශ්න මගින් පරීක්ෂා කිරීමට අපේක්ෂා කර තිබුණේ ගිණුම්කරණ තොරතුරු කෙරෙහි ඇල්මැති පාර්ශවයින් සහ ගනුදෙනු මගින් ගිණුම්කරණ සමීකරණයේ සංරචකයන්ට ඇතිවන බලපෑම වේ.

එමෙන් ම ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන සහ ලාභ සමීකරණය පිළිබඳ ව දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමට ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 4 හා 6 යන ප්‍රශ්නවලට ද 75%කට වඩා වැඩි ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීමට සමත්ව ඇති බව ඉහත ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරයි.

ණයගැති සහ ණයහිමි පාලන ගිණුම්වල ශේෂ අඩුවැඩි වීමට හේතුවන ගනුදෙනු, ගිණුම්කරණ සංකල්ප භාවිතය, ගනුදෙනුවලට අදාළ මූලික සටහන් පොත්, ගනුදෙනු මගින් ලාභයට වන බලපෑම සහ ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ ව දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමට ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 3, 7, 33, 38, 42 යන ප්‍රශ්නවලට ද අපේක්ෂකයින්ගෙන් 60%-74% ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

එමෙන් ම පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන, පාලන ගිණුම් ශේෂ නිවැරදි කිරීම, ඒක පුද්ගල ව්‍යාපාරයක ආදායම් හා වියදම් ගණනය කිරීම, හවුල් ව්‍යාපාර හිමිකම් ගණනය කිරීම (කීර්තිනාමය රහිතව) සීමිත සමාගමක මුළු ආදායම මුළු විස්තීර්ණ ආදායම ගණනය, කළමනාකරණ ගිණුම්කරණයේ මූලික ලක්ෂණ, ගිණුම් වර්ගීකරණය, ලාභ අරමුණු කර නොගත් සංවිධානවල සාමාජික මුදල් ආදායම ගණනය කිරීම, නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේදී කීර්තිනාමය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වර්ගීකරණය පිළිබඳ දැනුම අවබෝධය සහ භාවිතය පරීක්ෂා කිරීම සඳහා ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 1, 12, 13, 14, 15, 18, 25, 34, 39, 41, 44 යන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 50%-59% අතර ප්‍රමාණයකි.

ප්‍රශ්න අංක 2, 5, 8, 9, 11, 16, 17, 19, 21, 22, 23, 24, 26, 27, 28, 29, 30, 35, 36, 37, 43, 45, 46 සහ 48 යන ප්‍රශ්න සඳහා සාර්ථක ව පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 30%-49% අතර ප්‍රමාණයකි. එම ප්‍රශ්නවලින් පරීක්ෂා කිරීමට උත්සාහ කර ඇත්තේ ගිණුම්කරණය පිළිබඳ මූලික දැනුම, ගනුදෙනු මගින් ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම, මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මිනුම් කිරීමේ ක්‍රම (මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව) ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ගති ලක්ෂණ (මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව) පාලන ගිණුම්, දේපල පිරියත හා උපකරණ වටිනාකම හඳුනා ගැනීම, සීමිත සමාගමක ලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම සෙවීම, කොටස් නිකුත් කිරීම, සංචිත ප්‍රාග්ධනිත කිරීම, ගිණුම්කරණ ප්‍රමිත, මූල්‍ය ගිණුම්කරණ අනුපාත, බොල් සහ අඩමාන ණය, ගිණුම්කරණ සංකල්ප සහ කළමනාකරණ ගිණුම්කරණයට අදාළ තොග මට්ටම් ගණනය සහ පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය, ආන්තික පිරිවැයකරණය, ආයෝජන තීරණ, ආර්ථික ඇනවුම් ප්‍රමාණය ආදිය පිළිබඳ දැනුම අවබෝධය භාවිතය සහ විශ්ලේෂණයයි.

ලාභ අපේක්ෂා නොකරන සංවිධාන සකස් කළයුතු මූල්‍ය වාර්තා පිළිබඳ අවබෝධය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හවුල් ව්‍යාපාරයක ගනුදෙනු පිළිබඳ මූලික දැනුම, පොදු කාර්ය පිරිවැය, ආන්තික පිරිවැයකරණය හා ආයෝජන තීරණ පිළිබඳ ව දැනුම, අවබෝධය, භාවිතය සහ විශ්ලේෂණය පරීක්ෂා කිරීමට ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 10, 20, 40, 47, 49 සහ 50 ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සපයා තිබූ අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 30%කට වඩා අඩු ප්‍රමාණයක් විය.

ඒ අනුව ගිණුම්කරණය I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සමස්ථයක් ලෙස මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ මූලික දැනුම, මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව, මූල්‍ය ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය සහ කළමනාකරණ ගිණුම්කරණයේ භාවිතයන් පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කළයුතු බව කිව යුතුය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ විෂයය කොටස් ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරමින්, ඉහත දුර්වලතා දක්වන ලද මාතෘකා පිළිබඳ ව වැඩි සැලකිල්ලක් දක්වමින් සංවර්ධනය වීම යෝග්‍ය බව කිව හැකිය.

### 2.1.6 I වන ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | කිසිදු පිළිතුරක් සපයා නොමැත |
| 1 | 3 | 2.43 | 4.20 | **51.93** | 8.90 | 32.20 | 0.33 |
| 2 | 3 | 44.57 | 4.47 | **43.60** | 3.53 | 3.63 | 0.20 |
| 3 | 4 | 2.07 | 4.00 | 13.03 | **70.50** | 9.80 | 0.60 |
| 4 | 2 | 9.90 | **75.60** | 8.70 | 3.93 | 1.73 | 0.13 |
| 5 | 2 | 2.93 | **36.17** | 7.43 | 46.13 | 6.67 | 0.67 |
| 6 | 2 | 3.50 | **81.00** | 12.10 | 2.00 | 1.23 | 0.17 |
| 7 | 5 | 1.77 | 15.57 | 6.33 | 10.07 | **65.87** | 0.40 |
| 8 | 5 | 7.67 | 14.00 | 18.30 | 19.20 | **39.63** | 1.20 |
| 9 | 2 | 16.33 | **39.83** | 11.30 | 20.00 | 11.33 | 1.20 |
| 10 | 4 | 6.70 | 4.37 | 66.10 | **9.33** | 13.03 | 0.47 |
| 11 | 3 | 9.53 | 26.37 | **38.27** | 10.30 | 13.63 | 1.90 |
| 12 | 4 | 6.20 | 12.87 | 12.20 | **52.43** | 14.83 | 1.47 |
| 13 | 4 | 9.63 | 6.70 | 5.60 | **51.00** | 26.80 | 0.27 |
| 14 | 4 | 8.27 | 12.17 | 14.60 | **52.47** | 11.23 | 1.27 |
| 15 | 3 | 12.80 | 7.23 | **49.87** | 18.97 | 9.57 | 1.57 |
| 16 | 2 | 3.33 | **49.37** | 17.77 | 10.37 | 18.83 | 0.33 |
| 17 | 3 | 11.13 | 21.90 | **39.00** | 14.67 | 11.63 | 1.67 |
| 18 | 3 | 5.97 | 18.93 | **55.57** | 14.87 | 3.63 | 1.03 |
| 19 | 4 | 10.37 | 19.87 | 18.03 | **36.27** | 14.27 | 1.20 |
| 20 | 1 | **28.00** | 14.50 | 19.97 | 22.17 | 13.40 | 1.97 |
| 21 | 3 | 15.30 | 13.93 | **42.27** | 16.73 | 10.00 | 1.77 |
| 22 | 3 | 10.50 | 9.10 | **43.43** | 16.97 | 19.07 | 0.93 |
| 23 | 5 | 11.80 | 12.93 | 18.33 | 14.13 | **40.87** | 1.93 |
| 24 | 3 | 10.70 | 13.53 | **36.37** | 9.60 | 28.63 | 1.17 |
| 25 | 2 | 2.33 | **57.03** | 8.70 | 20.80 | 10.67 | 0.47 |
| 26 | 2 | 12.00 | **49.43** | 16.43 | 12.27 | 8.30 | 1.57 |
| 27 | 1 | **44.37** | 14.00 | 27.93 | 7.10 | 4.87 | 1.73 |
| 28 | 5 | 24.60 | 11.27 | 10.33 | 14.67 | **37.30** | 1.83 |
| 29 | 5 | 15.37 | 9.27 | 15.20 | 14.63 | **43.07** | 2.47 |
| 30 | 5 | 6.13 | 10.37 | 14.17 | 22.67 | **42.60** | 4.07 |

වගුව 05

ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලෙස එක් එක් වරණය තෝරන ලද අපේක්ෂකයින්ගේ ප්‍රතිශත ඉහත වගු අංක 01හි දැක්වේ. එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය තෝරන ලද අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. ඒ අතුරින් විශේෂතා හඳුනාගත් ප්‍රශ්න කිහිපයක් පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

ඒ අනුව අපේක්ෂකයින් වැඩිම සාර්ථකත්වයක් දක්වා ඇත්තේ ප්‍රශ්න අංක 4 සහ 6ට පිළිතුරු සැපයීමේ දී ය. එම නිවැරදි පිළිතුරු සැපයීමේ ප්‍රතිශත පිළිවෙළින් 75.6%ක් හා 81%ක් විය. 4වන ප්‍රශ්නය ගනුදෙනු සටහන් කිරීමේදී භාවිත කරන මූලාශ්‍ර ලේඛන පිළිබඳ අවබෝධය පිරික්සන අතර 6වන ප්‍රශ්නය මගින් ලාභ සමීකරණය පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

ප්‍රශ්න අංක 3හි පිළිතුර වන 4වන වරණය තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 70.5%ක් වන අතර ප්‍රශ්න අංක 07 සඳහා නිවැරදි පිළිතුර වන 5වන වරණය 65.87%ක් තෝරා ඇත. එම ප්‍රශ්න මගින් පරීක්ෂා කිරීමට උත්සාහ කර ඇත්තේ ණයගැති සහ ණයහිමි ගිණුම්වල ශේෂ අඩුවැඩි වීමට බලපාන ගනුදෙනු සහ ගිණුම්කරණ සංකල්ප පිළිබඳ දැනුම සහ අවබෝධයයි.

ප්‍රශ්න අංක 5, 8, 9, 10, 11, 17, 19, 20, 24 සහ 28 යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 40%කට වඩා අඩු ප්‍රමාණයකි.

ඒ අතුරින් ප්‍රශ්න අංක 10 සඳහා නිවැරදි පිළිතුරු වූ 4වන වරණය තෝරා ගෙන තිබූ ප්‍රතිශතය 9.33%ක් වීම හා එහි වැරදි වරණයක් වන වරණ අංක 3 තෝරා ගෙන තිබූ ප්‍රතිශතය 66.1%ක් වීම විශේෂත්වයකි. එය ලාභ අපේක්ෂා නොකරන සංවිධානයක් (සුභසාධක සංගමයක්) පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සංරචකයන් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නයකි. මෙවැනි සංවිධානවල මූල්‍ය ප්‍රකාශන ලෙස පාසලේ දී පිළියෙල කරනු ලබන්නේ ආදායම් හා වියදම් ගිණුමත් (ආදායම් ප්‍රකාශනය) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයත් මුදල් ලැබීම් හා ගෙවීම් ගිණුමත් වන බැවින් "මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" යන්න අපේක්ෂකයින් වැරදි පිළිතුරක් ලෙස සලකා තිබීම බව කිව හැකිය.

ප්‍රශ්න අංක 20 සඳහා නිවැරදි පිළිතුර වූ 1වන වරණය තෝරා ගෙන තිබුණේ ද අපේක්ෂකයින්ගෙන් 28%කි. ඔවුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වන 22.17%ක් හා 19.97%ක් පිළිවෙළින් වරණ අංක 4 හා 3 තෝරා ගෙන තිබුණි. එය මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සෙවිය යුතු ප්‍රශ්නයකි. 4වෙනි වරණය තෝරාගත් අපේක්ෂකයින් ලාභාංශ ආදායම් එකතු කර තිබූ අතර "ගෙවිය යුතු කුලී වියදම්" අඩුකර නොතිබුණි. 3වන වරණය තෝරාගත් අපේක්ෂකයින් ලාභාංශ ආදායම එකතු කිරීම කර තිබුණි. මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සෙවීමේ දී ඍජු ක්‍රමය හා වක්‍ර ක්‍රමය පිළිබඳ අවබෝධයකින් තොරව කටපාඩම් කිරීමේ ක්‍රමය අනුගමනය කිරීම මෙයට බොහෝ සෙයින් හේතු විය හැකිය. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ලබාගත හැකි ආකාරයට අභ්‍යාස සකස් කරවීම වැදගත් බව කිව හැකිය.

ප්‍රශ්න අංක 5හි නිවැරදි පිළිතුර වූ 2වන වරණය තෝරාගෙන තිබුණේ අපේක්ෂකයින්ගෙන් 36.17%ක් වන අතර 4වන වරණය නිවැරදි පිළිතුර ලෙස තෝරාගෙන තිබූ අපේක්ෂකයින් ප්‍රමාණය 46.13%ක් වීම විශේෂත්වයකි. මෙම ප්‍රශ්නය පොදු ලෙජරය සම්බන්ධව දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. 4වන වරණය තෝරාගත් සිසුන් "පොදු ලෙජරයෙහි සියළු ගිණුම් සඳහා පියවීමේ සටහන් තබන බව" නිවැරදි ලෙස සලකා ඇත. ඒ අනුව පොදු ලෙජරයේ ඇති සියලු ගිණුම්, කාලච්ඡේදය අවසානයේදී නොපියවෙන බව අවධාරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

ප්‍රශ්න අංක 19 සඳහා නිවැරදි පිළිතුර වූ 4වන වරණය තෝරාගෙන තිබූ අපේක්ෂකයින්ගේ ප්‍රමාණය 36.27%ක් වූ අතර පිළිවෙළින් 1, 2, 3, 5 වරණයන් තෝරා තිබූ ප්‍රතිශතයන් 10.37%, 19.87%, 18.03% හා 14.27%ක් ලෙස විහිදී ගොස් තිබුණි. පළමුවන සහ දෙවන වරණයන් තෝරාගත් අපේක්ෂකයින් ලාභය ගණනයේදී ප්‍රවර්ථන වර්ෂයේ ප්‍රත්‍යාගණන හිඟය අඩු කොට දක්වා තිබූ අතර පෙර වර්ෂවල අතිරික්තයන් හා හිඟයන් සැලකිල්ලට ගෙන නොතිබුණි. 3වන වරණය තෝරාගත් අපේක්ෂකයින්

කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණන හිඟය පමණක් පසුගිය වර්ෂයේ අතිරික්තයට හිලව් කොට තිබුණි. වෙනත් විස්තීර්ණ ආදායම හඳුනා ගැනීමේ දී ද මෙම දුර්වලතාවය දක්වා ඇත. සමාගම් ගිණුම්කරණයේ දී ප්‍රත්‍යාගණන අතිරික්තයන් සහ හිඟයන් හිලව් වන ආකාරය වඩාත් පැහැදිලි වන ලෙස අභ්‍යාස වැඩි ප්‍රමාණයක් යොදා ගෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

ප්‍රශ්න අංක 24 සඳහා නිවැරදි පිළිතුර වූ 3වන වරණය තෝරා ගෙන තිබූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 36.37%ක් විය. 28.63%ක් ම තෝරා ගෙන තිබුණේ 5වන වරණය වේ. එය මූල්‍ය ගිණුම්කරණ අනුපාත භාවිතය පිළිබඳ ප්‍රශ්නයකි. 5වන වරණය තෝරාගත් අපේක්ෂකයින් එම වරණය හොඳින් කියවා අවබෝධ කරගත් බවක් නොපෙනේ. ඒ අනුව වරණ සියල්ල හොඳින් කියවීම හෝ අධ්‍යයනය කිරීම සිසුන් විසින් සිදු කළයුතු බව කිව යුතුය.

ප්‍රශ්න අංක 28 සඳහා නිවැරදි පිළිතුර වූ 5වන වරණය තෝරා ගෙන තිබූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 37.3%කි. 24.6%ක්ම තෝරාගෙන තිබුණේ 1වන වරණය වේ. එම පිළිතුර ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී මට්ටම් දෙකෙහි මුළු පිරිවැයන් අතර වෙනස සහ ඒකක පිරිවැයන් දෙක අතර වෙනස ලබාගෙන ඇත. මුළු ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය, ඒකක ස්ථාවර හා විචල්‍ය පිරිවැය හැසිරෙන ආකාරය පිළිබඳ ප්‍රායෝගික උදාහරණ යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම වඩාත් යෝග්‍ය වනු ඇත.

11වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වන 3වන වරණය තෝරාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 38.27%ක් වන අතර 2වන වරණය තෝරාගත් ප්‍රතිශතය ද 26.37%ක සැලකිය යුතු ප්‍රමාණයකි. මෙයට හේතුව විය හැක්කේ බොහොමයක් සිසුන් ණයගැති සැසඳුම් ලේඛනය සකස් කිරීමට පුරුදුව ඇත්තේ ණයගැති පාලන ගිණුමේ සංශෝධිත ශේෂයෙන් වීම බව කිව හැකිය. එනම් පාලන ගිණුමේ නිවැරදි කිරීමට පෙර ශේෂයෙන්, ණයගැති සැසඳුම් සකස් කිරීමට උත්සාහ කිරීමේදී මතු වූ ගැටළු මෙයට හේතු වූ බවයි. එමනිසා ණයගැති පාලන ගිණුමේ සංශෝධිත ශේෂයෙන් මෙන්ම, සංශෝධනයට පෙර ශේෂයෙන් ද ආරම්භ කර ණයගැති සැසඳුම් සකස් කර ශේෂ ලැයිස්තුවේ එකතුව සෙවීමට හුරු කරවීම වඩා වැදගත් වනු ඇත.

17වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වන 3වන වරණය තෝරාගෙන තිබූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 38.27%ක් වන අතර වරණ අංක 2 පිළිතුර ලෙස ලබාගත් ප්‍රතිශතය 21.90%ක සැළකිය යුතු සංඛ්‍යාවකි. වරණ අංක 2 තෝරාගත් අපේක්ෂකයන් පළමු වර්ෂය අවසානයේ කල්බදු වගකීම ලෙස ලබාගෙන ඇත්තේ සාධාරණ අගයෙන් මූලික ගෙවීම අඩුකළ අගයයි. එහිදී පළමු වර්ෂයේ පොළිය එකතු කිරීම සහ ගෙවන ලද පළමු වාරිකය අඩුකර නොමැත. එමෙන් ම දෙවන වාරිකය තුළ ඇතුළත් පොළිය ලෙස ලබාගෙන ඇත්තේ පළමු වාරිකය සඳහා ශිෂ්‍යයා ගණනය කර ලබාගත් පොලිය වේ. ඒ අනුව කල්බදු වගකීමෙහි ජංගම සහ ජංගම නොවන වටිනාකම් සෙවීම පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලැබෙන පරිදි අභ්‍යාස යොදා ගැනීම වැදගත් වනු ඇත.

ප්‍රශ්න අංක 08 සඳහා නිවැරදි පිළිතුර වූ 5වන වරණය තෝරාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 39.63%කි. 3වන වරණය තෝරාගත් සංඛ්‍යාව 18.30%ක් හා 4වන වරණය තෝරාගත් සංඛ්‍යාව 19.20%ක් වී ඇත. නිවැරදි වරණය තෝරා ගැනීමට අපොහොසත් වී ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති නිසා වීම බව කිව හැකිය. ඒ අනුව සංකල්පනාත්මක රාමුව පිළිබඳ ව අවබෝධයක් ලැබෙන පරිදි සිසුන්ට මගපෙන්වීම වැදගත් වනු ඇත.

9වන ප්‍රශ්නය තුළින් අපේක්ෂා කර ඇත්තේ මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අදාළ කරුණු භාවිතය සම්බන්ධයෙනි. ඊට අදාළ නිවැරදි පිළිතුර වන 2 වරණය තෝරාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 39.83%කි. මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ලෙස 4වන වරණය තෝරාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 20%කි. සංකල්පනාත්මක රාමුවේ ඇතුළත් කරුණු පිළිබඳ දැනුම බොහෝ සිසුන්ට ඇතත් භාවිතය, විශ්ලේෂණය වැනි ඉහළ හැකියාවන් අත්පත් කර ගැනීමට අපොහොසත් වී ඇති බව පෙනේ. ඒ අනුව න්‍යායාත්මක කරුණු ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳ ව සිසු අවධානය යොමු කරවීම වැදගත් බව කිව හැකිය.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය

| ප්‍රශ්න අංකය | ලකුණු ලබාගත් ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|
| | ලකුණු 0 | ලකුණු 1 | ලකුණු 2 | ලකුණු 3 | ලකුණු 4 | කිසිදු පිළිතුරක් සපයා නොමැත |
| 31 | 0.47 | 8.1 | 17.6 | 39.63 | 33.6 | 0.6 |
| 32 | 40.87 | - | 33.1 | - | 16.5 | 9.53 |
| 33 | 9.17 | 21.27 | 6.27 | 9.27 | 50.5 | 3.53 |
| 34 | 3.6 | 7.67 | 17.9 | 39.2 | 31.17 | 0.47 |
| 35 | 44.63 | - | 25.2 | - | 24.7 | 5.47 |
| 36 | 32.67 | - | 10.73 | - | 49.27 | 7.33 |
| 37 | 18.2 | 28.2 | 22.33 | 15.3 | 12.57 | 3.4 |
| 38 | 31.83 | 6.27 | 9.37 | 16.27 | 28.97 | 7.3 |
| 39 | 43.27 | - | - | - | 45.43 | 11.3 |
| 40 | 38.93 | 1.3 | 23.03 | 3.23 | 20.53 | 12.97 |
| 41 | 43.43 | 4.83 | 14.57 | 10.9 | 12.03 | 14.23 |
| 42 | 41.37 | 9.53 | 15.97 | 0.6 | 13.07 | 19.47 |
| 43 | 48.87 | - | 20.5 | - | 11.17 | 19.47 |
| 44 | 3.97 | 3.57 | 16.83 | 21.67 | 50.93 | 3.03 |
| 45 | 28.33 | 3.6 | 11.5 | 17.03 | 22.97 | 16.57 |
| 46 | 5.93 | 6.37 | 26.9 | 19.43 | 39.7 | 1.67 |
| 47 | 2.1 | 6.3 | 24.07 | 47.43 | 18.47 | 1.63 |
| 48 | 54.53 | - | 6.77 | - | 25.97 | 12.73 |
| 49 | 27.33 | 6.73 | 15.3 | 1.37 | 34.87 | 14.4 |
| 50 | 36.9 | - | 47 | - | 3.6 | 12.5 |

වගුව 06

ඉහත වගු අංක 06 මගින් පෙන්නුම් කෙරෙන්නේ ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරයයි. ඒ අනුව ප්‍රශ්න අංක 31, 34 සහ 44 යන ප්‍රශ්න සඳහා අපේක්ෂකයින්ගෙන් 70% කට වැඩි ප්‍රතිශතයක් ලකුණු 3 හෝ 4 ලබාගෙන සාර්ථක ව පිළිතුරු සපයා ඇත. ඒවායින් පිරික්සා ඇත්තේ ගිණුම්කරණය පිළිබඳ මූලික දැනුම, ගිණුම් වර්ගීකරණය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ මූලික දැනුමයි.

ප්‍රශ්න අංක 32, 35, 39, 40, 41, 42, 43 හා 48 සඳහා කිසිදු ලකුණක් නොලැබූ අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 50% ඉක්මවා ඇත. මෙයින් 42, 43 සහ 48 යන ප්‍රශ්න සඳහා කිසිදු ලකුණක් නොලැබූ ප්‍රතිශතය 60% ඉක්මවා ඇත.

මෙම ප්‍රශ්න අතුරෙන් 43 ප්‍රශ්නයෙහි කිසිදු ලකුණක් නොලැබූ ප්‍රතිශතය 68.34%කි. මෙයින් පිරික්සා ඇත්තේ මූල්‍ය ප්‍රකාශනවල සංරචකයන් භාවිතයයි. මෙහිදී බොහෝ සිසුන් සංරචකයන් ලෙස මූලාකාංග ඉදිරිපත් කර තිබූ අතර තවත් බොහොමයක් L K A S 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතය පිළිබඳ ව අවබෝධයක් නොමැතිව පිළිතුරු සපයා ඇති බව පෙනී යයි.

ප්‍රශ්න අංක 48හි කිසිදු ලකුණක් නොලැබූ ප්‍රතිශතය 67.26%කි. කළමනාකරණ ගිණුම්කරණයේ ආර්ථික ඇනවුම් ප්‍රමාණය සම්බන්ධව දැනුම මෙමගින් පිරික්සා ඇත.

ප්‍රශ්න අංක 42ට කිසිදු ලකුණක් නොලැබූ ප්‍රතිශතය 60.84%කි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතය පිළිබඳ ව මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරනු ලැබ ඇත.

කිසිදු ලකුණක් නොලැබූ ප්‍රතිශතය පිළිවෙළින් 51.9% සහ 57.66%ක් වන ප්‍රශ්න අංක 40 සහ 41 මගින් පිරික්සා ඇත්තේ හවුල් ව්‍යාපාර ගිණුම්කරණය පිළිබඳ ව දැනුම සහ භාවිතයයි. මෙයින්ද 40 වන ප්‍රශ්නයෙන් විමසනු ලැබ ඇත්තේ හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ශේෂ නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්ය. බොහෝ අපේක්ෂකයින් කටපාඩම් කිරීමේ ක්‍රමයට ජංගම හා ප්‍රාග්ධන ගිණුම්වල සටහන් තබන බවත්, ද්විත්ව සටහන් පිළිබඳ ව අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවන බවත්, කීර්තිනාමය පිළිබඳ ගැලපුම් සම්බන්ධ අවබෝධය මද බවත් මෙම ලකුණු අඩුවීමට හේතු ලෙස නිගමනය කළ හැකිය.

කිසිදු ලකුණක් නොලැබූ ප්‍රතිශතය 54.57% වන 39 ප්‍රශ්නය මගින් පිරික්සා ඇත්තේ ලාභ අපේක්ෂා නොකරන සංවිධානයක සාමාජික මුදල් ගිණුම්කරණය කරන ආකාරයයි. බොහෝ අපේක්ෂකයින් මෙම මාතෘකාව සම්බන්ධ ගැටළු මගහරින ආකාරයක් දක්නට ලැබෙන බැවින් මූලික දැනුම ලැබෙන ආකාරයට සරල අභ්‍යාස යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් බව කිව හැකිය.

ඒ අනුව න්‍යායාත්මක දැනුම භාවිතයට යොදා ගැනීමේ දුර්වලතාව, ගිණුම්කරණය පිළිබඳ තිබිය යුතු මූලික දැනුම නොසලකා හැරීම, ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ ව දැනුම සහ භාවිතය ප්‍රමාණවත් නොවීම සහ ප්‍රශ්න කියවා නිසි පරිදි අවබෝධ කරගෙන නොමැති වීම ආදිය කිසිදු ලකුණක් ලබා නොගැනීමට හේතු විය හැකිය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් යුක්තය. පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර ඒ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි. සෙසු ප්‍රශ්න 5 න් 4 ක් තෝරා ගත යුතු අතර එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60කි. මුළු ලකුණු 100 කි.

අවසාන ලකුණු ගණනය කිරීම : I පත්‍රය 100
II පත්‍රය 100
අවසාන ලකුණු 200 ÷ 2 = 100

* පිළිතුරු පත් ඇගයීමේ දී සෑම ප්‍රශ්නයකම ලකුණු දෙගුණ කර ලබා දෙනු ඇත.
ඒ අනුව අවසාන ලකුණු ගණනය කිරීම :
I පත්‍රය 200
II පත්‍රය 200
අවසාන ලකුණු 400 ÷ 4 = 100

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

| |
|---|
| II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 2, 3 සහ 4, ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත. |

II පත්‍රය

01 ප්‍රශ්නය

**1.** සීමිත හිරුක පොදු සමාගම සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක නිරත වේ. 2018.03.31 දිනට එහි ශේෂ පිරික්සුම පහත දී ඇත.

| **විස්තරය** | **හර (රු. '000)** | **බැර (රු. '000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 65 500 | |
| ගැනුම් | 41 850 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 22 600 | |
| 2017.04.01 දිනට තොගය | 9 750 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 250 | |
| පරිපාලන වියදම් | 7 100 | |
| බෙදාහැරීමේ පිරිවැය | 9 850 | |
| ගෙවූ ආදායම් බදු | 1 100 | |
| විකුණුම් | | 83 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 12 500 |
| 2017.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | | 670 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 35 000 |
| 2017.04.01 දිනට ඉඩම මත ප්‍රත්‍යාගණන සංචිත | | 5 000 |
| 2017.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 6 880 |
| උපචිත පරිපාලන වියදම් | | 250 |
| බැංකු ණය | | 12 000 |
| 2017.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන (2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා) | | 450 |
| කොමිස් ආදායම් | | 3 250 |
| | **159 000** | **159 000** |

**අතිරේක තොරතුරු:**

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත සඳහන් ගැළපීම් කළ යුතු වේ.

(i) තොගය වර්ග තුනකින් සමන්විත වන අතර 2018.03.31 දිනට ඒවායේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි විය.

| **වර්ගය** | **පිරිවැය (රු.'000)** | **ශුද්ධ උපලබ්ධි අගය (රු.'000)** |
|---|---|---|
| කිරි | 4 200 | 4 400 |
| හාල් | 2 500 | 2 100 |
| සීනි | 3 800 | 3 900 |
| **එකතුව** | **10 500** | **10 400** |

(ii) ප්‍රවර්තන වර්ෂය සඳහා පරිපාලන වියදම් පහත අයිතමවලින් සමන්විත වේ.

| **අයිතමය** | **රු.'000** |
|---|---|
| ගෙවූ වැටුප්........................................ | 2 700 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) | 90 |
| අධ්‍යක්ෂ ගාස්තු ................................... | 1 500 |
| විගණන ගාස්තු .................................... | 610 |
| ක්ෂය වියදම් ........................................ | 2 200 |
| **එකතුව** | **7 100** |

(iii) පරිපාලන වියදම්හි අඩංගු වැටුප් නිරූපණය කරනුයේ සේවකයන්ට ගෙවූ ශුද්ධ වැටුප ය. ශුද්ධ වැටුප ගණනය කර ඇත්තේ සේවක අර්ථසාධක අරමුදලට කරනු ලබන සේවක දායකය අඩු කිරීමෙන් පසුව ය. සේවක අර්ථසාධක අරමුදලට, සේව්‍ය සහ සේවක දායකයන් පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ. කෙසේ වුව ද සේවක අර්ථසාධක අරමුදලට, ප්‍රවර්තන වර්ෂය සඳහා සේව්‍ය සහ සේවක දායකත්වයන් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවා නොමැති අතර එය ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(iv) 2018.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය පහත පරිදි විය.

| **විස්තරය** | **පිරිවැය මත වාර්ෂික ක්ෂය අනුපාතය** | **පිරිවැය/ප්‍රත්‍යාගණිත අගය (රු.'000)** | **සමුච්චිත ක්ෂය (රු.'000)** | **ධාරණ වටිනාකම (රු.'000)** |
|---|---|---|---|---|
| ඉඩම | – | 25 500 | – | 25 500 |
| ගොඩනැගිලි | 5% | 28 000 | 8 000 | 20 000 |
| මෝටර් රථ | 20% | 16 500 | 4 500 | 12 000 |
| කාර්යාල උපකරණ | 10% | 10 000 | 2 000 | 8 000 |
| **එකතුව** | | **80 000** | **14 500** | **65 500** |

(v) භාණ්ඩ බෙදාහැරීම සඳහා මෝටර් රථ භාවිත කරන අතර අනෙකුත් සියළුම දේපළ, පිරියත සහ උපකරණ අයිතම පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ. ක්ෂය කළ හැකි සියළු වත්කම්, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කෙරේ. ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය වෙන් කර ඇත.

(vi) ව්‍යාපාරයේ ඉඩම 2015.03.31 දින ප්‍රථම වරට රු. 25 500 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2018.03.31 දින රු. 19 500 000 කට ඉඩම දෙවන වරට ප්‍රත්‍යාගණනය කර ඇති අතර එය මෙතෙක් ගිණුම්ගත කර නොමැත.

(vii) රු. 4 000 000 ක් පිරිවැය වූ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම 2018.03.31 දින අවසන් කරන ලද අතර නව ගොඩනැගිල්ලට අදාළ ගැළපුම් නිසි පරිදි ගිණුම්ගත කර ඇත.

(viii) පිරිවැය රු. 2 500 000 ක් වූ මෝටර් රථයක් 2018.03.31 දින රු. 1 500 000 කට විකුණන ලදී. මෙම මෝටර් රථය, 2016.10.01 දින මිල දී ගන්නා ලදී. මෙම විකිණීම නිසි පරිදි ගිණුම්ගත කර ඇති අතර මෝටර් රථය විකිණීමෙන් ලද අලාභය, බෙදාහැරීමේ පිරිවැය යටතේ සටහන් කර ඇත.

(ix) වර්ෂය තුළදී වෙනත් කිසිදු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් හෝ ඉවත් කිරීම් හෝ නොවී ය.

(x) වසරක වගකීම් සහතික කාලයක් සහිතව සමාගම භාණ්ඩ විකුණනු ලබයි. පසුගිය වර්ෂය තුළ කරන ලද විකුණුම් සඳහා ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම විසින් වගකීම් සහතික වියදම් ලෙස රු. 450 000 ක් ගෙවා ඇත. මෙය ප්‍රවර්තන වර්ෂයේ බෙදාහැරීමේ පිරිවැය යටතේ ඇතුළත් කර ඇත. 2018.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන ලෙස රු. 750 000 ක් ඇස්තමේන්තු කර ඇත.

(xi) බැංකු ණය 2018.03.31 දින ලබාගත් අතර එය 2019.03.31 දිනෙන් ආරම්භ වී රු. 3 580 000 බැගින් වූ වාර්ෂික වාරික 5 කින් ගෙවනු ලැබේ. වාර්ෂික ණය පොලී අනුපාතය 15% ක් වේ.

(xii) පෙර වර්ෂය සඳහා ගෙවූ රු. 350 000 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා කළ ගෙවීම්, ගෙවූ ආදායම් බදු තුළ අන්තර්ගත වේ. ප්‍රවර්තන වර්ෂයේ අවසාන කාර්තුව සඳහා ආදායම් බදු වගකීම රු. 400 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය මූල්‍ය ප්‍රකාශනවල ගැළපිය යුතු වේ.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත හිරුක පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2018.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(මුළු ලකුණු 20 යි)**

## පිළිතුර

**ප්‍රශ්න අංක 01**

සීමිත හිරුක පොදු සමාගම

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (01)

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | සටහන් | රු'. 000 | |
|---|---|---|---|
| විකුණුම් | | 83 000 | |
| විකුණුම් පිරිවැය | | (41 100) | (02) |
| දළ ලාභය | (01) | 41 900 | |
| වෙනත් ආදායම් | 1 | 3 250 | (01) |
| බෙදාහැරීමේ පිරිවැය | | (9 680) | (03) |
| පරිපාලන වියදම් | | (7 850) | (02) |
| වෙනත් වියදම් | | (1 650) | (03) |
| මූල්‍ය පිරිවැය | | - | |
| බදු පෙර ලාභය | 2 | 25 970 | |
| ආදායම් බදු | 3 | (1 050) | (02) |
| කාලච්ඡේදයේ ලාභය | | 24 920 | |
| **<u>වෙනත් විස්තීරණ ආදායම්</u>** | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම | | (5 000) | (01) |
| මුළු විස්තීරණ ආදායම | (01) | 19 920 | |

**<u>සටහන් 01</u> :** වෙනත් ආදායම්

| | රු. ' 000 |
|---|---|
| කොමිස් ආදායම | 3 250 |

**<u>සටහන් 02</u> :** බදුපෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම් ද අඩු කිරීමෙන් පසුවය.

| | රු' 000 |
|---|---|
| තොග කපාහැරීම | 400 |
| E P F වියදම | 450 |
| E T F වියදම | 90 |
| ක්ෂය (1200 + 3800 + 1000) | 6 000 |
| ඉඩම් ප්‍රත්‍යාගණන අලාභය | 1 000 |
| මෝටර් රථ විකිණීමේ අලාභය | 250 |
| වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | 530 |
| අධ්‍යක්ෂ ගාස්තු | 1 500 |
| විගණන ගාස්තු | 610 |

***(ඕනෑම අයිතම දෙකකට 01 බැගින් ලකුණු 02)* (ලද අගයට)** ***(ලකුණු 19)***

**<u>සටහන් 03</u> :** ආදායම් බදු

| | රු' 000 | |
|---|---|---|
| ප්‍රවර්ථන වර්ෂය සඳහා වෙන් කිරීම | 1 150 | 01 |
| පසුගිය වර්ෂය සඳහා අධි වෙන් කිරීම | <u>(100)</u> | 01 |
| | <u>1 050</u> | |

**<u>පෙර වැඩ</u>** රු' 000

| **<u>විකුණුම් පිරිවැය</u>** | | **<u>බෙදාහැරීමේ පිරිවැය</u>** | |
|---|---|---|---|
| 2017.04.01 තොගය | 9 750 } 01 | බෙදාහැරීමේ පිරිවැය | 9 850 |
| ගැනුම් | 41 850 } | මෝටර් රථ ඉවත් කිරීමේ අලාභය | (250) 01 |
| 2018.03.31 තොගය | <u>(10 500)</u> 01 | වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | 01 530 }/80 02 |
| | <u>41 100</u> | වගකීම් සහතික වියදම | 01 (450) } |
| | | | <u>9 680</u> |
| **<u>පරිපාලන වියදම්</u>** | | **<u>වෙනත් වියදම්</u>** | |
| පරිපාලන වියදම් | 7 100 | තොග කපා හැරීම | 400 01 |
| වැටුප් | 3000/300 01 | ඉඩම් ප්‍රත්‍යාගණන අලාභය | 1 000 01 |
| EPF වියදම් | <u>(450)</u> 01 | මෝටර් රථ ඉවත් කිරීමේ අලාභය | <u>250</u> 01 |
| | <u>7 850</u> | | <u>1 650</u> |

**(2)** සීමිත හිරුක පොදු සමාගම

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය (රු' 000)

| විස්තරය | ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් | ප්‍රත්‍යාගණන සංචිතය | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|
| 2017.04.01 දිනට ශේෂ | 35 000 | 5 000 | 6 880 | 46 880 |
| මුළු විස්තීරණ ආදායම | | (01) (5 000) | (01) 24 920 | 19 920 |
| 2018.03.31 දිනට ශේෂ | <u>35 000</u> | (ලද අගයට) | <u>31 800</u> | <u>66 800</u> |

**වෙනම තිබුණත් ලකුණු දෙන්න.**

**(ලකුණු 02**

(3) සීමිත හිරුක පොදු සමාගම
2018.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය } (01)

| | සටහන් | රු' 000 | රු' 000 |
|---|---|---|---|
| **<u>ජංගම නොවන වත්කම්</u>** | | | (01) 59 500 |
| දේපළ, පිරියත සහ උපකරණ | 4 | | |
| **<u>ජංගම වත්කම්</u>** | | | |
| තොගය | | 10 100 (01) | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | 22 600• | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 1 250• | 33 950 |
| **මුළු වත්කම්** | | | **93 450** |
| **<u>හිමිකම්</u>** | | | |
| **<u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u>** | | | |
| සාමාන්‍ය කොටස් | | | 35 000• |
| **<u>සංචිත</u>** | | | |
| රඳවාගත් ඉපැයුම් | | | •31 800 |
| **<u>ජංගම නොවන වගකීම්</u>** | | | |
| බැංකු ණය | | | 10 220 (01) |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 12 500• | |
| බැංකු ණය | | 1 780 (01) | |
| ගෙවිය යුතු ආදායම් බදු | | 400 (01) | |
| වෙනත් ගෙවිය යුතු දෑ | | 1 750 (03) | 16 430 |
| **මුළු හිමිකම සහ වගකීම්** | | | 93 450 |

***(•ඉතිරි අයිතම දෙකටම 01 බැගින් උපරිම ලකුණු 02 )***

**සටහන 04 - දේපළ, පිරියත සහ උපකරණ** **(රු' 000)**

| | ඉඩම | ගොඩ-නැගිලි | මෝටර් රථ | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|
| **<u>පිරිවැය</u>** | | (01) | (01) | | |
| 2017.04.01 දිනට ශේෂය | 25 500 | 24 000 | 19 000 | 10 000 | 78 500 |
| ප්‍රත්‍යාගණනය | (6 000) (01) | | | | (6 000) |
| එකතු කිරීම් | | 4 000 (01) | | | 4 000 |
| ඉවත් කිරීම් | | | (2 500) (01) | | (2 500) |
| 2018.03.31 දිනට ශේෂය | 19 500 | 28 000 | 16 500 | 10 000 | 74 000 |
| **<u>සමුච්චිත ක්ෂය</u>** | | | | | |
| 2017.04.01 දිනට ශේෂය | - | 6 800 | 1 450 | 1 000 | 9 250 |
| කාලච්ඡේදයේ ක්ෂය | - | 1 200 | 3 800 | 1 000 (02) | 6 000 |
| ක්ෂය ඉවත් කිරීම | | | (750) (01) | | (750) |
| 2018.03.31 දිනට ශේෂය | - | 8 000 | 4 500 | 2 000 | 14 500 |
| 2018.03.31 දිනට ධාරණ වටිනාකම | 19 500 | 20 000 | 12 000 | 8 000 | 59 500 |

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.

1 ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතා සුළු පිරිසක් හැර අනෙකුත් අපේක්ෂකයින් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 9%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 9%ක් වන අතර, අපේක්ෂකයින්ගෙන් 35%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ ඊට වඩා අඩු ප්‍රමාණයකි. ලකුණු 20කට වඩා ලබාගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 33%කි.




මෙම ප්‍රශ්නයේ කොටස් 3ක් ඇති අතර කොටස් තුනෙහිම පහසුතාව 50%ට වඩා අඩුය. පහසුතාව අඩුම කොටස (3) වී ඇති අතර, එහි පහසුතාව 38%කි. වැඩිම පහසුතාව සහිත අනුකොටස (2) වී ඇති අතර, එහි පහසුතාව 49%කි.

පළමු ප්‍රශ්නයේ 1 කොටස මගින් පරීක්ෂා කරන ලද්දේ LKAS I ට අදාළ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සකස් කිරීමේ හැකියාව සම්බන්ධවයි. මෙම කොටසේ පහසුතාව 46%කි. මෙයට පිළිතුරු සැපයීමේ දී සමස්තයක් ලෙස දැකිය හැකි දුර්වලතා ලෙස, ගිණුම්කරණ ප්‍රමිත අංක 2ට අදාළ ව අයිතම් ක්‍රමයට අවසාන තොග ගණනය කිරීමට නොහැකි වීම, දළ වැටුප හා ඊට අදාළ (EPF) සේවක අර්ථසාධක අරමුදල් දායකය වාර්තා නොකිරීම, ප්‍රමිත අංක 16ට අදාළ ව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය, පසු කාලීන පිරිවැය වාර්තා කිරීම, ආරම්භක සමුච්චිත ක්ෂය වටිනාකම නිවැරදිව නොදැක්වීම, වත්කම් විකිණීමට අදාළ ගනුදෙනු සටහන් නොකිරීම, වගකීම් සහතික වෙන් කිරීමට අදාළ තොරතුරුවලින් නිවැරදි පිළිතුර ලබා නොගැනීම, ණය පොලී හා ආදායම් බදු ගණනය කිරීම නිවැරදි ව හඳුනා නොගැනීම දැක්විය හැක.

පළමු ප්‍රශ්නයේ 2 කොටස මගින් අපේක්ෂා කරන්නේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සකස් කිරීමේ හැකියාවයි. මෙහි පහසුතාව 49%කි. මෙම කොටසට පිළිතුරු සැපයීමේ දී මුළු විස්තීර්ණ ආදායම හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයට නිවැරදි ව ගෙන ඒමේ දුර්වලතාවයක් දක්නට ලැබුණි.

පළමු ප්‍රශ්නයේ 3 කොටසට 38%ක් වූ පහසුතාවක් පෙන්නුම් කර ඇත. මෙම කොටස මගින් මූල්‍ය තත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමට අදාළ දැනුම පරීක්ෂා කර ඇත. මෙම කොටසට පිළිතුරු ලිවීමේ දී පහත දුර්වලතා දක්නට ලැබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු සමාගමේ නම සහ නියමිත දිනය නොදැක්වීම, දේපල පිරියත හා උපකරණ ලේඛනයෙන් ලබාගෙන දැක්විය යුතු ධාරණ අගය වෙනුවට දේපල වර්ගීකරණය, සමුච්චිත ක්ෂය, ධාරණ අගය මුහුණතෙහි දැක්වීම උපචිත ආදායම් බදු වාර්තා නොකිරීම, වෙනත් ගෙවිය යුතු ඇවලට අදාළ EPF, වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන නිවැරදි ව හඳුනා නොගැනීම, බැංකු ණය සම්බන්ධව ජංගම හා ජංගම නොවන වර්ගීකරණය ද හඳුනා නොගැනීම ආදිය දැක්විය හැකිය.

02 ප්‍රශ්නය

**2.** **(අ)** අමල්, බිමල් සහ චමල් හවුල් ව්‍යාපාරය නිෂ්පාදන ව්‍යාපාරයක නිරත වේ. 2017.03.31 දිනට එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| **තොගය:** | |
| අමුද්‍රව්‍ය | 600 |
| නොනිමි (නිෂ්පාදන පිරිවැයට අගය කළ) | 800 |
| නිමි භාණ්ඩ | 1 200 |
| **ප්‍රාග්ධන ගිණුම්:** | |
| අමල් | 10 000 |
| බිමල් | 6 000 |
| චමල් | 4 000 |
| **ජංගම ගිණුම්:** | |
| අමල් | 1 200 |
| බිමල් | 1 000 |
| චමල් | 600 |
| ණය ගිණුම - අමල් | 4 000 |

**අතිරේක තොරතුරු:**

(i) හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි කොන්දේසි පහත පරිදි වේ:
- අමල්, බිමල් සහ චමල් පිළිවෙළින් 5:3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනී.
- ප්‍රාග්ධන ගිණුම්වල ආරම්භක ශේෂ මත 10% ක වාර්ෂික පොලියක් හවුල්කරුවන්ට හිමි වේ.
- හවුල්කරුවන් විසින් සපයන ණය සඳහා 12% ක වාර්ෂික පොලියක් හිමි වේ.

(ii) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 1 400 |
| සෘජු වේතන | 700 |
| පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් | 2 350 |
| මූල්‍ය වියදම් | 350 |
| විකුණුම් | 9 700 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 300 |

(iii) 2018.03.31 දිනට තොග:

| | රු.'000 |
|---|---|
| අමුද්‍රව්‍ය | 1 000 |
| නොනිමි (නිෂ්පාදන පිරිවැයට අගය කළ) | 600 |
| නිමි භාණ්ඩ | 1 500 |

(iv) අමල්ගේ ණය සඳහා පොලිය ගෙවා නොමැති අතර ඒ සඳහා කිසිදු සටහනක් පොත්වල තබා නොමැත.

(v) කර්මාන්තශාලාවෙහි කළමනාකරු ලෙස සේවය කිරීම වෙනුවෙන් චමල්ට රු. 10 000 ක මාසික වේතනයක් ගෙවනු ලැබේ. චමල්ට මාස 10 ක් සඳහා ගෙවන ලද වැටුප, නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය තුළ ඇතුළත් කර ඇත. ඉතිරි කාලච්ඡේදය සඳහා වැටුප් ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(vi) ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය රු. 1 400 000 ක් වන අතර එය පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් යටතේ ගිණුම්ගත කර ඇත. මෙම වටිනාකම කර්මාන්තශාලාව සහ පරිපාලන කාර්යාලය අතර සමානව බෙදාහැරිය යුතු වේ.

(vii) අසනීප තත්ත්වයක් නිසා 2018.03.31 දින සිට බිමල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. එදිනට ඔහුගේ කීර්තිනාම කොටස රු. 2 100 000 ක් ලෙස ඇස්තමේන්තු කර ගිණුම්ගත කර ඇත. ඔහුට ගෙවිය යුතු මුදලින් රු. 3 000 000 ක් වෛද්‍ය ප්‍රතිකාර සඳහා විශ්‍රාම යාමේදී ගෙවූ අතර ඉතිරි මුදල ණය ගිණුමකට මාරු කරන ලදී. අමල් සහ චමල් පිළිවෙළින් 5:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය.

**අවශ්‍යවන්නේ:**

(1) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අමල්, බිමල් සහ චමල් හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද සහිතව)

(2) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

(3) බිමල්ගේ ණය ගිණුම

**(ලකුණු 10 යි)**

**(ආ)** පලතුරු බීම සැකසුම් සමාගමක් වර්ග දෙකක පලතුරු බීම (අඹ සහ අන්නාසි) නිෂ්පාදනය කරනු ලබයි. **සැකසුම්** සහ **බෝතල් කිරීම්** යන නිෂ්පාදන අංශ දෙකකින් සමන්විත කර්මාන්තශාලාවක් සහ සේවා අංශයක් වන **ගබඩාවක්** මෙම සමාගම සතු වේ. කර්මාන්තශාලාව සහ ගබඩාව වෙන් වෙන් ගොඩනැගිලිවල පිහිටා ඇත.

වසරක කාලයක් සඳහා ඒකක 50 000 ක ක්‍රියාකාරී මට්ටමේදී අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

| **විස්තරය** | **කර්මාන්තශාලාව** | **ගබඩාව** | **එකතුව** |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| කුලී | 180 000 | 50 000 | 230 000 |
| වක්‍ර වේතන | ? | ? | 400 000 |
| විදුලි වියදම් | 120 000 | 30 000 | 150 000 |
| යන්ත්‍ර රක්ෂණ | 90 000 | 20 000 | 110 000 |
| ගොඩනැගිලි සඳහා වරිපණම් | 90 000 | 30 000 | 120 000 |
| ආරක්ෂක සේවා සඳහා ගාස්තු | ? | ? | 360 000 |

| **විස්තරය** | **සැකසුම්** | **බෝතල් කිරීම්** | **ගබඩාව** |
|---|---|---|---|
| වක්‍ර සේවක සංඛ්‍යාව | 10 | 15 | 15 |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර්) | 12 000 | 18 000 | 8 000 |
| නිෂ්පාදන යන්ත්‍ර පිරිවැය (රු.) | 400 000 | 200 000 | – |
| සිසිල්කරණ යන්ත්‍රයේ පිරිවැය (රු.) | – | – | 250 000 |
| කාලච්ඡේදය සඳහා යන්ත්‍ර පැය | 100 000 | 65 000 | – |
| ආරක්ෂක සේවක සංඛ්‍යාව | 2 | 2 | 8 |
| කාලච්ඡේදය සඳහා මුළු කිලෝවොට් පැය | 3 000 | 2 000 | 1 000 |

**අතිරේක තොරතුරු:**

(i) නිෂ්පාදන යන්ත්‍ර සහ සිසිල්කරණ යන්ත්‍රය වාර්ෂිකව පිළිවෙළින් 10% සහ 8% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(ii) ගබඩාවෙහි මුළු පොදුකාර්ය පිරිවැය, නිෂ්පාදන යන්ත්‍රවල පිරිවැය මත **සැකසුම්** සහ **බෝතල් කිරීමේ** අංශ අතර නැවත විභජනය කරනු ලැබේ.

(iii) නිෂ්පාදන අංශවල පොදුකාර්ය පිරිවැය, යන්ත්‍ර පැය මත අන්තර්ග්‍රහණය කෙරේ.

(iv) පහත තොරතුරු අඹ බීම බෝතලයකට අදාළ වේ.

| **විස්තරය** | | **එක් බෝතලයක් සඳහා** |
|---|---|---|
| ගත කළ සත්‍ය කාලය: | සැකසුම් අංශය | මිනිත්තු 12 |
| | බෝතල් කිරීමේ අංශය | මිනිත්තු 6 |
| ඍජු පිරිවැය: | අමුද්‍රව්‍ය | රු. 6.40 |
| | ශ්‍රමය | රු. 5.00 |
| නිෂ්පාදන නොවන විචල්‍ය පොදුකාර්ය පිරිවැය | | රු. 4.00 |

(v) නිෂ්පාදන නොවන ස්ථාවර පොදුකාර්ය පිරිවැය රු. 300 000 කි.

(vi) එක් එක් භාණ්ඩයෙහි විකුණුම් මිල මත ලාභ ආන්තිකය 20% කි.

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (සේවා අංශයේ පොදුකාර්ය පිරිවැය නැවත විභජනය ද ඇතුළුව)

(2) සැකසුම් සහ බෝතල් කිරීමේ අංශ දෙක සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) අඹ බීම බෝතලයක නිෂ්පාදන පිරිවැය

(4) අඹ බීම බෝතලයක අයවැයගත විකුණුම් මිල

**(ලකුණු 10 යි)**
**(මුළු ලකුණු 20 යි)**

## පිළිතුර

**ප්‍රශ්න අංක 02**

(අ) (1) අමල්, බිමල්, සහ චමල් හවුල් ව්‍යාපාරය

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (රු' 000)

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | 9 700 | |
| විකුණුම් පිරිවැය | | 2 620 | (06) |
| දළ ලාභය | | 7 080 | |
| පරිපාලන හා බෙදාහැරීමේ පිරිවැය (2 350 - 700) [01] | 1 650 (01) | | |
| මූල්‍ය වියදම් (350 + 480) [01] | 830 (01) | (12 480) | |
| කාලච්ඡේදයේ ලාභය | | (01) 4 600 | |
| ප්‍රාග්ධන පොළී - අමල් | 1 000 | | |
| බිමල් | 600 | (01) | |
| චමල් | 400 | (2 000) | |
| ලාභ කොටස් - අමල් 5 (ලද ලාභය අනුපාතයට බෙදීම) (01) | 1 300 | | |
| බිමල් 3 | 780 | | |
| චමල් 2 | 520 | (2 600) | |

*(ලකුණු 11 )*

පෙර වැඩ

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය (රු’ 000)

| | | |
|---|---|---|
| 2017.04.01 අමුද්‍රව්‍ය තොගය | 600 | |
| අමුද්‍රව්‍ය ගැනුම් | 1400 | 02 |
| 2018.03.31 අමුද්‍රව්‍ය තොගය | (1 000) | |
| පාරිභෝජනය තුළ ද්‍රව්‍ය පිරිවැය | | 1 000 |
| සෘජු වේතන | | 700 |
| ප්‍රාථමික පිරිවැය හෝ 720 | | 1 700 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (300 + 20 + 700) 01 01 | | 1 020 02 |
| | | 2 720 |
| 2017.04.01 නොනිමි තොගය 200 + 120 + 700 (1) (1) | 800 | |
| 2018.03.31 නොනිමි තොගය | (600) 01 | 200 |
| මුළු නිෂ්පාදන පිරිවැය | | 2 920 |
| 2017.04.01 දිනට නිමි තොගය | | 1 200 |
| 2018.03.31 දිනට නිමි තොගය | | ( 1 500) 01 |
| විකුණුම් පිරිවැය | | 2 620 |

අ (2)

ප්‍රාග්ධන ගිණුම් (රු’ 000)

| | අමල් | බිමල් | චමල් | | අමල් | බිමල් | චමල් |
|---|---|---|---|---|---|---|---|
| කීර්තිනාමය 1500/ | 5 000 | - (01) | 600/2 000 | ශේෂය ඉ/ගෙ | 10 000 | 6 000 | 4 000 |
| මුදල් | | 3 000 (01) | | ජංගම ගිණුම- බිමල් | | 2 380 | |
| ණය ගිණුම - බිමල් | | 7 480 | | කීර්තිනාමය | 3 500 | 2 100 (01) | 1 400 |
| ශේෂය ප/ගෙ | 8 500 | | 3 400 | | | | |
| | 13 500 | 10 480 | 5 400 | | 13 500 | 10 480 | 5 400 |

මුදල් 3000 ණය ගිණුමේ තිබුණට ලකුණු නැත.

ජංගම ගිණුම් (රු’ 000)

| | අමල් | බිමල් | චමල් | | අමල් | කමල් | නිමල් |
|---|---|---|---|---|---|---|---|
| ගෙවූ වැටුප් | | | 100 | ශේෂය ඉ/ගෙ | 1 200 | 1 000 | 600 |
| ප්‍රාග්ධන ගිණුම -බිමල් | | 2 380 | | ප්‍රාග්ධන පොලී ලද | (01) 1 000 | 600 | 400 |
| | | - | | ලාභ කොටස් ලද | (01) 1 300 | 780 | 520 |
| | | | | ණය පොලී | 480 (01) | | |
| ශේෂය ප/ගෙ | 3 980 | | 1 540 | කළමණාකරු වේතන | | | 120 (01) |
| | 3 980 | 2 380 | 1 640 | | 3 980 | 2 380 | 1 640 |

*(ලකුණු 07 )*

(3) බිමල්ගේ ණය ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය පා/ගෙ | 7 480 | ප්‍රාග්ධන ගිණුම (02) | 7 480 |
| | 7 480 | ලද | 7 480 |

(ලකුණු 02)

(ආ) (1)

**පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව** (රු’ 000)

| අයිතමය | විභජන පදනම | එකතුව | නිෂ්පාදන අංශ | | සේවා අංශය |
|---|---|---|---|---|---|
| | | | සැකසුම් | බෝතල් කිරීම් | ගබඩාව |
| ගබඩා කුලී | සෘජු | 50 | | | 50 |
| ගබඩා විදුලි වියදම් | සෘජු | 30 | | | 30 |
| සිසිල්කරණ යන්ත්‍ර රක්ෂණය | සෘජු | 20 | | | 20 |
| ගබඩා වරිපනම් | සෘජු | 30 | | | 30 |
| සිසිල්කරණ යන්ත්‍ර ක්ෂය | සෘජු | 20 | | | 20 |
| කම්හල් කුලී | භූමි ප්‍රමාණය (2 :3) | 180 | 72 | 108 | |
| වක්‍ර වේතන | වක්‍ර සේවක සංඛ්‍යාව (2:3:3) | 400 | 100 | 150 | 150 |
| කම්හල් විදුලි වියදම් | කිලෝවොට් පැය (3:2) | 120 | 72 | 48 | |
| නිෂ්පාදන යන්ත්‍ර රක්ෂණය | යන්ත්‍ර පිරිවැය (2:1) | 90 | 60 | 30 | |
| කම්හල් වරිපනම් | භූමි ප්‍රමාණය (2:3) | 90 | 36 | 54 | |
| ආරක්ෂක සේවා ගාස්තු | ආරක්ෂක සේවක (1:1:4) | 360 | 60 | 60 | 240 |
| නිෂ්පාදන යන්ත්‍ර ක්ෂය | යන්ත්‍ර පිරිවැය (2:1) | 60 | 40 | 20 | නිවැරදි අගයන්ට |
| | | 1 450 | 440 | 470 | 540 |
| ගබඩා පොදුකාර්ය පිරිවැය නැවත විභජනය | යන්ත්‍ර පිරිවැය (2:1) | | (01) 360 | 180 | (540) |
| | | 1 450 | 800 | 650 | - |

(සෘජු අගයන් දෙකකට 01 බැගින් උපරිම ලකුණු 02)

(විභජන පදනම් දෙකකට 01 බැගින් ලකුණු 04)

(සෘජු ව අදාළ නොවන පොදු කාර්යය පිරිවැය, බෙදා හැරීම පේළි දෙකකට 01 බැගින් 03)

(නැවත විභජනයට 01)

**(ලකුණු 10)**

(2) පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත - සැකසුම් අංශය <u>යන්ත්‍ර පැයකට රු. 8</u> (02)

බෝතල් කිරීමේ අංශය <u>යන්ත්‍ර පැයකට රු. 10</u> (02)

**(ලකුණු 04)**

**<u>පෙරවැඩ</u>**

සැකසුම් අංශය [01] $\frac{800}{100}$ [01] = රු. 8

බෝතල් කිරීමේ අංශය [01] $\frac{650}{65}$ [01] = රු. 10

**(3)** අඹ බීම බෝතලයක නිෂ්පාදන පිරිවැය = රු. 14 (03)

| පෙරවැඩ | | | රු. |
|---|---|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | | | 6.40 } 01 |
| සෘජු ශ්‍රමය | | | 5.00 } |
| පොදු කාර්ය පිරිවැය - සැකසුම් | $8 \times \frac{12}{60} =$ | 01 | 1.60 |
| බෝතල් කිරීම් | $10 \times \frac{6}{60} =$ | 01 | 1.00 |
| | | | 14.00 |

**(ලකුණු 03)**

**(4)** අඹ බීම බෝතලයක අයවැයගත විකුණුම් මිල = රු. 30 (03)

| පෙරවැඩ | | | රු. |
|---|---|---|---|
| නිෂ්පාදන පිරිවැය | | 01 | 14 |
| නිෂ්පාදන නොවන විචල්‍ය පොදුකාර්ය පිරිවැය | | | 4 • } 01 |
| නිෂ්පාදන නොවන ස්ථාවර පොදුකාර්ය පිරිවැය | $\frac{300}{50}$ | | 6 • } |
| මුළු නිෂ්පාදන පිරිවැය | | | 24 |
| ලාභය | ලද | 01 | 6 |
| විකුණුම් මිල | | | 30 |

***(•පිළිතුරු දෙකෙන් එකක් වත් ඇත්නම් ලකුණු 01)***

විකුණුම් මිල = 02 $\frac{24}{80}$ (01) X 100 = රු. 30 **03**

**(ලකුණු 03)**

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.

2 ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයක් වුවද ඒ සඳහා පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 99%ක් පමණි.

ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 17%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා 31 හෝ 31ට වඩා ලකුණු ලබාගත් පිරිස අපේක්ෂකයින්ගෙන් 17%ක් පමණක් වන අතර, අපේක්ෂකයින් 31%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ ඊට අඩුවෙනි. මෙම ප්‍රශ්නය සඳහා වෙන් කළ ලකුණු ප්‍රමාණයෙන් ලකුණු 20කට වඩා ලකුණු ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 43%ක් විය.




අනුකොටස් 7කින් යුත් මෙම ප්‍රශ්නයේ පහසුතාව ඉහළ අගයක් නොගනී. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (1) වන අතර එහි පහසුතාව 57%කි. පහසුතාව අඩුම අනුකොටස (ආ) 4 වේ. එහි පහසුතාව 18%කි.

2වන ප්‍රශ්නයේ (අ) (1) කොටසෙහි පහසුතාව 47%කි. මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත්තේ නිෂ්පාදන හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම සම්බන්ධ දැනුම සහ අවබෝධයයි. බොහෝ අපේක්ෂකයින් නිෂ්පාදන පිරිවැය ලේඛනයෙහි ඇතුළත් විය යුතු කරුණු සහ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු කරුණු සියල්ල ආදායම් ප්‍රකාශනය තුළ ම දැක්වීමට උත්සාහ කිරීම හේතුවෙන් ඇති වූ සංකීර්ණ බව සහ වැරදි බව ලකුණු අඩුවීමට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැකිය. එමෙන් ම තවත් අපේක්ෂකයින් බොහොමයක් නිෂ්පාදන පිරිවැය නිවැරදි ව ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. නමුත් ප්‍රාග්ධන පොලී ගණනය හා හඳුනා ගැනීම බොහෝ දුරට නිවැරදි වූ අතර ලද ලාභය නිවැරදි අනුපාතයට බෙදීම ද සිදු කර තිබුණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානයේ දී ඒක පුද්ගල ව්‍යාපාරවල නිෂ්පාදන පිරිවැය පමණක් නොව අනෙකුත් ව්‍යාපාර සංවිධාන වර්ගවලට ද සම්බන්ධ කොට නිෂ්පාදන පිරිවැය සෙවීම හා ඒ සම්බන්ධව මතුවන හිමිකම් වෙනස්වීම් පිළිබඳ ව අභ්‍යාස යොදා ගැනීම වඩා යෝග්‍ය බව කිව හැකිය.

2වන ප්‍රශ්නයේ (අ) 2 කොටසේ පහසුතාව 56%කි. මෙමගින් පරීක්ෂා කර තිබුණේ හවුල් ව්‍යාපාරයක හිමිකම් ගිණුම්වල ගනුදෙනු සටහන් කිරීම පිළිබඳ ව දැනුම සහ අවබෝධයයි. මෙම කොටසේ දී කීර්තිනාමය ගැලපුම් කිරීම බොහෝ අපේක්ෂකයින් නිසි ලෙස සිදුකර නොතිබුණි. ප්‍රශ්නයෙහි සඳහන් කර ඇත්තේ ඉවත්ව යන හවුල්කරුගේ කීර්තිනාම කොටස පමණක් වන අතර එය මුළු කීර්තිනාමයට හරවා ගැනීමට අපොහොසත් වීම හෝ භුක්ති විඳින අනුපාතයට ගැලපීම සිදුකර නොතිබුණි. එමෙන් ම ජංගම ගිණුමේ කළමනාකරු වේතන සටහන් කිරීමේ දී, ගෙවූ වේතන හඳුනා නොගැනීම ද දුර්වලතාවය ලෙස දැක්විය හැකිය.

කීර්තිනාමය ගැලපුම් කිරීමේ දී, ඉවත් වන හෝ අළුතෙන් බැඳෙන හවුල්කරුගේ කීර්තිනාමය කොටස පමණක් ලබා දී ඇති විට එය මුළු කීර්තිනාමය බවට හරවා ගැලපුම් කිරීම කෙරෙහිත් හවුල් කරුවන්ගේ වේතන, ඔවුන්ට ප්‍රතිපූරණය කළ යුතු ගොඩනැගිලි කුලී සහ වෙනත් ඇවල දී ගෙවූ ප්‍රමාණයන් සැලකිල්ලට ගත යුතු බවත් අවධාරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් වන බව කිව යුතුය.

(අ) 3 කොටසෙන් අපේක්ෂා කර ඇත්තේ ඉවත්වන හවුල්කරුවෙකුගේ අයිතිය ණය ගිණුමකට මාරු කරන අවස්ථාවක් සටහන් කරන ආකාරය පිළිබඳ අවබෝධයයි. මෙහි පහසුතාව 47%කි. බොහෝ අපේක්ෂකයින් ඉවත් වන හවුල්කරුගේ ජංගම ගිණුමේ ශේෂය ප්‍රාග්ධන ගිණුමට හෝ ණය ගිණුමට මාරුකර නොතිබූ අතර ප්‍රාග්ධන ගිණුමෙන් ලද අගය නොමැතිව වෙනත් අගයන් ණය ගිණුමට මාරුකර තිබුණි.

2වන ප්‍රශ්නයේ (ආ) 1 කොටසේ පහසුතාව 57%ක් වන අතර මෙමගින් පරීක්ෂා කර තිබුණේ පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව සකස් කිරීම පිළිබඳ දැනුම සහ අවබෝධයයි. මෙය සකස් කිරීමේ දී සේවා අංශයට ඍජු ලෙස ප්‍රතිපාදනය විය යුතු පොදු කාර්ය පිරිවැය සහ විභජනය විය යුතු පොදු කාර්ය පිරිවැය පැහැදිලි ව හඳුනා ගැනීමට සහ සටහන් කිරීමට නොහැකි වීම විශේෂ දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය. එමෙන් ම සේවා අංශයේ පොදු කාර්ය පිරිවැය නැවත විභජනයේ දී අදාළ නිවැරදි අනුපාතය යොදා නොගැනීම ද දුර්වලතාවයකි.

(ආ) 2 කොටසේ පහසුතාව ද 53%ක් වූ අතර, ඉන් පිරික්සා තිබුණේ පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීම පිළිබඳව ය. ලද පොදු කාර්ය පිරිවැය අගයන්, දී ඇති යන්ත්‍ර පැය ගණන්වලින් නොබෙදා තිබීම හෝ එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමෙන් මගහැර තිබීම දක්නට ලැබුණි.

ආ (3) කොටසේ පහසුතාව ද 22%ක් වැනි අඩු ප්‍රමාණයකි. එයින් අපේක්ෂා කර තිබුණේ ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමයි. මෙහි දී පැයකට ලබාගත් පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත මිනිත්තු ගණනට හරවා ගැනීමට බොහෝ අපේක්ෂකයින් අපොහොසත් වීම ලකුණු අඩුවීමට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකිය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී ප්‍රායෝගික උදාහරණ සහිත අභ්‍යාස යොදා ගැනීමේ අවශ්‍යතාව නැවත නැවත අවධාරණය කළ යුතුය.

ආ (4) කොටසෙන් අපේක්ෂා කර ඇත්තේ ඒකකයක විකුණුම් මිල සෙවීම පිළිබඳ අවබෝධය පිරික්සීමයි. මෙහි දී පහසුතාව 18%ක් වැනි ඉතා අඩු අගයක් ගත් අතර බොහෝ අපේක්ෂකයින් මෙම කොටසට පිළිතුරු සපයා නොතිබුණි. පිළිතුරු සපයා තිබූ අපේක්ෂකයින් ද නිෂ්පාදන නොවන පොදු කාර්යය පිරිවැය ඇතුළත් කර නොතිබීම හා විකුණුම් මිල මත ලාභය ගණනය කර ගැනීමේ අංක ගණිතමය දුර්වලතා දක්වා තිබුණි. ඒ අනුව ඒකකයක මුළු පිරිවැය ගණනයේ දී නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය සැලකිල්ලට ගන්නා බව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවධාරණය විය යුතු අතර ලාභ ගණනයේ දී පිරිවැය මත මෙන්ම විකුණුම් මිල මත ද ලාභ ගණනය කිරීමේ අංක ගණිතමය නිපුණතාවයන් වර්ධනය කරගත යුතු බව සිසුන් අවබෝධ කර ගත යුතුය.

03 ප්‍රශ්නය

**3.** 2018.01.01 දින සමන් විසින් ලිපිද්‍රව්‍ය අලෙවි කරන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයෙහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලබයි. ව්‍යාපාරයේ කළමනාකරු ලෙස සමන් සේවය කරන අතර විකුණුම් සහ තොග පවත්වාගෙන යාම සඳහා සහාය වීමට සේවකයකු බඳවා ගන්නා ලදී.

2018 ජනවාරි මාසයේදී පහත ගනුදෙනු ව්‍යාපාරය තුළ සිදු විය.

| අංකය | දිනය | චෙක්පත් අංකය | ගනුදෙනුව |
|---|---|---|---|
| 1 | 01/01 | | සමන් මුදලින් රු. 600 000 ක් ආයෝජනය කරන ලද අතර රු. 180 000 ක් වටිනා ලී බඩු ගෙන එන ලදී. |
| 2 | 01/03 | 5001 | රු. 300 000 ක ලිපිද්‍රව්‍ය අත්පිට මුදලට මිල දී ගන්නා ලදී. |
| 3 | 01/07 | 4450 | රු. 100 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 150 000 කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 4 | 01/10 | | රු. 150 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 200 000 කට ගාමිණිට ණයට විකුණන ලදී. |
| 5 | 01/12 | | රු. 400 000 ක ලිපිද්‍රව්‍ය සීමිත ජයමාල් පොදු සමාගමෙන් ණයට මිල දී ගන්නා ලදී. |
| 6 | 01/12 | | රු. 300 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 280 000 කට නිමල්ට ණයට විකුණන ලදී. |
| 7 | 01/15 | 6005 | ගාමිණිගෙන් ලැබිය යුතු මුළු මුදල ලැබුණි. |
| 8 | 01/18 | 2005 | රු. 150 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 120 000 කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 9 | 01/25 | 5002<br>5003 | වැටුප් ගෙවීම්:<br>සමන් රු. 50 000<br>සහායක රු. 25 000 |
| 10 | 01/26 | 5004 | මාසය සඳහා කාර්යාල වියදම් රු. 40 000 ක් දරන ලද අතර එයින් රු. 30 000 ක් ගෙවන ලදී. |
| 11 | 01/29 | 3010 | රු. 10 000 ක වට්ටමක් ලබා දීමෙන් පසු නිමල්ගෙන් ලැබිය යුතු මුළු මුදල ලැබුණි. |
| 12 | 01/30 | 5005 | සීමිත ජයමාල් පොදු සමාගමට ගෙවිය යුතු මුදල පියවන ලදී. |

2018.02.03 දින ලද, ජනවාරි මාසය සඳහා ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

| **සමන් වෙළෙන්දෝ<br>ගිණුම් අංකය: 5063-7000-8002** | | | | |
|---|---|---|---|---|
| **දිනය** | **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** | **ශේෂය (රු.)** |
| 01/01 | මුදල් තැන්පතු | | 600 000 | 600 000 |
| 01/03 | චෙක්පත් අංක 5001 | 300 000 | | 300 000 |
| 01/07 | චෙක්පත් අංක 4450 | | 150 000 | 450 000 |
| 01/15 | චෙක්පත් අංක 6005 | | 200 000 | 650 000 |
| 01/18 | චෙක්පත් අංක 2005 | | 120 000 | 770 000 |
| 01/25 | චෙක්පත් අංක 5002 | 50 000 | | |
| | චෙක්පත් අංක 5003 | 25 000 | | 695 000 |
| 01/26 | චෙක්පත් අංක 5004 | 30 000 | | |
| | බැංකු ගාස්තු | 5 000 | | 660 000 |
| 01/31 | ශේෂය | | | 660 000 |

**අවශ්‍යවන්නේ:**

(1) අංක 1 සිට 12 දක්වා ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (−) ද යන්න සඳහන් කරන්න. (පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

(රු.'000)

| **ගනුදෙනු අංකය** | **වත්කම්** | | | | **වගකීම්** | | **හිමිකම** | |
|---|---|---|---|---|---|---|---|---|
| | **දේපළ, පිරියත සහ උපකරණ** | **තොගය** | **වෙළෙඳ ලැබිය යුතු දෑ** | **මුදල්** | **වෙළෙඳ ගෙවිය යුතු දෑ** | **වෙනත් ගෙවිය යුතු දෑ** | **ප්‍රාග්ධනය** | **රඳවාගත් ඉපැයුම්** |
| | | | | | | | | |
| | | | | | | | | |

(2) 2018.01.31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් ලැබීම් ජර්නලය

(3) 2018 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය (බැංකු ප්‍රකාශනයෙහි ශේෂයෙන් ආරම්භ කරන්න.)

**(මුළු ලකුණු 15 යි)**

පිළිතුර

**ප්‍රශ්න අංක 03**

**(3) (1)** රු'000

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | මුදල් | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයුම් |
| 1 | + 180 | | | + 600 | | | + 780 | (02) |
| 2 | | + 300 | | - 300 | | | | (01) |
| 3 | | - 100 | | + 150 | | | | + 50 (02) |
| 4 | | - 150 | + 200 | | | | | + 50 (02) |
| 5 | | + 400 | | | + 400 | | | (01) |
| 6 | | - 300 | + 280 | | | | | - 20 (02) |
| 7 | | | - 200 | + 200 | | | | (01) |
| 8 | | - 150 | | + 120 | | | | - 30 (02) |
| 9 | | | | - 75 | | | | - 75 (02) |
| 10 | | | | - 30 | | +10 | | - 40 (02) |
| 11 | | | - 280 | + 270 | | | | - 10 (02) |
| 12 | | | | - 400 | - 400 | | | (01) |

*(ලකුණු 20)*

**(2)**

**මුදල් ලැබීම් ජර්නලය** රු' 000

| දිනය | චෙක්පත් අංකය | විස්තරය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් |
| 01/01 | - | ප්‍රාග්ධනය යෙදවීම | | 600 | | | 600 (01) |
| 01/07 | 4450 | අත්පිට විකුණුම් | | 150 | 150 (01) | | |
| 01/15 | 6005 | ගාමිණීගෙන් මුදල් ලැබීම් | | 200 | | 200 (01) | |
| 01/18 | 2005 | අත්පිට විකුණුම් | | 120 | 120 (01) | | |
| 01/29 | 3010 | නිමල් ගෙන් මුදල් ලැබීම් | 10 (01) | 270 | | 270 (01) | |
| 01/31 | | | 10 | 1 340 | 270 | 470 | 600 |

**(ලකුණු 06)**

(3) 2018 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය (රු'000)

| | |
|---|---|
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | 660 (01) |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | 270 (01) |
| | 930 |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | (400) (01) |
| මුදල් ගිණුමට අනුව ශේෂය | (01) 530 |

**(ලකුණු 04)**

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
3 ප්‍රශ්නය අපේක්ෂකයින්ගෙන් 93%ක් පමණ තෝරා ගෙන ඇත.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා ලකුණු ලබාගත් පිරිස 36%ක් වන අතර ලකුණු 7 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස අපේක්ෂකයින්ගෙන් 21%කි. අපේක්ෂකයින්ගෙන් 56%ක්ම මෙම ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අඩකට වඩා ලබාගෙන තිබුණි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 3 අතුරෙන් සාපේක්ෂව පහසුතාව වැඩිම කොටස (1) වන අතර එහි පහසුතාව 68%කි. එසේම පහසුතාව අඩුම කොටස (3) වන අතර එහි පහසුතාව 34%කි.

තුන්වන ප්‍රශ්නයට අදාළ කොටස් 3න් 1 වන කොටස සඳහා 68%ක් වැනි වැඩිම පහසුතාවක් ලබාගෙන ඇත. අපේක්ෂකයින් 93%ක් වැනි ඉහළ ප්‍රතිශතයක් තෝරා ගෙන ඇති මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම තුළින් අපේක්ෂා කර ඇත්තේ ගිණුම්කරණ සමීකරණය පිළියෙල කිරීම සම්බන්ධ දැනුම පරීක්ෂාවයි. මෙම කොටසට පිළිතුරු සැපයීමේ දී සිදුකර ඇති දුර්වලතා ලෙස ආදායම් හා වියදම්වලට අදාළ ගණුදෙනු රඳවාගත් ඉපයුම් තීරුවේ සටහන් නොකිරීම, වට්ටම්වලට අදාළ වටිනාකම නිවැරදි ව හඳුනා නොගැනීම ආදිය දක්නට ලැබුණි.

2වන කොටස සඳහා 59%ක පහසුතාවක් ලබා තිබුණ අතර එම කොටස මගින් අපේක්ෂා කර තිබුණේ මාසයට අදාළ මුදල් ලැබීම් ජර්නලයේ ගණුදෙනු වාර්තා කළ යුතු ආකාරය පිළිබඳවය. මෙම කොටසට පිළිතුරු සැපයීමේදී මුදල් ලැබීම් ජර්නලයේ ආකෘතිය නිවැරදි ව ඉදිරිපත් නොකිරීම, විශ්ලේෂණ තීරුවලට අදාළ වටිනාකම් නිවැරදි ව වාර්තා නොකිරීම දුර්වලතා ලෙස දැක්විය හැකිය.

3වන කොටසේ පහසුතාව 34%ක් වූ අතර එම කොටස මගින් අපේක්ෂා කර තිබුණේ බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ දැනුම පරීක්ෂාවයි. මෙම කොටසට අඩු පහසුතාවක් ලබාගැනීමට හේතු වූ කරුණු ලෙස හෙළිදරව් වී තිබුණේ බැංකු සැසඳුම් පිළියෙල කිරීමට අවශ්‍ය ගණුදෙනු හඳුනා ගෙන නොතිබීමයි.

සැසඳුම් ලේඛන පිළියෙල කිරීමට අවශ්‍ය නිවැරදි අවබෝධය ලබාදීම සඳහා සුදුසු සරල අභ්‍යාස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගැනීම වඩාත් යෝග්‍ය වේ. මූලික පොත්වල නිවැරදි ව වාර්තා කිරීම, ගණුදෙනුවල ද්විත්ව සටහන් හඳුනා ගැනීම, බැංකු ගණුදෙනු ආශ්‍රිත අභ්‍යාස ප්‍රායෝගිකත්වය තුළින් ඉදිරිපත් කිරීම, වැනි ක්‍රියාකාරකම් යොදා ගැනීම මේ සඳහා විසඳුමක් ලෙස යෝජනා කළ හැකිය.

04 ප්‍රශ්නය

**4.** සීමිත මිතුන් පුද්ගලික සමාගම පොත්සලක් පවත්වාගෙන යනු ලැබේ. 2018 මාර්තු මාසය සඳහා එහි ගනුදෙනු පහත පරිදි වේ.

| | **වටිනාකම (රු.)** |
|---|---|
| **නාදන් ප්‍රකාශකයන් සමග ගනුදෙනු:** | |
| පොත් ණයට ගැනුම් (ඉන්වොයිස් අංක 15670) | 550 000 |
| පිරිවිතර හා නොගැළපුන පොත් ආපසු යැවුම් | 50 000 |
| 5% ක මුදල් වට්ටමකට යටත්ව මුදල් ගෙවීම් | 475 000 |
| අත්පිට මුදලට පොත් මිලට ගැනුම් | 100 000 |
| **සමනල ප්‍රකාශකයන් සමග ගනුදෙනු:** | |
| පොත් ණයට ගැනුම් (ඉන්වොයිස් අංක 13209) - ලැයිස්තුගත මිල | 410 000 |
| අඩුකළ වෙළෙඳ වට්ටම | 10 000 |
| මුදල් ගෙවීම් | 300 000 |
| අත්පිට මුදලට පොත් මිලට ගැනුම් | 150 000 |
| **විකුණුම් (විකුණුම් මිල මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව):** | |
| මුදලට | 800 000 |
| ණයට | 500 000 |
| ණයගැතියන්ගෙන් මුදල් ලැබීම් | 420 000 |
| **සේවකයන්ට වැටුප් ගෙවීම්:** | |
| කළමනාකරු - ජිනදාස | 63 000 |
| ගබඩා පාලක - සිරිපාල | 45 000 |
| විකුණුම් සහායක - සුගත් | 27 000 |
| කුලී ගෙවීම් | 72 000 |

**අතිරේක තොරතුරු:**

(i) 2018 මාර්තු මාසය සඳහා සියලු සේවකයන්ට වැටුප් ගෙවා ඇත්තේ පහත දෑ අඩු කිරීමෙන් පසුව ය.

සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකය දළ වැටුපෙන් 8% යි.

සේවක සුභසාධක අරමුදලට මාසික දායකය දළ වැටුපෙන් 2% යි.

(ii) සමාගම, සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) පිළිවෙළින් දළ වැටුපෙන් 12% ක් සහ 3% ක් ලෙස දායක වේ.

(iii) සැම මාසයකම EPF, ETF සහ සුබසාධක අරමුදල් සඳහා ඊට පසුව එළැඹෙන මාසයේ 10 වන දින සමාගම මුදල් ප්‍රේෂණය කරනු ලබයි.

(iv) 2018.03.01 දිනට වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම්:

| **අයිතමය** | **රු.** |
|---|---|
| පොත් තොගය | 150 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 120 000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 180 000 |
| ගෙවිය යුතු EPF | 30 000 |
| ගෙවිය යුතු ETF | 4 500 |
| සේවක සුබසාධක අරමුදලට ගෙවිය යුතු මුදල | 3 000 |
| මුදල් | 50 000 |

(v) කුලියට ගත් ගොඩනැගිල්ලක පොත්හල පවත්වාගෙන යන අතර ගෙවන ලද කුලිය 2018.03.01 දින සිට ඉදිරි මාස හයක කාලයකට අදාළ වේ.

ඉදිරි මාස හයක කාලයකට අදාළ වේ.

**අවශ්‍යවන්නේ:**

(1) පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරමින් 2018 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය:

| සේවකයාගේ නම | දළ වැටුප (රු.) | අඩු කිරීම් (රු.) | | මුළු අඩු කිරීම් (රු.) | ශුද්ධ වැටුප (රු.) | සේවක දායකත්වය (රු.) | |
|---|---|---|---|---|---|---|---|
| | | EPF | සේවක සුබසාධක අරමුදල | | | EPF | ETF |
| | | | | | | | |
| | | | | | | | |

(2) 2018.03.31 දිනෙන් අවසන් මාසය සඳහා සේවකයන්ට අදාළ මුළු වියදම (එක් එක් වියදම් අයිතමය වෙන වෙනම දක්වන්න.)

(3) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගැනුම් ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය

(4) 2018.03.31 දිනට පහත වත්කම් සහ වගකීම්:

(i) පොත් තොගය

(ii) වෙළෙඳ ලැබිය යුතු දෑ

(iii) වෙළෙඳ ගෙවිය යුතු දෑ

(iv) වෙනත් ගෙවිය යුතු දෑ

(v) ඉදිරියට ගෙවූ වියදම්

**(මුළු ලකුණු 15 යි)**

පිළිතුර
**ප්‍රශ්න අංක 04**

(1) 2018 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛණය

| සේවකයාගේ නම | දළ වැටුප (රු.) | අඩුකිරීම් (රු.) | | මුළු අඩුකිරීම් (රු.) | ශුද්ධ වැටුප (රු.) | සේව්‍ය දායකත්වය (රු.) | |
|---|---|---|---|---|---|---|---|
| | | EPF | සේවක සුභසාධක අරමුදල | | | EPF | ETF |
| ජිනදාස | 70 000 | 5 600 | 1 400 | 7 000 | 63 000 | 8 400 | 2 100 (03) |
| සිරිපාල | 50 000 | 4 000 | 1 000 | 5 000 | 45 000 | 6 000 | 1 500 (03) |
| සුගත් | 30 000 | 2 400 | 600 | 3 000 | 27 000 | 3 600 | 900 (03) |
| එකතුව (01) | 150 000 | 12 000 | 3 000 | 15 000 | 135 000 | 18 000 | 4 500 |

**(අඩුම වශයෙන් ලද අගය එකතු කිරීම් 4 ක් වත් තිබිය යුතුය.)** ***(ලකුණු 10)***

**(2) සේවකයින්ට අදාළ මුළු වියදම (රු.)**

| | | |
|---|---|---|
| දළ වැටුප | (01) | 150 000 |
| EPF දායකය | (01) | 18 000 |
| ETF දායකය | (01) | 4 500 |
| | | 172 500 |

(ලකුණු 03)

**(3) 2018.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ගැනුම් ජර්නලය**

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) |
|---|---|---|---|
| | 15670 | නාදන් ප්‍රකාශකයෝ | 550 000 (01) |
| | 13209 | සමනල ප්‍රකාශකයෝ | 400 000 (01) |
| 2018.03.31 | | එකතුව | 950 000 |

**2018.03.31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් ගෙවීම් ජර්නලය**

| විස්තරය | ලද වට්ටම් | වටිනාකම | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වියදම් | වෙනත් ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| නාදන් ප්‍රකාශකයින්ට ගෙවීම් | 25 000 | 475 000 | | 475 000 | | |
| අත්පිට ගැනුම් | | 100 000 | 100 000 | | | |
| සමනල ප්‍රකාශකයින්ට ගෙවීම් | | 300 000 | | 300 000 | | |
| අත්පිට ගැනුම් | | 150 000 | 150 000 | | | |
| වැටුප් ගෙවීම් | | 135 000 | | | 135 000 | |
| කුලී ගෙවීම් | | 72 000 | | | 72 000 | |
| EPF ගෙවීම් | | 30 000 | | | | 30 000 |
| ETF ගෙවීම් | | 4 500 | | | | 4 500 |
| සේවක සුබසාධක අරමුදලට ගෙවීම් | | 3 000 | | | | 3 000 |
| එකතුව | 25 000 | 1 269 500 | 250 000 | 775 000 | 207 000 | 37 500 |

***(වටිනාකම් තීරුව හැර අයිතම දෙකකට 01 බැගින් ලකුණු 05)***

***(ලකුණු 07)***

**(4)** (i) පොත් තොගය රු. 260 000 (02)

| **පෙර වැඩ** | රු. |
|---|---|
| 2018.03.01 දිනට තොගය | 150 000 |
| ගැනුම් | 1 200 000 |
| ආපසු යැවුම් | (50 000) |
| විකුණුම් පිරිවැය $\frac{1\ 300\ 000}{100}$ X 80 | (1 040 00) |
| 2018.03.31 දිනට තොගය | 260 000 |

*( අයිතම දෙකකට 01 බැගින් ලකුණු 02)*

**(ii)** වෙළෙඳ ලැබිය යුතු දෑ රු. 260 000 (02)

**පෙර වැඩ**

වෙළෙඳ ලැබිය යුතු දෑ

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 180 000 | මුදල් | 420 000 [01] |
| විකුණුම් | 500 000 [01] | ශේෂය ප/ගෙ | 260 000 |
| | 680 000 | | 680 000 |

**(iii)** වෙළෙඳ ගෙවිය යුතු දෑ රු. 220 000 (03)

**පෙර වැඩ**

වෙළෙඳ ගෙවිය යුතු දෑ

| | | | |
|---|---|---|---|
| ආපසු යැවුම් | 50 000 [01] | ශේෂය ඉ /ගෙ | 120 000 |
| මුදල් | 775 000 } | ගැනුම් | 950 000 [01] |
| ලද වට්ටම් | 25 000 } [01] | | |
| ශේෂය ප/ගෙ | 220 000 | | |
| | 1 070 000 | | 1 070 000 |

**(iv)** වෙනත් ගෙවිය යුතු දෑ රු. 37 500 (02)

| **පෙර වැඩ** | |
|---|---|
| EPF (18 000 + 12 000) | 30 000 |
| ETF | 4 500 |
| සේවක සුභසාධක අරමුදල | 3 000 |
| | 37 500 |

*නිවැරදි අයිතම 3 සඳහා ලකුණු* [02]
*නිවැරදි අයිතම 2 සඳහා ලකුණු* [01]

**(v)** ඉදිරියට ගෙවූ වියදම් රු. 60 000 (01)

| **පෙර වැඩ** | |
|---|---|
| කුලී ගෙවීම් | 72 000 |
| මාසයට අදාළ කුලී | [01] (12 000) |
| ඉදිරියට ගෙවූ කුලී | 60 000 |

**(ලකුණු 10)**

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30 කි.
4 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 59%ක් පමණි.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් පිරිස 14%ක් පමණක් වන අතර අපේක්ෂකයින්ගෙන් 32%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් අතරින් කොටස් 7කම පහසුතාව 50%ට වඩා අඩුය. අංක 1 කොටසට 63%ක වැඩිම පහසුතා ප්‍රතිශතයක් ලබාගෙන ඇත. 23%ක් වන අඩුම පහසුතාව සහිත අනුකොටස් 3කි. එනම් 4 කොටසෙහි i, iii සහ iv අනුකොටස්ය.

හතරවන ප්‍රශ්නයේ 1 කොටසෙහි පහසුතාව 63%ක සැලකිය යුතු මට්ටමක පැවතුණි. මෙයින් අපේක්ෂා කරනු ලබන්නේ වැටුප් ලේඛනය සකස් කිරීම පිළිබඳ අවබෝධයයි. සමහර අපේක්ෂකයින් යාන්ත්‍රිකව පුරුදු පුහුණු වී ඇත්තේ මූලික වැටුපේ සිට දළ වැටුපත් එයින් අඩුකිරීම් කර ශුද්ධ වැටුපත් සොයා ගැනීමේ ක්‍රමයක් බව සමහර පිළිතුරු නිරීක්ෂණයේ දී අවබෝධ වේ. මෙම අභ්‍යාසයෙන් ලබා දී ඇත්තේ ශුද්ධ වැටුප වන අතර එය නියමිත ස්ථානයෙහි සටහන් කර ගැනීමට අපොහොසත් වීමේ දුර්වලතාව හඳුනාගත හැකි විය. එමෙන් ම වැටුප් ලේඛනයේ තීරු එකතු කර නොතිබීම ද දක්නට ලැබුණි.

2 කොටසේ පහසුතාව 41%කි. එයින් මැනීමට අපේක්ෂා කරනු ලැබ ඇත්තේ ආයතනයක සේවකයින්ට අදාළ මුළු වියදම ගණනය කිරීම පිළිබඳ අවබෝධයයි. බොහෝ අපේක්ෂකයින් මුළු වියදම ලෙස දළ වැටුප පමණක් ඉදිරිපත් කොට තිබූ අතර සමහර අපේක්ෂකයින් EPF දායකයන් දෙකම එකතු කොට දක්වා තිබුණි. ආයතනයක සේවකයින්ට අදාළ මුළු වියදම පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විශේෂ අවධානයක් යොමු කළ යුතු බව මෙයින් පෙනී යයි.

3 කොටසේ පහසුතාව ද 35%ක් වැනි අඩු ප්‍රමාණයකි. මෙහිදී ගැනුම් ජ'නලය සහ මුදල් ගෙවීම් ජ'නලය පිළියෙල කළ යුතුව තිබූ අතර ගැනුම් ජ'නලය සකස් කිරීමේදී “සමනල ප්‍රකාශකයින්ගේ”වෙළෙඳ වට්ටම් අඩු කිරීමට පෙර අගය යොදා ගෙන තිබූ අතර මුදල් ගෙවීම් ජ'නලය සකස් කිරීමේදී “ලද වට්ටම්” තීරුව නොමැති වීම, වියදම් සහ වෙනත් ගෙවීම් එක් තීරුවක සටහන් කර තිබීම වැනි දුර්වලතා දක්නට ලැබුණි.

4 කොටසේ (i), (ii), (iii), (iv) හා (v) අනු කොටස්වලින් පොත් තොගය, වෙළෙඳ ලැබිය යුතු දෑ, වෙළෙඳ ගෙවිය යුතු දෑ, වෙනත් ගෙවිය යුතු දෑ සහ ඉදිරියට ගෙවීම් සම්බන්ධ අවබෝධය පිරික්සා තිබූ අතර එම කොටස්වල පහසුතාවන් පිළිවෙළින් 23%, 36%, 23%, 23% හා 24% විය. බොහෝ සිසුන් මෙම අනුකොටස්වලට පිළිතුරු සපයා නොතිබූ අතර තවත් බොහෝ සිසුන් ඉතා සංකීර්ණ ලෙස පිළිතුරු සෙවීමට උත්සාහ දරා තිබුණි. එකම අභ්‍යාසයක් තුළ මූල්‍ය සහ කළමනාකරණ ගිණුම්කරණ අවබෝධයන් පිරික්සීම අපේක්ෂකයින්ට නුහුරු අත්දැකීමක් වූ බව සිතිය හැකි අතර ගිණුම්කරණයේ විවිධ නිපුණතා මට්ටම් අතර සම්බන්ධතාවය නිරතුරුව සිහිගැන්වෙන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම සුදුසු බව කිව හැකිය.

05 ප්‍රශ්නය

5. **(අ)** සමාගමක් පිරිවැය රු. 4 000 000 ක් වූ නව යන්ත්‍රයක් මිල දී ගැනීමට තීරණය කර ඇති අතර එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 4 ක් වේ. 10% ක වට්ටම් සාධකය යටතේ මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය රු. 600 000 ක් **ධන** ලෙස ගණනය කර ඇත. කෙසේ වුව ද මෙම ගණනය කිරීමේදී පහත මුදල් ප්‍රවාහ අයිතම සැලකිල්ලට ගෙන නොමැති බව සමාගමේ ගණකාධිකාරීවරයා විසින් පසුව සොයාගන්නා ලදී.

| **අයිතම අංක** | **විස්තරය** | **වටිනාකම (රු.'000)** |
|---|---|---|
| 1 | වාර්ෂික මෙහෙයුම් වියදම් ඉතිරිය | 300 |
| 2 | පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල | 200 |
| 3 | ව්‍යාපෘති කාලය අවසානයේදී නව යන්ත්‍රයේ විකුණුම් මිල | 500 |
| 4 | නව යන්ත්‍රයේ සවිකිරීම් ගාස්තු | 1 200 |
| 5 | මධ්‍යම පරිසර අධිකාරියට ගෙවිය යුතු වාර්ෂික දායක මුදල (පළමු වසර අවසානයේ සිට ගෙවිය යුතු වේ.) | 200 |

10% වට්ටම් සාධක:

| වසර | 0 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|
| 10% වට්ටම් සාධකය | 1 | 0.91 | 0.83 | 0.75 | 0.68 |

**අවශ්‍යවන්නේ:**

(1) ඉහත අංක 1 - 5 දක්වා ඇති අයිතමවලට අදාළ වාර්ෂික මුදල් ගලා ඒම් (+) ලෙස සහ ගලා යාම් (–) ලෙස අගයන් සහිතව දක්වන්න. (පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

**(රු.'000)**

| **අයිතම අංකය** | **වසර** | | | | |
|---|---|---|---|---|---|
| | **0** | **1** | **2** | **3** | **4** |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

(2) 10% වට්ටම් සාධකයේදී ව්‍යාපෘතියේ සංශෝධිත ශුද්ධ වර්තමාන අගය සහ නිර්දේශය

**(ලකුණු 05 යි)**

පිළිතුර

**ප්‍රශ්න අංක 05**

(අ) (1)

(රු. '000)

| අයිතම අංකය | වසර | | | | |
|---|---|---|---|---|---|
| | 0 | 1 | 2 | 3 | 4 |
| 1 | | + 300 | + 300 | + 300 | + 300 |
| 2 | + 200 (01) | (02) | | | |
| 3 | | | | | + 500 (01) |
| 4 | -1 200 (01) | | | | |
| 5 | | -200 | -200 | -200 | -200 (02) |

*(ලකුණු 07)*

(2) සංශෝධිත ශුද්ධ වර්තමාන අගය = රු. 257 000 (02)

නිර්දේශය :- සංශෝධිත ශුද්ධ වර්තමාන අගය ධන අගයක් ගන්නා බැවින් ව්‍යාපෘතිය පිළිගැනීම් යෝග්‍ය වේ. (01)

**පෙර වැඩ**

| වසර | 0 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|
| ශුද්ධ මුදල් ප්‍රවාහ | -1 000 | + 100 | + 100 | + 100 | + 600 |
| වට්ටම් සාධකය | 1 | 0.91 | 0.83 | 0.75 | 0.68 |
| වර්තමාන අගය | -1 000 | +91 | +83 | +75 | +408 |

සැළකිල්ලට ගෙන නොමැති අයිතමයන්හි ශුද්ධ වර්තමාන අගය = 343

සංශෝධිත ශුද්ධ වර්තමාන අගය = 600 - 343 = 257

01 01

*(ලකුණු 03)*

**(ආ)** පාසලක ආදි ශිෂ්‍ය සංගමයක, 2017.01.01 දිනට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දැක්වේ:

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| **වත්කම්:** | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 4 500 |
| ලිපිද්‍රව්‍ය තොගය | 80 |
| 10% ස්ථාවර තැන්පතුව | 1 400 |
| මුදල් | 20 |
| | **6 000** |
| **හිමිකම් සහ වගකීම්:** | |
| සමුච්චිත අරමුදල | 4 580 |
| ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුදල | 1 400 |
| උපචිත විදුලි වියදම් | 20 |
| | **6 000** |

**අතිරේක තොරතුරු:**

(i) 2017 වසර තුළදී සාමාජිකත්වය ලබාගත් අය ද ඇතුළුව 2017.12.31 දිනට සංගමයේ සාමාජිකයන් ගණන 800 ක් විය.

(ii) ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුදල සඳහා ලද මුදල් යොදා ගනිමින් 2016.12.31 දින මාස හයක කාලයක් සඳහා ස්ථාවර තැන්පතුව ආරම්භ කරන ලදී.

(iii) වසර තුළ මුදල් ලැබීම්:
- රු. 1 000 බැගින් නව සාමාජිකයින් 50 දෙනෙකුගේ ඇතුළත් වීමේ ගාස්තු (සියලු ම නව සාමාජිකයින් 2017.01.01 දින සංගමයට බැඳුනි.)
- සාමාජිකයකුගෙන් රු. 2 000 බැගින් සාමාජිකයන් 640 කගෙන් වාර්ෂික සාමාජික මුදල් ලැබී ඇත.
- 2017.07.01 දින ස්ථාවර තැන්පතුව කල්පිරුණු අතර පොලී ආදායම ද සහිතව මුදල් ලැබුණි.

(iv) වසර තුළ ගෙවීම්:
- 2016 දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු රු. 20 000 ද ඇතුළුව රු. 120 000 ක විදුලි ගාස්තු ගෙවීම
- වාර්ෂික මහා සභා රැස්වීම සඳහා සංග්‍රහ වියදම් රු. 170 000
- ලිපිද්‍රව්‍ය මිල දී ගැනුම් රු. 200 000 (2017.12.31 දිනට ලිපිද්‍රව්‍ය තොගය රු. 40 000 ක් විය.)
- නඩත්තු වියදම් රු. 160 000
- ස්ථාවර තැන්පතුව කල්පිරීමෙන් ලද මුදලින් රු. 1 000 000 ක් භාවිත කරමින් සංගමයේ ගොඩනැගිල්ල ඉදිකර අවසාන කිරීම

(v) සංගමයේ වාර්ෂික සුහද හමුව 2017.12.31 දින නව ගොඩනැගිල්ලෙහි පවත්වන ලදී. ඒ සඳහා රු. 550 000 ක වියදමක් දරන ලද අතර එය 2018.01.10 වන දින ගෙවන ලදී.

(vi) දේපළ, පිරියත සහ උපකරණ වාර්ෂික ක්ෂය රු. 450 000 ක් විය.

**අවශ්‍යවන්නේ:**

ආදි ශිෂ්‍ය සංගමය සඳහා:

(1) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම

(2) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(3) 2017.12.31 දිනට හිමිකම (පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

| **විස්තරය** | **හිමිකම් අයිතම (රු.'000)** | |
|---|---|---|
| | **සමුච්චිත අරමුදල** | **ගොඩනැගිලි ඉදිකිරීමේ අරමුදල** |
| 2017.01.01 දිනට ශේෂය | .............................. | .............................. |
| **එකතු කිරීම්:** | | |
| .................. | .............................. | .............................. |
| .................. | .............................. | .............................. |
| **අඩු කිරීම්:** | | |
| ..................... | .............................. | .............................. |
| ..................... | .............................. | .............................. |
| 2017.12.31 දිනට ශේෂය | .............................. | .............................. |

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 15 යි)**

(ආ) (1) **2017.12.31 දිනෙන් අවසන් වැර්ෂය සඳහා මුදල් ගිණුම රු'000**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 20● | විදුලි ගාස්තු | 120● |
| ඇතුළත්වීමේ ගාස්තු | 50 (01) | සංග්‍රහ වියදම් | 170● |
| සාමාජික මුදල් | 1 280 (01) | ලිපි ද්‍රව්‍ය | 200● |
| ස්ථාවර තැන්පතුව | 1 400 (01) | නඩත්තු වියදම් | 160● |
| ස්ථාවර තැන්පත් පොළී | 70 (01) | ගොඩනැගිලි | 1 000● |
| | | ශේෂය ප/ගෙ | (01) 1 170 |
| | 2 820 | | 2 820 |

*(●ඉතිරි අයිතම දෙකකට 01 බැගින් ලකුණු 03)*

*(ලකුණු 08)*

(2) **ආදි ශිෂ්‍ය සංගමය**

**2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය** (රු' 000)

| | | |
|---|---|---|
| **<u>ආදායම්</u>** | | |
| ඇතුළත්වීමේ ගාස්තු | 50● | |
| ස්ථාවර තැන්පතු පොළී | 70● | |
| සාමාජික මුදල් | 1 600 (01) | 1 720 |
| **<u>වියදම්</u>** | | |
| විදුලි ගාස්තු | 100 (01) | |
| සංග්‍රහ වියදම් | 170● | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 240 (01) | |
| නඩත්තු වියදම් | 160● | |
| සුහද හමුවේ වියදම් | 550 (01) | |
| ක්ෂය | 450 (01) | 1 670 |
| අතිරික්තය | | (01) 50 |

**(● ඉතිරි අයිතම දෙකකට 1 බැගින් ලකුණු 02)** ***(ලකුණු 08)***

(3) **2017.12.31 දිනට හිමිකම**

| විස්තරය | හිමිකම් අයිතම (රු' 000) | |
|---|---|---|
| | **සමුච්චිත අරමුදල** | **ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුදල** |
| 2017.01.01 දිනට ශේෂය | 4 580 | 1 400 |
| <u>එකතු කිරීම්</u> | | |
| අතිරික්තය | 50 (01) | |
| ගොඩනැගිලි අරමුදලෙන් | (01) 1 400 | |
| <u>අඩුකිරීම්</u> | | |
| සමුච්චිත අරමුදලට | | (1 400) (01) |
| 2017.12.31 දිනට ශේෂය | (01) 6 030 | - |

***(ලකුණු 04)***

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 62%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 15%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 15%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් ලකුණු 07 හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇති ප්‍රතිශතය 30%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ට වඩා ලබාගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 37%ක් වීමද සැළකිය යුතු තත්ත්වයකි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 5න් අනුකොටස් 4කම පහසුතාව 50%ට වඩා අඩුය. (අ) (1) අනුකොටසෙහි පහසුතාව 71%ක් වන අතර (ආ) 3 අනු කොටසෙහි පහසුතාව 23%කි.

පස්වන ප්‍රශ්නයේ (අ) කොටසෙහි 1 වන කොටසෙහි පහසුතාව 71%කි. මෙයින් පරීක්ෂා කර තිබුණේ ආයෝජනයක අපේක්ෂිත මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් වර්ෂ අනුව හඳුනා ගැනීමයි. මෙහි දී සමහර අපේක්ෂකයින් වාර්ෂික මෙහෙයුම් වියදම්වල ඉතිරිය මුදල් ගලා ඒමක් ලෙස හඳුනාගෙන නොතිබූ අතර නව යන්ත්‍රයේ සවිකිරීම් ගාස්තු හා පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල පිළිවෙළින් පළමු වර්ෂයේ මුදල් ගලා යාමක් සහ මුදල් ගලා ඒමක් ලෙස හඳුනාගෙන තිබුණි.

අ (2) කොටසෙහි පහසුතාව 45%ක් වූ අතර එයින් පිරික්සා ඇත්තේ "සංශෝධිත" ශුද්ධ වර්තමාන අගය සෙවීම සහ ව්‍යාපෘතිය තෝරාගත යුතුද නැද්ද යන නිර්දේශයයි. සංශෝධිත ශුද්ධ වර්තමාන අගය සෙවීම සඳහා අභ්‍යාසයේ ලබා දී තිබූ වට්නාකම යොදා ගැනීමට බොහෝ සිසුන්ට අවබෝධයක් නොතිබූ බව කිව හැකිය. ලද අගයන් වට්ටම් සාධකයෙන් ගුණ කිරීමත් ලද අගයක් අනුව නිර්දේශය කිරීමත් සාර්ථක බවක් දක්නට ලැබුණි.

ආ (1) අනුකොටසෙහි පහසුතාව 48%කි. මෙම ප්‍රශ්නයෙන් ලාභ අපේක්ෂා නොකරණ සංවිධානයක මුදල් ගිණුම පිළිබඳ අවබෝධය අපේක්ෂා කර ඇත. මෙහිදී විදුලි ගාස්තු, සංග්‍රහ වියදම්, ලිපිද්‍රව්‍ය, නඩත්තු වියදම් වැනි මුදල් ගෙවීම් හඳුනාගෙන තිබුණත්, ඇතුළත් වීමේ ගාස්තුව, සාමාජික මුදල් වැනි එම සංවිධානවලට ම විශේෂ වූ මුදල් ගනුදෙනු හඳුනා ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) 2 අනුකොටසෙන් පරීක්ෂා කර ඇත්තේ ඉහත කී සංවිධානයක ආදායම් ප්‍රකාශනය සකස් කිරීම පිළිබඳවය. මෙම කොටසේ පහසුතාව 39%ක් විය. සාමාජික මුදල් ආදායම හඳුනාගැනීමේ අපහසුතාව දක්නට ලැබුණි. එමෙන්ම සුහද හමුවේ වියදම් සහ ක්ෂය වියදම හඳුනාගැනීමේ දුර්වලතාවය ද, ආදායමෙන් වියදම අඩුකළ වටිනාකම අතිරික්තය/ඌණතාවය ලෙස හඳුනා ගැනීම ද දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) 3 අනුකොටසේ පහසුතාව 23%ක් වැනි දුර්වල මට්ටමක පැවතුණි. බොහෝ අපේක්ෂකයින් ගොඩනැගිලි අරමුදල, සමුච්චිත අරමුදලට මාරු කිරීමේ දී දුර්වලතා දක්වා තිබූ අතර තවත් සමහර අපේක්ෂකයින් සමුච්චිත අරමුදලේ 2017.12.31 දිනට ශේෂය ලබාගෙන නොතිබුණි.

ලාභ අපේක්ෂා නොකරන සංවිධානවල ගිණුම් සහ අනෙකුත් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී පොදුවේ භාවිත කරන ගිණුම්කරණ මූලධර්ම සහ පරිචයන්ගෙන් තොරව වෙනමම ක්‍රමයක් අනුගමනය කරන බව බොහෝ සිසුන් තුළ ආකල්පයක් ගොඩනැගී ඇති බව පෙනී යයි. එමනිසා මෙම කරුණ සම්බන්ධව සැලකිල්ලක් යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් වන බව කිව හැකිය.

06 ප්‍රශ්නය

**6.** 2018.03.31 දිනට සහ 2017.03.31 දිනට සීමිත බෝවත්ත පොදු සමාගමේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දී ඇත.

| විස්තරය | 2018.03.31 දිනට (රු.'000) | 2017.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ-ධාරණ වටිනාකම | 28 000 | 19 000 |
| තොග | 9 680 | 8 800 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 9 500 | 10 500 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 5 020 | 2 200 |
| **මුළු වත්කම්** | **52 200** | **40 500** |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය-සාමාන්‍ය කොටස් | 22 800 | 18 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 2 000 | – |
| රඳවාගත් ඉපැයුම් | 5 200 | 2 500 |
| දිගුකාලීන ණය | 10 500 | 10 100 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 8 600 | 8 100 |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | 500 | 400 |
| බැංකු අයිරාව | 2 600 | 1 400 |
| **මුළු හිමිකම සහ වගකීම්** | **52 200** | **40 500** |

**අතිරේක තොරතුරු:**

(i) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර සහ බදු පසු ලාභ පිළිවෙළින් රු. 6 000 000 ක් සහ රු. 4 500 000 ක් විය.

(ii) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිගුකාලීන ණය මත මුළු පොලී වියදම රු. 600 000 ක් විය. මෙහි උපචිත පොලිය රු. 400 000 ක් වන අතර එය වැරදීමකින් 2018.03.31 දිනට දිගුකාලීන ණය ශේෂයට එකතු කර ඇත.

(iii) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම රු. 1 250 000 ක් විය. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී නව මෝටර් රථයක් අත්පිට මුදලට මිල දී ගත් අතර ඉඩම් ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් අතිරික්තයක් ඇති විය. වර්ෂය තුළදී වෙනත් කිසිදු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීමක් හෝ ඉවත් කිරීමක් හෝ නොමැත.

(iv) වර්ෂය තුළදී සමාගම විසින් ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් කරන ලද අතර 2018.01.01 දින සාමාන්‍ය කොටස්කරුවන්ට අතුරු ලාභාංශයක් ගෙවන ලදී.

(v) දිගුකාලීන ණය, 2020.03.31 දින සිට ගෙවිය යුතු වේ.

**අවශ්‍යවන්නේ:**

(1) LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ ගණනය කිරීමට වක්‍ර ක්‍රමය භාවිත කරන්න.)

**(ලකුණු 10 යි)**

(2) ප්‍රවර්තන වර්ෂය සඳහා පහත අනුපාත:

(i) ජංගම අනුපාතය
(ii) ක්ෂණික වත්කම් අනුපාතය
(iii) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය
(iv) ණය-හිමිකම් අනුපාතය
(v) පොලී ආවරණ අනුපාතය

**(ලකුණු 05 යි)**

**(මුළු ලකුණු 15 යි)**

පිළිතුර

**ප්‍රශ්න අංක 06**

**(1)**

**සීමිත බෝවත්ත පොදු සමාගම**
**2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (01)**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

(රු.'000)

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| බදු පෙර ලාභය | 6 000 (01) | |
| ක්ෂය | 1 250 (01) | |
| පොලී වියදම් | 600 (01) | |
| | 7 850 | |
| තොග වැඩිවීම | (880) (01) | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ අඩුවීම | 1 000 (01) | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ වැඩිවීම | 500 (01) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | 8 470 | |
| පොලී ගෙවීම් | (200) (01) | |
| ආදායම් බදු ගෙවීම | (1 400) (02) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් | | (01) 6 870 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| මෝටර් රථ ගැනුම් | (8 250) (02) | |
| ආයෝජන ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල් | | (01) (8 250) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| කොටස් නිකුත් කිරීම | 4 800 (01) | |
| ලාභාංශ ගෙවීම් | (1 800) (01) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් | | (01) 3 000 |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම. | | (01) 1 620 |
| 2017.04.01 දිනට මුදල් හා මුදල් සමානදෑ: | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 200 | |
| බැංකු අයිරාව | (1 400) | 800 (01) |
| 2018.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ: | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 5 020 | |
| බැංකු අයිරාව | (2 600) | 2 420 (01) |

**(ලකුණු 20)**

**පෙර වැඩ - (රු' 000)**

දේපළ, පිරියත සහ උපකරණ ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ /ගෙ | 19 000 | ක්ෂය වීම් | 1 250 **01** |
| ඉඩම් ප්‍රත්‍යාගණනය | 2 000 **01** | | |
| මුදල් | 8 250 | ශේෂය ප/ගෙ | 28 000 |
| | 29 250 | | 29 250 |

ආදායම් බදු

| | | | |
|---|---|---|---|
| මුදල් | 1 400 | ශේෂය ඉ/ගෙ | 400 **01** |
| ශේෂය ප/ගෙ | 500 | ලාභාලාභ | 1 500 **01** |
| | 1 900 | | 1 900 |

**(2)** (i) ජංගම අනුපාතය - 2 : 1 **(ලකුණු 02)**

පෙර වැඩ - (රු. 000) **01**

$$\frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}} = \frac{24\ 200}{12\ 100} = 2:1$$ **01**

**(ii)** ක්ෂණික වත්කම් අනුපාතය = 1.2:1 **(ලකුණු 02)**

පෙර වැඩ - (රු. 000)

$$\frac{\text{ද්‍රවශීලී වත්කම්/ජංගම වත්කම් -තොගය}}{\text{ජංගම වගකීම්}} = \frac{14\ 520}{12\ 100} = 1.2:1$$ **01** **01**

(ද්‍රවශීල වත්කම් = 9500 + 5020 = 14 520)

**(iii)** හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය = 15% **(ලකුණු 02)**

පෙර වැඩ - (රු. 000)

$$\frac{\text{බදු පසු ලාභය}}{\text{මුළු හිමිකම්}} \times 100 = \frac{4\ 500}{30\ 000} \times 100 = 15\%$$ **01** **01**

(මුළු හිමිකම් = 22 800 + 2 000 + 5 200 = 30 000 )

**(iv)** ණය හිමිකම් අනුපාතය = 0.33 **(ලකුණු 02)**

පෙර වැඩ - (රු. 000)

$$\frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}} = \frac{10\ 100}{30\ 000} = 0.33$$ **01** **01**

(ණය ප්‍රාග්ධනය = 10 500 - 400 = 10 100)

**(v)** පොලී ආවරණ අනුපාතය = වාර 11 *(ලකුණු 02)*

| | | | | |
|---|---|---|---|---|
| පෙර වැඩ - (රු. 000) | | | | |
| බදු පෙර ලාභය + පොලී | = 6 600 | **01** | = | 11 |
| පොලී | 600 | | | |
| | | **01** | | |

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
6 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 71%ක් පමණි.
ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා වැඩියෙන් ලකුණු ලබාගත් පිරිස 23%ක් වන අතර, අපේක්ෂකයින්ගෙන් 22%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට වඩා අඩුවෙනි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ට වඩා වැඩියෙන් ලබාගෙන ඇති ප්‍රතිශතය 48%කි.

ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව




6 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් 2 කොටසෙහි i, ii හා iv අනුකොටස්වල පහසුතාව 50%ට වඩා අඩුය.

ඉහළම පහසුතාවක් දක්වා ඇත්තේ 2 කොටසෙහි iii අනුකොටස වන අතර එය 61%කි.

ප්‍රශ්න අංක 6හි 1 කොටසෙහි පහසුතාව 60%ක් වූ අතර මෙයින් පිරික්සා ඇත්තේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ දැනුම සහ අවබෝධයයි. මෙහිදී බොහොමයක් අපේක්ෂකයින් "ගෙවූ ආදායම් බදු" සහ මෝටර් රථ මිලට ගැනුම් යන අගයන් ගණනය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. ලබාදී ඇති අගයන් නිසි ලෙස සටහන් කිරීම සාර්ථක වී තිබුණි. එමෙන්ම මුදල් සහ මුදල් සමාන දැවලින් බැංකු අයිරාව අඩුකර ගණනය කර ගැනීම ද දුර්වල මට්ටමක පැවතුණි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ දී, ගණනය කර ලබාගත යුතු අගයන් පිළිබඳ ව වැඩි සැලකිල්ලක් දක්වමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම වඩා යෝග්‍ය බව කිව හැකිය.

මෙම ප්‍රශ්නයෙහි දෙවන අනුකොටසට අදාළ අනුකොටස්වලින් පරීක්ෂා කර තිබුණේ ජංගම අනුපාතය ක්ෂණික වත්කම් අනුපාතය, හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය හා පොලී ආවරණ අනුපාතය ගණනය කිරීම පිළිබඳ දැනුම සහ අවබෝධයයි. ඒවායෙහි පහසුතාවන් පිළිවෙළින් 47%, 37%, 61%, 40% හා 57% වේ. ජංගම අනුපාතය ගණනය කිරීමේ දී, ජංගම වත්කම් ගණනයේ දී අතිරේක තොරතුරු සැලකිල්ලට නොගැනීම දුර්වලතාවයක් ලෙස පෙනී යයි. ක්ෂණික වත්කම් අනුපාතය සෙවීමේ දී ද එම දුර්වලතාවය බලපා ඇතැයි සිතිය හැකිය. හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේ පහසුතාව 61% වැනි තරමක් හොඳ මට්ටමක පැවතුණි. නමුත් සමහර අපේක්ෂකයින් මුළු හිමිකම හඳුනා ගැනීමට අපොහොසත් වී සිටි අතර තවත් සමහර අපේක්ෂකයින් බදු පසු ලාභය වෙනුවට බදු පෙර ලාභය යොදා ගෙන තිබුණි. ණය හිමිකම් අනුපාතය ගණනය කිරීම් ද දුර්වල මට්ටමක පැවති අතර සමහර අපේක්ෂකයින් හරය හා ලවය මාරු කර පිළිතුර සෙවීමට උත්සාහ කර තිබුණි. එමෙන්ම ඉහත කී පරිදි මුළු හිමිකම හඳුනා ගැනීමේ දුර්වලතාවය ද, ණය ප්‍රාග්ධනය ගණනය කිරීමේදී අතිරේක තොරතුරුවල ඇති කරුණු සැලකිල්ලට නොගැනීමේ දුර්වලතාවය ද දක්නට ලැබුණි. පොලී ආවරණ අනුපාතය ගණනය කිරීමේ ප්‍රශ්න සඳහා පහසුතාව 57%ක් වැනි සතුටුදායක මට්ටමක පැවතුණි. එහිදී ද අතිරේක තොරතුරු පදනම් කරගෙන එයට යොදා ගත යුතු පොලී වියදම නිසි පරිදි නොයෙදීමේ දුර්වලතාවය ද බදු පසු ලාභය යොදා ගැනීමේ දුර්වලතාවය ද දක්නට ලැබුණි.

අනුපාත ගණනයේ දී සූත්‍ර කටපාඩම් කිරීමකින් තොරව අදාළ අයිතමයන් පිළිබඳ ව අවබෝධයකින් යුතුව කටයුතු කිරීමට සිසුන් පෙළඹවීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කළ යුතු බව කිව යුතුය.

**07 ප්‍රශ්නය**

**7.** **(අ)** තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන සමාගමක වාර්ෂික මෙහෙයුම් ධාරිතාව ඒකක 1 500 කි. 2019 වර්ෂය සඳහා මෙම භාණ්ඩයේ අයවැයගත තොරතුරු පහත දී ඇත.

වාර්ෂික නිෂ්පාදනය සහ විකුණුම් ................................ ඒකක 1 200

**ඒකකයක් සඳහා රු.:**

| | |
|---|---|
| විකුණුම් මිල | 1 200 |
| සෘජු අමුද්‍රව්‍ය | 160 |
| සෘජු ශ්‍රමය (ඒකක මත පදනම්ව ගෙවූ) | 180 |
| විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 100 |
| විචල්‍ය නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | 200 |

වාර්ෂික ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ..................... රු. 132 000

වාර්ෂික ස්ථාවර නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ........ රු. 180 000

**අවශ්‍යවන්නේ:**

(1) ඒකකයක විචල්‍ය පිරිවැය
(2) ඒකකයක නිෂ්පාදන පිරිවැය
(3) ඒකකයක ලාභය
(4) ක්‍රියාකාරී මට්ටම ඒකක 1 500 දී මුළු පිරිවැය

**(ලකුණු 05 යි)**

පිළිතුර

**ප්‍රශ්න අංක 07**

**(අ)** **(1)** ඒකකයක විචල්‍ය පිරිවැය = රු 640 (02)

| **පෙරවැඩ** | **(රු)** |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | 160 |
| සෘජු ශ්‍රමය | 180 |
| විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 100 |
| විචල්‍ය නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | 200 |
| ඒකකයක විචල්‍ය පිරිවැය | 640 |
| (අයිතම දෙකකට 01 බැගින් ලකුණු 02) | |

*(ලකුණු 02)*

**(2)** ඒකකයක නිෂ්පාදන පිරිවැය = රු 550 (02)

| **පෙරවැඩ** | **(රු)** | |
|---|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | 160 | 01 |
| සෘජු ශ්‍රමය | 180 | |
| විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 100 | |
| ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 110 | 01 |
| ඒකකයක නිෂ්පාදන පිරිවැය | 550 | |

*(ලකුණු 02)*

**(3)** ඒකකයක ලාභය = රු 300 (03)

| **විකල්ප 1** | | **(රු)** | |
|---|---|---|---|
| විකුණුම් මිල | | 1200 | |
| නිෂ්පාදන පිරිවැය | 01 | (550) | |
| නිෂ්පාදන නොවන විචල්‍ය පිරිවැය | | (200) | 01 |
| නිෂ්පාදන නොවන ස්ථාවර පිරිවැය | | (150) | 01 |
| ලාභය | | 300 | |

| විකල්ප 2 | (රු 000) |
|---|---|
| විකුණුම් | 1440 |
| සෘජු අමුද්‍රව්‍ය | (192) |
| සෘජු ශ්‍රමය | (216) |
| විචල්‍ය නිෂ්පාදන පොදු | (120) |
| විචල්‍ය නොවන නිෂ්පාදන පොදුකාර්යය | (240) |
| ස්ථාවර නිෂ්පාදන පොදු | (132) |
| ස්ථාවර නොවන නිෂ්පාදන පොදු | (180) |
| මුළු ලාභය | 360 |

ඒකකයක ලාභය $\frac{360\ 000}{1\ 200} = 300$

**(අයිතම දෙකකට 01 බැගින් ලකුණු 03)**

**(ලකුණු 03)**

**(4)** ක්‍රියාකාරී මට්ටම ඒකක 1500 කදී මුළු පිරිවැය = රු 1 272 000 **(03)**

**පෙරවැඩ**

ක්‍රියාකාරී මට්ටම ඒකක 1500 කදී : (රු)

ඒකකයක විචල්‍ය පිරිවැය = 640 X 1500 = **01** 960 000

ස්ථාවර පිරිවැය (132 000 + 180 000) = 312 000 **02**

මුළු පිරිවැය = 1 272 000

***(ලකුණු 03)***

**(ආ)** මහනුවර පිහිටි අධ්‍යාපන ආයතනයක් ගිණුම්කරණ ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දීමට සැලසුම් කරමින් සිටී. එය කුලියට ගත් ස්ථානයක සති අන්තවල පවත්වනු ලබයි. මෙම පාඨමාලාව විෂයන් 10 කින් සමන්විත වන අතර සෑම විෂයක්ම පැය 15 බැගින් උගන්වනු ලබයි. මෙම පාඨමාලාවෙහි කාලය මාස 6 කි. තව ද පාඨමාලාව අවසානයේදී සෑම සිසුවකු විසින්ම ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

මෙම පාඨමාලාවේ අයවැයගත ආදායම් සහ වියදම් පහත දී ඇත.

**ආදායම්:**

පාඨමාලා ගාස්තු ........ ශිෂ්‍යයකුට රු. 60 000

විභාග ගාස්තු ........ ශිෂ්‍යයකුට රු. 5 000

**වියදම්:**

කථිකාචාර්යවරුන්ට ගෙවීම්:

-දේශන ගාස්තු ........ පැයකට රු. 2 000

-පැවරුම් ලකුණු කිරීමේ ගාස්තු ........ එක් ශිෂ්‍යයකුට එක් විෂයක් සඳහා රු. 600

-ව්‍යාපෘති වාර්තා ඇගයීමේ ගාස්තු ........ එක් වාර්තාවකට රු. 10 000

අධ්‍යයන ද්‍රව්‍ය පිරිවැය ........ එක් ශිෂ්‍යයකුට එක් විෂයයක් සඳහා රු. 500

පාඨමාලා කළමනාකරුගේ වැටුප ........ මසකට රු. 45 000

ගොඩනැගිලි කුලී ........ මසකට රු. 40 000

මෙහෙයුම් වියදම් ........ මාස 6 ක කාලසීමාවකට රු. 70 000

විභාග වියදම් ........ එක් ශිෂ්‍යයකුට එක් විෂයක් සඳහා රු. 400

අවශ්‍යවන්නේ:

(1) ශිෂ්‍යයකුගේ දායකය
(2) පාඨමාලාවේ මුළු ස්ථාවර පිරිවැය
(3) පාඨමාලාවේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව
(4) රු. 200 000 ක ලාභයක් ඉපැයීමට පාඨමාලාවට බඳවා ගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව
(5) අපේක්ෂිත ලාභය සහ බඳවා ගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙළින් රු. 350 000 ක් සහ 30 ක් නම්, එක් ශිෂ්‍යයකුගෙන් අය කළ යුතු අවම පාඨමාලා ගාස්තුව

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 15 යි)

***

පිළිතුර

**(ආ) (1)** එක් ශිෂ්‍යයකුගේ දායකය = රු 40 000 (06)

**පෙරවැඩ**

දායකය = අදායම [පාඨමාලා ගාස්තු + විභාග ගාස්තු ] - විචල්‍ය පිරිවැය
= 60000 + 5000 - 25 000
[01] [01] [04]

= 40 000

★ විචල්‍ය පිරිවැය

| | | | |
|---|---|---|---|
| පැවරුම් ලකුණු කිරීමේ ගාස්තු | 600 X 10 | 6 000 | 01 |
| අධ්‍යයන ද්‍රව්‍ය පිරිවැය | 500 X 10 | 5 000 | 01 |
| ව්‍යාපෘති ඇගයීම් ගාස්තු | | 10 000 | 01 |
| විභාග වියදම් | 400 X 10 | 4 000 | 01 |
| | | 25 000 | |

(ලකුණු 06)

**(2)** පාඨමාලාවේ මුළු ස්ථාවර පිරිවැය = රු 880 000 (04)

**පෙරවැඩ**

| | | රු | |
|---|---|---|---|
| දේශන ගාස්තු (2 000 X 10 X 15) | | 300 000 | 01 |
| පාඨමාලා කළමනාකරුගේ, වැටුප | (45 000 X 6) | 270 000 | 01 |
| ගොඩනැගිලි කුලී | (40 000 X 6) | 240 000 | 01 |
| මෙහෙයුම් වියදම් | | 70 000 | 01 |
| | | 880 000 | |

(ලකුණු 04)

**(3)** පාඨමාලාවේ පිරිවැය ආවරණය කිරීම සඳහා බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව = 22 (02)

**පෙරවැඩ**

$\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{දායකය}}$ [01] $\frac{880\ 000}{40\ 000}$ [01] = 22

(ලකුණු 02)

**(4)** රු 200 000 ක ලාභයක් ඉපයීමට පාඨමාලාවට බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව = 27 (03)

**පෙරවැඩ**

$$\frac{\text{ස්ථාවර පිරිවැය + අපේක්ෂිත ලාභය}}{\text{දායකය}} = \boxed{01}\ \frac{880\,000 + 200\,000\ \boxed{01}}{\boxed{01}\ 40\,000}$$

= 27

*(ලකුණු 03)*

**(5)** අපේක්ෂිත ලාභය රු 350 000 ක් සහ බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව 30 ක් වන විට එක් ශිෂ්‍යයකු ගෙන් අය කළ යුතු අවම පාඨමාලා ගාස්තුව = රු 61 000 (05)

**පෙරවැඩ**

$$\frac{\text{ස්ථාවර පිරිවැය + ලාභය}}{\text{ආදායම - විචල්‍ය පිරිවැය}} = \text{ශිෂ්‍ය සංඛ්‍යාව}$$

$$\boxed{01}\ \frac{880\,000 + 350\,000\ \boxed{01}}{X\ (\text{ආදායම})\ \boxed{01}\ - 25\,000} = 30\ \boxed{01}$$

$$30x - 750\,000 = 880\,000 + 350\,000$$

ආදායම (x) = 66 000

පාඨමාලා ගාස්තු = මුළු ආදායම - විභාග ගාස්තු
= 66 000 - 5 000 [01]
= 61 000

*(ලකුණු 05)*

විකල්ප පෙරවැඩ (රු)

| | |
|---|---|
| ආදායම | 1 980 000 |
| විචල්‍ය පිරිවැය | (01) (750 000) |
| දායකය | 1 230 000 |
| ස්ථාවර පිරිවැය | (01) (880 000) |
| අපේක්ෂිත ලාභය | 350 000 (01) |

එක් ශිෂ්‍යයෙකුගේ ගාස්තුව $= \frac{1\,980\,000}{30\ (01)} = 66\,000$

එක් ශිෂ්‍යයෙකුගේ පාඨමාලා ගාස්තුව = 66 000 - 5 000 (01)

= 61 000

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය
15 x 2 = ලකුණු 30කි.
7 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 66%ක් පමණි.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 21%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 27%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07ක් හෝ ඊට අඩුවෙනි. මෙම ප්‍රශ්නයෙහි ලකුණු 16ට වඩා ලබාගත් ප්‍රතිශතය 45%කි.




මෙම ප්‍රශ්නයෙහි "අ" කොටසෙහි (3) හා (4) සහ "ආ" කොටසෙහි (5) යන අනුකොටස්වල පහසුතාව 45%ට වඩා අඩු වී ඇත.

හත්වන ප්‍රශ්නයේ (අ) 1 අනුකොටසේ පහසුතාව 64%කි. මේ තුළින් පරීක්ෂා කර තිබුණේ ආන්තික පිරිවැයකරණයට අදාළ ඒකකයක විචල්‍ය පිරිවැය හඳුනා ගැනීමයි. නිෂ්පාදන නොවන විචල්‍ය පොදු කාර්ය පිරිවැය එකතු නොකිරීම නිසා නිවැරදි විචල්‍ය පිරිවැය ලබාගෙන නොතිබුණි.

(අ) 2 අනුකොටසේ පහසුතාව 52%කි. එම කොටසින් ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමට අදාළ නොවන නිෂ්පාදන නොවන පිරිවැය ද ඇතුළත් කර තිබීම දුර්වලතාවක් ලෙස දක්නට ලැබුණි. මෙහි අනුකොටස් (1)ට හා (2) වැරදි පිළිතුරු ලැබීම නිසා (3) කොටසේ පිළිතුර ද නිවැරදි ව ගණනය කිරීමට නොහැකි වී තිබුණි. (4) අනුකොටස සඳහා පහසුතාව 35% වැනි අඩු මට්ටමක් පෙන්නුම් කිරීමට බලපා ඇත්තේ මුළු පිරිවැය ගණනය කිරීමට අදාළ විචල්‍ය පිරිවැය නිවැරදිව ගණනය කර නොතිබීම බව කිව හැකිය. මෙම ගැටලු මඟහරවා ගැනීමට ආන්තික පිරිවැයකරණයට අදාළ පිරිවැය වර්ග හඳුනාගත හැකි වන ආකාරයටත්, ලාභය ගණනය කළ හැකි විවිධ ක්‍රම හඳුන්වා දීමටත් අදාළ වනසේ විවිධ අභ්‍යාස සිසුන්ට ලබා දෙමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගැනීම වැදගත් බව කිව හැකිය.

7 (ආ) කොටසේ අනුකොටස් 5ක් ඇතුළත් වූ අතර වැඩිම පහසුතාව 66%ක් ද අඩුම පහසුතාව 31%ක් ද විය. මෙම කොටස මගින් පරීක්ෂා කර ඇත්තේ පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය සමීකරණ ප්‍රවේශයෙන් විසඳීමට අදාළ හැකියාව හඳුනාගැනීම පිළිබඳවයි.

(ආ) (1) කොටසේ පහසුතාව 57%කි. මෙම කොටස තුළින් ආයකය ගණනය කිරීමේ හැකියාව මැන බලා ඇත. ආයකය ගණනය කිරීමට අදාළ විචල්‍ය පිරිවැය නිවැරදි ව හඳුනා ගැනීමට නොහැකි වීම දුර්වලතාවයක් ලෙස සැලකිය හැකිය. එනම් අදාළ ගාස්තු විෂයයන් ගණනින් ගුණ කර නොතිබීමයි.

(ආ) (2) කොටස සඳහා පහසුතාව 59%කි. මෙම කොටසට පිළිතුරු සැපයීමේ දී දේශන ගාස්තු විෂයන් ගණනින් වැඩි කර නොතිබීම නිසා නිවැරදි ස්ථාවර පිරිවැය ලබාගෙන නොමැති බව කිව හැකිය.

(ආ) (5) අනුකොටස සඳහා ලබා ඇති පහසුතාව 31%කි. මෙම කොටස තුළින් අඩු පහසුතාවක් ලැබී තිබුණේ පිළිතුර ගණනය කිරීමට අදාළ ආදායම නිවැරදි ව ගණනය කිරීමේ ක්‍රම පිළිබඳ ව වූ අඩු දැනුම විය හැකිය. විවිධ ක්‍රම යොදාගත හැකි වුවද පිළිතුර නිවැරදි ව ලබාගෙන නොතිබීම දුර්වලතාවයකි.

ප්‍රායෝගිකත්වය තුළින් න්‍යායික දැනුම ලබාගැනීමට හැකිවන ආකාරයෙන් ලාභ පරිමා විශ්ලේෂණ සංකල්පවලට අදාළ පිළිතුරු ලබාගැනීමේ ක්‍රම ඇතුළත් විවිධ අභ්‍යාස සකස් කර සිසුන්ට ලබාදීම අත්‍යාවශ්‍ය වන බව කිව හැකිය.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




II වන පත්‍රයේ ප්‍රශ්න අංක 3, 6 සහ 7 හි පමණක් පහසුතාව 50% හෝ ඊට වැඩි වී ඇත.

මුළු ප්‍රශ්න අතුරින් වැඩිම පහසුතාව දක්වා ඇත්තේ 3 ප්‍රශ්නයට වන අතර එය 62%කි. 42%ක අඩුම පහසුතාවක් දක්වා ඇත්තේ 1 හා 4 ප්‍රශ්නවලට වේ.

පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර මෙම ප්‍රශ්න දෙකෙහිම පහසුතාවන් 42% හා 47% වැනි සැලකිය යුතු අඩු මට්ටමක පවතී. මෙයින් පළමුවන ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 42%ක් වුවත් අපේක්ෂකයින්ගෙන් බහුතරයක් 67%ක් ලබාගෙන ඇත්තේ වෙන්කර ඇති ලකුණු ප්‍රමාණයෙන් 50%කට වඩා අඩුවෙනි.

තුන්වන ප්‍රශ්නයේ සිට 7වන ප්‍රශ්නය තෙක් ලබාදී ඇත්තේ තෝරා ගත හැකි ප්‍රශ්න වේ. මෙයින් වැඩිම අපේක්ෂකයින් පිරිසක් තෝරා ගෙන ඇත්තේ 3 ප්‍රශ්නය වන අතර එහි ප්‍රතිශතය 94%කි. අඩුම අපේක්ෂකයින් පිරිසක් තෝරා ගෙන ඇත්තේ 4 ප්‍රශ්නයයි. එහි තෝරා ගැනීමේ ප්‍රතිශතය 59%කි.

වැඩිම තෝරා ගැනීමක් තිබූ 3 ප්‍රශ්නයෙහි පහසුතාව 62%ක් වැනි සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුණි. මෙයට ලකුණු ලබාගැනීමේ දී වෙන් කර ඇති ලකුණුවලින් 50%ට වඩා වැඩියෙන් බහුතර අපේක්ෂකයින් ලකුණු ලබාගෙන ඇත.

ඒ අනුව පෙනී යන්නේ අපේක්ෂකයින්ගෙන් බහුතරයක්, තෝරාගත් ප්‍රශ්න කිහිපයක් සම්බන්ධයෙන් පමණක් වැඩි නිපුණතාවයක් දක්වන බවයි. උදාහරණ වශයෙන් 3 ප්‍රශ්නයේ තෝරා ගැනීමේ ප්‍රතිශතය මෙන්ම පහසුතාව ද සැලකිය යුතු ඉහළ මට්ටමක පැවතීම දැක්විය හැකිය. මෙම තත්ත්වය මගහරවා සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට මනා සූදානමක් ඇතිවීම කෙරෙහි සිසුන් පෙළඹවීම වැදගත් වනු ඇත.

## III කොටස

**3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

**3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

**පොදු උපදෙස් :**

* ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් කුමන ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතුද? කුමන ප්‍රශ්න අනිවාර්ය වේද, ඒ සඳහා වෙන් කොට ඇති කාලයන් කොපමණ ද? වෙන් කොට ඇති ලකුණු ප්‍රමාණයන් කොපමණද යනාදියයි.
* ප්‍රශ්න හොඳින් කියවා අවබෝධ කරගෙන තෝරා ගත යුතු අතර, ප්‍රශ්න තෝරා ගැනීමේ දී හා පිළිතුරු ලිවීමේ දී එය ප්‍රයෝජනයට ගත යුතුය.
* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් ලිවිය යුතුය.
* අයදුම්කරුගේ විභාග අංකය අදාළ සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
* I පත්‍රයේ 1-30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් ආසන්න පිළිතුරු අතුරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ගත යුතුය.
* I පත්‍රයේ 31-50 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී දීර්ඝ විස්තර ඇතුළත් කිරීම නොකළ යුතුය.
* II වන පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අළුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
* උත්තර පත්‍රයට පිටු අමුණන්නේ නම් නිවැරදිව අංක කර නොගැලවෙන පරිදි ඇමිණිය යුතුය.
* ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදි ව ලිවිය යුතුය.
* ප්‍රශ්නයෙහි අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
* එක් එක් අනු කොටස් හොඳින් කියවා බලා එක් එක් අනු කොටසට අදාළ ඉලක්කගත පිළිතුර පමණක් ලිවිය යුතුය.
* පිළිතුරු සැපයීමේ දී කාලය නිසි පරිදි කළමනාකරණය කරගත යුතුය. මෙහිදී ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය සමග කාලය කළමනාකරණය කරගත හැකිය.
* පිළිතුරු ලිවීමේ දී රතු, දම් සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

**විශේෂ උපදෙස් :**

1. ප්‍රශ්නවලට අදාළ පිළිතුර පියවරෙන් පියවර ඉදිරිපත් කළ යුතුය.
2. සංඛ්‍යා රුපියල් දහස්වලින් ඉදිරිපත් කරන්නේ නම් එය සඳහන් කළ යුතුය. (එනම් රු'000 ලෙස)
3. එක් එක් ප්‍රශ්නයට අදාළ පෙර වැඩ ඒ ඒ පිළිතුර සමග ඉදිරිපත් කළ යුතුය.
4. ප්‍රශ්නයක අනුකොටස් ඇති විටෙක එම අනුකොටස් සියල්ල එක ලග තිබෙන ලෙස පිළිතුරු ඉදිරිපත් කළයුතු අතර උත්තර පත්‍රයෙහි තැනින් තැන විසුරුවා ලිවීම නොකළ යුතුය.
5. ඉලක්කම් සහ ධන ඍණ ලකුණු ද, සත්‍ය අසත්‍ය බවද අදාළ වේ, අදාළ නොවේ ආදිය ද පැහැදිලි ව ලිවිය යුතුය.
6. තමා ලද අගය භාවිත කරමින් සම්පූර්ණ පිළිතුර සැපයිය යුතුය. එනම් ලද එක් පිළිතුරක් වැරදි යැයි උපකල්පනය කොට ඉතිරි කොටස්වලට පිළිතුරු නොලියා සිටීමෙන් වැළකිය යුතුය.
7. සමාගම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ සටහන් හා පෙරවැඩ අතර වෙනස වටහා ගෙන පිළිතුරු සැපයීමට වගබලා ගත යුතුය.
8. ආදායම් හා වියදම් උපචිත පදනමට ගලපා ගැනීමට අපොහොසත් වීම බොහෝ පිළිතුරුවල පොදුවේ දක්නට ලැබෙන දුර්වලතාවයක් බැවින් ඒ පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කළ යුතුය.
9. මූලික ගණිත සංකල්ප පිළිබඳ අවබෝධය මදවීම ද නිවැරදි පිළිතුරු ලබාගැනීමට බාධාවක් බැවින් එය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

## 3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* විෂය නිර්දේශය, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත, 2007 අංක 07 දරන සමාගම් පනත, උසස් පෙළට නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිත සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පළකර ඇති උ.පෙළ ගිණුම්කරණය සම්බන්ධ පොත් යනාදිය සියළුම සිසුන් මෙන්ම ගුරුභවතුන් ද පරිශීලනය කළයුතු අතර ඒ පිළිබඳ ව දැනුවත් වීම හා භාවිතය ද අත්‍යාවශ්‍යය.
* ගිණුම්කරණ ප්‍රශ්න පත්‍රයට සාර්ථකව පිළිතුරු ලිවීමට නම් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රායෝගික ගැටළු මුල් කරගෙන සකස් කළ අභ්‍යාස ශිෂ්‍යයා ලවා කරවීම අවශ්‍යය.
* මුද්‍රණය කරන ලද අභ්‍යාස ලබාදීමට හැකියාවක් ඇත්නම් වැඩි අභ්‍යාස ප්‍රමාණයක් විසඳීමට සිසුන්ට අවස්ථාව ලැබෙනු ඇත.
* සාක්ෂරතාවයේ අඩුපාඩු හේතුවෙන් ප්‍රශ්න අවබෝධ කරගැනීමේ සහ ප්‍රකාශනය කිරීමේ ගැටළු අවම කර ගැනීම සඳහා සුදුසු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය.
* ව්‍යාපාර ලෝකයේ ප්‍රායෝගිකව භාවිත කරන මූලාශ්‍ර ලියවිලි හා ගිණුම් වාර්තා පන්ති කාමර ආධාරක ලෙස භාවිත කරමින් විෂයය සංවර්ධනයට අවශ්‍ය අත්දැකීම් තහවුරු කර ගැනීමට මග පෙන්වීම අවශ්‍යය.

  නිදසුන් - මූලාශ්‍ර ලියවිලි
  - බැංකු ප්‍රකාශන
  - වැටුප් ලේඛන
  - තොග වාර්තා
  - සමාගම් වාර්ෂික වාර්තා
* මෙම විෂය ඉගෙන ගන්නාට මෙන්ම සමාජයටද එකසේ වැදගත් වන බැවින් අවබෝධයෙන් යුතුව, තර්කානුකූලව, මනසට රසවත් වන ආකාරයට ඉගෙන ගත යුතු අතර එක් එක් ඒකකය ඉගෙන ගත යුත්තේ මන්ද යන්න දරුවාගේ මනසට අවධාරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.
* මෙම විෂය තීරණ ගැනීම සඳහා වැදගත් වන සමාජයීය විෂයයක් බැවින් ඉගෙනුම් උපකරණ හා මෙවලම් භාවිතය මගින් ප්‍රබෝධක ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීමට හා කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව ලබාදිය යුතුය.
* විෂය නිර්දේශයේ අවසාන විෂයය කොටස් පදනම් කරගෙන ඇතුළත් කර ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ ප්‍රවණතාවයේ අඩුවීමක් මෙන් ම එම කොටස් සඳහා ලකුණු ලබා ගැනීමේ ප්‍රවණතාවේ අඩුවීමක් ද නිරීක්ෂණය වේ. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී එම විෂය කොටස් ආවරණය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වනු ඇත.
* නව විෂය දැනුම සංවර්ධනය කර ගැනීම හා යාවත්කාලීන වීමට විශේෂයෙන් ගුරු භවතුන් සැලකිලිමත් විය යුතු අතර, ශිෂ්‍යයින්ට ද එම කරුණ වැදගත් වේ. මෙමගින් කුසලතා පූර්ණ නිර්මාණශීලී පුද්ගලයන් බිහිවන අතර ඔවුන් මතු පරපුරට මහඟු දායාදයකි.